	කෘෂිකර්ම පීඨය	ව්‍යවහාරික විද්‍යා පීඨය	කළමනාකරණ අධ්‍යයන පීඨය	වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය	සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය	තාක්ෂණ පීඨය
එක් සිසුවෙකු සඳහා පුනරාවර්තන වියදම	558,448	294,756	199,939	444,310	193,973	159,514
එක් සිසුවෙකු සඳහා ප්‍රාග්ධන වියදම						
එකතුව	558,448	294,756	199,939	444,310	193,973	159,514

එක් සිසුවෙක් සඳහා පුනරාවර්තන වියදම් = $\frac{\text{පීඨයේ පුනරාවර්තන වියදම්}}{\text{පීඨයේ සිසුන් සංඛ්‍යාව}}$

එක් සිසුවෙක් සඳහා ප්‍රාග්ධන වියදම් = $\frac{\text{පීඨයේ ප්‍රාග්ධන වියදම්}}{\text{පීඨයේ සිසුන් සංඛ්‍යාව}}$

පීඨයක් සඳහා ප්‍රාග්ධන වියදම් = පීඨයේ ප්‍රාග්ධන වියදම් + සාමාන්‍ය ප්‍රාග්ධන වියදම් x $\frac{\text{පීඨයේ ශිෂ්‍ය සංඛ්‍යාව}}{\text{විශ්වවිද්‍යාලයේ සිසුන් සංඛ්‍යාව}}$

16. යටිතල පහසුකම් පිළිබඳ විස්තර

යටිතල පහසුකම් පිළිබඳ විස්තර	වියදම රුපියල් මිලියන
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථාන ගොඩනැගිල්ල	47,855,434
තාක්ෂණ පීඨ ගොඩනැගිල්ල (අදියර II සහ අදියර III)	33,446,913
වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය සඳහා සාලිය පුර ඉදි වූ පුර්ව සායන ගොඩනැගිලලේ සැලසුම් කිරීම ඉදිකිරීම සහ වැඩ කටයුතු නිම කිරීම.	243,973,989
කළමනාකරණ අධ්‍යයන පීඨයේ පරිගණක විද්‍යාගාරය ප්‍රතිසංස්කරණය කිරීම.	1,413,484
උද්‍යාන පාලන අංශයේ නාන කාමරයක් ඉදිකිරීම, රැඹෑව නිල නිවාස සඳහා පූතික ටැංකිය හා පොඟවන වළ සැකසීම, එළිමහන් රංග පීඨයේ නවීකරණ කටයුතු සිදුකිරීම.	3,594,109
කෘෂිකර්ම පීඨයේ ධාතුසේන පිරිමි නේවාසිකාගාරයේ නාන කාමර ජලය කාන්දු නොවන සේ සකස් කිරීම.	2,942,990
කෘෂිකර්ම පීඨයේ විද්‍යාගාර සංකීර්ණ සහ දේශන ශාලා	736,927
මිහින්තලේ නේවාසිකාගාර පරිශ්‍රය සඳහා මළාපවහන පවිත්‍රාගාරය	51,336,041
කළමනාකරණ පීඨ ගොඩනැගිල්ල	1,579,326
ව්‍යවහාරික විද්‍යා පීඨයේ දෙවන මහලේ ඇති ශ්‍රවණාගාර වැඩිදියුනු කිරීම්	1,248,326
ලේඛකාධිකාරි, මුල්‍යාධිකාරි සහ කාර්ය මණ්ඩලය නිල නිවාස සංකීර්ණය	34,432,844
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයින්ගේ ප්‍රධාන ආපන ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම.	1,463,585
ප්‍රජා වෛද්‍ය අධ්‍යනාංශය විස්තාරණය කිරීම.	507,232
නේවාසිකාගාර තුනක් සඳහා ෆයිබර් අන්තර් ජාල සැපයුම ස්ථාපනය කිරීම	1,259,177

පීඨ, පුස්තකාල ජාලය, අධ්‍යයන සහයක අංශ, මධ්‍යස්ථාන හා ඒකකයන් හි වාර්තාවන්

17. කෘෂිකර්ම පීඨය

අ. හැඳින්වීම

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨය වර්ෂ 2001 දී උපාධි අපේක්ෂකයින් 17 දෙනෙකුගෙන් ආරම්භ කරන ලදි. මෙහි ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ වියළි කළාපයට යෝග්‍ය වූ කෘෂි කාර්මික ක්‍රම පිළිබඳ අවධානය යොමු කරමින් කෘෂිකර්ම ක්ෂේත්‍රයේ විද්‍යා (උපාධි) වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. විවිධ කෘෂි විද්‍යා ක්‍රම පදනම් කර ගනිමින් මෙම උපාධි පාඨමාලා වර්ෂාර්ධයන් 08 කින් සමන්විතව පවති. අද වන විට කෘෂිකර්ම පීඨය, කෘෂි ඉංජිනේරු සහ පාංශු විද්‍යා, කෘෂිකර්ම පද්ධති, සත්ව ආහාර විද්‍යාව සහ ශාක විද්‍යාව යන අධ්‍යනාංශ 04කින් ද පරිගණක ඒකකය, ඉංග්‍රීසි භාෂා පුහුණු අංශය, පීඨ ගොවිපළ හා පුස්තකාලයකින් සමන්විත වේ. පාංශු විද්‍යා, ශාක විද්‍යා, ජීව රසායන විද්‍යා සහ භූගෝලීය තොරතුරු පද්ධති විද්‍යාගාරය එක්ව පැවැත්වෙන කෘෂි ඉංජිනේරු වැඩ මුළු මඟින් උපාධි අපේක්ෂකයන්ගේ විශ්ලේෂණ හා අනෙකුත් කුසලතා සංවර්ධනය සඳහා අවස්ථාවන් සලසනු ලැබේ.

වසරකට කෘෂිකර්ම පීඨයට සිසුන් 175 පමණ ඇතුළත් කර ගන්නා අතර එම සියළුම සිසුන් හට නේවාසිකාගාර පහසුකම් විශ්වවිද්‍යාලය මඟින් සපයා දෙනු ලැබේ. වර්තමානයේදී කෘෂිකර්ම පීඨය 90කට අධික අධ්‍යයන සහ අනධ්‍යයන කාර්යය මණ්ඩලයකින් යුක්ත වේ. කෘෂිකර්ම පීඨයේ ක්‍රියාත්මක වන උපාධි පාඨමාලා මූලික වැඩ සටහනකින් සහ විශේෂිකරණ අංශවලින් සමන්විත වන අතර මූලික වැඩසටහන සියළුම සිසුන් සඳහා අනිවාර්ය වන අතර එය පළවෙනි වර්ෂාර්ධ පහ තුල විසිර පවතී. හය වන සහ හත් වන වර්ෂාර්ධයන්වල සිසුනට ඔවුන්ගේ රුචිකත්වය පරිදි විශේෂිකරණ අංශය තෝරාගැනීමට අවස්ථාව හිමිවේ. අවසන් වර්ෂාර්ධයේදී සිසුන් විසින් ඒකල පරික්ෂණ ව්‍යාපෘතියක් තෝරා ගත යුතු අතර අවසානයේදී විස්තරාත්මක පර්යේක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කල යුතුය

පීඨය විසින් පිරිනමන ප්‍රධාන මොඩියුල

- කෘෂිකාර්මික ජීව විද්‍යාව
- කෘෂිකාර්මික ආර්ථික සහ විස්තාරණය
- කෘෂිකාර්මික පද්ධති සහ කළමනාකරණය
- සත්ත්ව නිෂ්පාදන සහ තාක්ෂණය
- බෝග විද්‍යාව
- කෘෂිකාර්මික ඉංජිනේරු
- පාරිසරික පාංශු කළමනාකරණය
- ආහාර සහ පසු අසුවනු තාක්ෂණය

මූලික උපාධි අපේක්ෂක වැඩසටහනට අමතරව, පීඨය විසින් 2020 සිට කෘෂිකර්මපති පශ්චාත් උපාධි වැඩසටහන පිරිනමනු ලබන අතර අලුතින් හඳුන්වා දුන් කෘෂිකර්මාන්තය පිළිබඳ කෘෂිකර්ම ශාස්ත්‍රපති පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමා වැඩසටහන සඳහා අයදුම්පත් කැඳවා තිබේ. ශ්‍රී ලංකාවේ පශ්චාත් උපාධි අධ්‍යයන අවස්ථා වැඩි කිරීම සඳහා 2023 දී කෘෂිකර්මය පිළිබඳ ආචාර්ය උපාධියක් හඳුන්වා දීමට පීඨය අපේක්ෂා කරයි. තවද, පීඨය විසින්, කෘෂි පාරිසරික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, කෘෂි තාක්ෂණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, පසු අස්වනු හා ආහාර තාක්ෂණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, ශාක විද්‍යාව පළිබඳ ශාස්ත්‍රපති උපාධිය ආදී පශ්චාත් උපාධි වැඩසටහන් කිහිපයක් හඳුන්වා දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

කෘෂිවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති පශ්චාත් උපාධි වැඩසටයන් කිහිපයක් හඳුන්වා දීමට අපේක්ෂා කෙරේ. කෘෂිතාක්ෂණ සහ පාරිසරික කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති, තාක්ෂණය පිළිබඳ ශාස්ත්‍රපති, නල මාර්ගයේ ඇති ශාක විධ්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති. විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති, පශ්චාත් අස්වනු හා ආහාර තාක්ෂණය පිළිබඳ විද්‍යාව යන වැඩසටහන් හඳුන්වාදෙන ලදි.

ආ. ජයග්‍රහණයන්

- වර්ෂ 2021 අප්‍රේල් මස 21වන දින විසි අවුරුදු අභිමානවත් විශිෂ්ඨත්වය සමරන ලදි.
- කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද රු. මිලියන 759ක වියදමින් ඉදි කිරීමට නියමිත රසායනාගාර සහ දේශන ශාලා සංකීර්ණය සඳහා ලංසු තැබීමේ ක්‍රියාවලිය අවසන් කිරීම.
- 13 වැනි වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය සාර්ථකව පවත්වන ලද අතර ක්‍රියාදාමයන් ප්‍රකාශයට පත් කරන ලදි.
- යෝජිත දර්ශනපති උපාධි වැඩසටහන සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිශන් සභාවේ අනුමැතිය ලබා ගැනීම.
- කෘෂිකර්මපති පශ්චාත් උපාධි වැඩසටහන සඳහා දෙවන සිසු කණ්ඩායම බඳවා ගැනීම.

- ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය කෘෂිකර්ම පීඨ පරිශ්‍රයේ බීජෞෂණ මධ්‍යස්ථානය (ටී.අයි.සී.) සංරක්ශක උත්සවය පැවැත්වීම.
- ''කෘෂිකර්මය හා පරිසර පද්ධති පිළිබඳ ශ්‍රී ලාංකික ජර්නලය'' වන පීඨ විද්‍යුත් ජර්නලයේ දෙවන වෙළුම ප්‍රකාශයට පත් කිරීම.
- ''කෘෂිකර්ම හා පරිසර පද්ධති පිළිබඳ ශ්‍රී ලාංකික ජර්නලය'' වන පීඨ විද්‍යුත් ජර්නලයට ජාතික විද්‍යා පදනමේ ශ්‍රී ලංකා මාර්ගගත ජර්නල සඳහා වන පිළිගැනීම හිමි කර ගැනීම.
- දේශන ශාලාවල පහසුකම් වැඩි දියුණු කිරීම.
- උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘතියේ පීඨය සඳහා වූ ප්‍රධානයන් මඟින් දේශන ශාලා පුටු 600ක් මිලදී ගැනීම.
- කාර්මික පුහුණුව සඳහා බාහිර ආයතන සමඟ සහයෝගීතාවයෙන් මත අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම.
- උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘතියේ පීඨය සඳහා වූ ප්‍රදානයන් මඟින් අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීම පිළිබඳ වැඩමුළු කිහිපයක් පැවැත්වීම.
- 2019/2020 කණ්ඩායම සඳහා ''ඇන්ඩ්‍රොමීඩා'' ඉංග්‍රීසි රාත්‍රිය පළමු වරට අතථ්‍ය ලෙස පවත්වන ලදි.
- කෘෂි ව්‍යවසායක අත්දැකීම් බෙදාගැනීමේ සංසදය ලෙස ගොවීන් සහ උපාධි අපේක්ෂකයින් විසින් අන්තර් ක්‍රියාකාරී සැසියක් සාර්ථකව පවත්වන ලදි.
- ලෝක බැංකුව මඟින් අරමුදල් සපයන උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය පාදක කරගත් පර්යේක්ෂණයක් මඟින් ''රජරට විශ්වවිද්‍යාලයීය පාලිත පරිසර පහසුකම'' නමින් නව ක්ෂේත්‍ර රසායනාගාරයක් පිහිටු වීම.

ඇ. අසමර්ථයන් හා නිර්දෝෂිභාවය

- අරමුදල් නොමැතිකම නිසා ගොවිපළ මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම ආරම්භ කිරීමට නොහැකි වීම.
- කොවිඩ් 19 වසංගත තත්වය සහ රටේ මුල්‍ය අර්බුදය හේතුවෙන් රසායනාගාර සහ දේශන ශාලා සංකීර්ණය ඉදිකිරීමේ කටයුතු ප්‍රමාද විය.
- අරමුදල් නොමැතිකම නිසා කිරි නිෂ්පාදන සහ මස් සැකසුම් ඒකකය සඳහා අවශ්‍ය උපකරණ සවි කිරීමට නොහැකි විය.

ඈ. අනාගත දැක්ම

- කෘෂිකර්මය පිළිබඳ පශ්චාත් උපාධි පර්යේෂණ උපාධි (ආචාර්ය සහ විද්‍යාවේදී ශාස්ත්‍රපති) වැඩසටහන් ආරම්භ කිරීම.
- පීඨ ගොවිපළේ පශු සම්පත් ඒකකය පුළුල් කිරීම.
- දේශීය හා ජාත්‍යන්තර ආයතන සමඟ පර්යේෂණ ව්‍යාපෘතිවල සහයෝගිතාවයක් ඇති කිරීම.
- රසායනාගාර සහ දේශන ශාලා සංකීර්ණයක් ස්ථාපනය කිරීම.
- අවශ්‍ය සියලු පහසුකම් සහිත කිරි නිෂ්පාදන හා මස් සැකසුම් ඒකකයක් පිහිටුවීම.
- පීඨයේ 14 වැනි වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය සංවිධානය කිරීම.
- ගොවිපල පරිශ්‍රයේ අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම.
- පීඨ ගොවිපල වටා සහ නව ඉඩම වටා වැටවල් ඉදි කිරීම (කැබලි අංක 03)
- පීඨයේ සෞන්දර්යාත්මක පෙනුම වැඩිදියුණු කිරීම.
- කෘෂිකර්ම පීඨ නේවාසිකාගාරය සඳහා ආපන ශාලාවක් ඉදිකිරීම.
- පීඨ ප්‍රවේශය සහ මායිම් බැමි වැඩි දියුණු කිරීම. (කැබලි අංක 1,2 සහ 3)
- කෘෂිකර්ම පීඨය සඳහා පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම.
- අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩි දියුණු කිරීම. (කැබලි අංක 2 සහ 3)
- විකුණුම් මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම.
- අධ්‍යනාංශ ගොඩනැගිලි සංකීර්ණය සහ ශ්‍රවණාගාරය ජාලගත කිරීම. (අන්තර්ජාල පහසුකම් සහ අභ්‍යන්තර සන්නිවේදන පද්ධතිය)
- කෘෂිකර්ම පීඨය සඳහා පීඨාධිපති, අධ්‍යන, සහකාර ලේඛකාධිකාරි, සහකාර මුල්‍යාධිකාරි, ගොවිපල කළමනාකරු සහ අනධ්‍යන යන කාර්ය මණ්ඩල නිල නිවාස ඉදිකිරීම.
- අකුණු ආරක්ෂණ සහ ගිනි ආරක්ෂණ පද්ධතිය ස්ථාපනය කිරීම.
- සුර්ය පැනල ස්ථාපනය කිරීම.

18. ව්‍යවහාරික විද්‍යා පීඨය

අ. හැඳින්වීම

වර්ෂ 1995 නොවැම්බර් මස 07වන දින ප්‍රකාශයට පත්කරන ලද අංක 896/2 ගැසට් නිවේදනයට අනුව ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය වර්ෂ 1995 නොමැම්බර් මසදී අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කය තුල ස්ථාපිත කරන ලදි. පොල්ගොල්ලේ පිහිටි මධ්‍යම පළාත් අනුබද්ධ විශ්වවිද්‍යාලය හා ඒකාබද්ධ කරමින් ව්‍යවහාරික විද්‍යා පීඨය වර්ෂ 1997 ජනවාරි මස 10වන දින ආරම්භ කරන ලදි. මෙහිදී ක්ෂනික කාර්යක් ලෙස ඩිප්ලෝමා අවශ්‍යතාවය සම්පුර්ණ කොට ඇති සිසුන් 102ක් සඳහා තුන් අවුරුදු උපාධියක් දක්වා අධ්‍යයන කටයුතු තහවුරු කරගෙන යාමට අවස්ථා සලසා දුන් අතර ඔවුන් සියළු දෙනාම වර්ෂ 1998දී උපාධිය සම්පුර්ණ කරන ලදි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් එවන ලද පළමු සිසු කණ්ඩායම බඳවා ගැනීම වර්ෂ 1997 නොවැම්බර් මසදී සිදු විය.

ව්‍යවහාරික විද්‍යා පීඨයේ ගොඩනැගිලි සංකීර්ණයේ පළමු අදියර ඉදිකිරීම් සම්පූර්ණ වූ පසු, වසර 10 ක කාලයක් පොල්ගොල්ල පරිශ්‍රයේ ක්‍රියාත්මක වූ පීඨය 2006 ජනවාරි 16 වන දින මිහින්තලේ පරිශ්‍රයේ ස්ථාපනය කරන ලදි. 2011 වසරේදී පීඨ ගොඩනැගිල්ලේ දෙවන අදියර ඉදිකිරීම් අවසන් වූ අතර පරිපාලන ඒකකය මෙම ගොඩනැගිල්ල තුල ස්ථාපනය කෙරිණි.. 2013 වසරේ දැයට කිරුළ ව්‍යාපෘතිය යටතේ ලද ප්‍රතිපාදන මත නව පටක විද්‍යා හා ජලජ ක්ෂේත්‍ර විද්‍යාගාර 02 ක් සංවර්ධනය කරන ලද අතර නව භෞතික විද්‍යා විද්‍යාගාරය හා දේශන ශාලා 2017 වසරේදී ඉදි කරන ලදී. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ අවශ්‍යතා උදෙසා තවත් දෙමහල් ගොඩනැගිල්ලක් 2018 වසරේ දී ඉදි කළ අතර එම වසරේදී සෞඛ්‍ය ප්‍රවර්ධන හා පරිගණක යන නව උපාධි පාඨමාලා ආරම්භ කිරීම ද සිදුවිය.

නව රසායන විද්‍යා උපාධි පාඨමාලාව 2020 වසරේ දී ආරම්භ කරන ලදී. පීඨය ආරම්භයේ සිට භෞතික විද්‍යා අධ්‍යයනාංශය මගින් රසායනික විද්‍යාව, භෞතික විද්‍යාව ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය හා සංඛ්‍යා ලේඛන යන විෂයන් යටතේ උපාධි ප්‍රදානය කෙරේ.

එක් එක් අධ්‍යනාංශය මඟින් පහත සඳහන් උපාධි ප්‍රදානය කරනු ලබයි.

- ව්‍යවහාරික විද්‍යා විද්‍යාවේදී උපාධිය
- ව්‍යවහාරික විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධිය
- කර්මාන්ත ගණිතවේදී ගෞරම විද්‍යා උපාධිය
- භෞතික විද්‍යා හා රසායන විද්‍යා (ඒකාබද්ධ ප්‍රධාන) විද්‍යාවේදී උපාධිය
- රසායන විද්‍යාවේදී විද්‍යා ගෞරව උපාධිය

විවිධ විෂයන් ඒකාබද්ධ කරමින් පහත උපාධි පාඨමාලා ප්‍රදානය කිරීම කෙරෙහි ජීවවිද්‍යා අධ්‍යයනාංශය අවධානය යොමු කරමින් සිටී.

- ව්‍යවහාරික විද්‍යා විද්‍යාවේදී උපාධිය.
- ව්‍යවහාරික ජීව විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධිය. (ජෛව විවිධත්ව සංරක්ෂණය පිළිබඳ විශේෂීකරණය)
- ව්‍යවහාරික ජීව විදයා විද්‍යාවේදී ගෞරව උපාධිය (ධීවර හා ජලජීවී වගා කළමණාකරණය පිළිබඳ විශේෂිකරණ)
- ක්ෂුද්‍ර ජීව විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධිය (2021 සිට අනුමැතිය ලැබී ඇත)
- ජීව විද්‍යා හා භෞතික විද්‍යා විදයාවේදී (ඒකාබද්ධ ප්‍රධාන) උපාධිය

අධ්‍යන ක්ෂේත්‍රයේ හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ වර්තමාන නැඹුරුතාවයන්ට හා අවශ්‍යතාවයන්ට අනුකූල වනසේ තොරතුරු තාක්ෂණ විදයාවේදී විශේෂ උපාධිය හා තොරතුරු තාක්ෂණ විද්‍යාවේ දී උපාධිය පරිගණක අධ්‍යනාංශය විසින් පිරිනමනු ලබයි. පීඨයේ අනෙකුත් අධ්‍යයනාංශ මඟින් පිරිනමන උපාධි පාඨමාලාවන්ගේ විෂය මාලා වලට අයත් පරිගණක විද්‍යා විෂය ඉගැන්වීමේ සේවාව ද පරිගණක අධ්‍යයනාංශය මඟින් ඉටුකරයි. එමෙන්ම අධ්‍යයන කටයුතු වලට අමතරව ව්‍යවහාරික විද්‍යා පීඨයේ තොරතුරු තාක්ෂණ හා පරිගණක ආශ්‍රිත ක්‍රියාකාරකම් වලට අදාළ තාක්ෂණික සහයෝගය ලබා දීමද පරිගණක අධ්‍යනාංශය මඟින් සිදු කෙරෙනු ලැබේ.

සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යනාංශය මඟින් සෞඛ්‍ය ප්‍රවර්ධන විද්‍යාවේදී උපාධිය හා සෞඛ්‍ය ප්‍රවර්ධන විද්‍යාවේදී (විශේෂ) උපාධිය පිරිනමනු ලබන අතර පුළුල් පරාසයක විහිදුනු සෞඛ්‍ය ප්‍රවර්ධන මැදිහත් වීම් හරහා ජනතාවගේ ප්‍රශස්ත යහපැවැත්ම සහතික කිරීමට සමත් දක්ෂ උපාධි ධාරීන් හරහා රට තුල සෞඛ්‍ය ප්‍රවර්ධන හැකියාවන් වර්ධනය කිරීම සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යනාංශයේ අභිප්‍රායවේ.

රසායන විද්‍යා අධ්‍යනාංශය මඟින් රසායන විද්‍යා විද්‍යාවේදී විශේෂ උපාධිය පිරිනමනු ලැබේ.

ආ. ජයග්‍රහණ

කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ වුවද මාර්ගගත ක්‍රමවේද ඔස්සේ දේශන, විභාග සහ ප්‍රායෝගික සැසි පැවැත්වීම වැනි විකල්ප ක්‍රමවේද ඔස්සේ සීමා සහිතව අධ්‍යන සැසි සම්පූර්ණ කිරීමට පීඨය සමත්ව තිබේ.

පහත සඳහන් පුහුණු වැඩසටහන් සාර්ථකව පවත්වන ලදී.

- මත්ස්‍ය හා ජලජීවී පුහුණු වැඩ සටහන (මන්නාරම)
- වන සංරක්ෂණ පිළිබඳ පුහුණු වැඩ සටහන (හෝර්ටන්තැන්න හා රිවස්ටන්)

කෙසේ වුවද, ඉගැන්වීම්, අඛණ්ඩ ඇගයීම් හා වර්ෂාර්ධ අවසාන විභාග මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පවත්වන ලදී.

විෂයමාලා

- ක්ෂුද්‍රජීව විද්‍යා පිළිබඳව විද්‍යාවේ දී (ගෞරව) උපාධි පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ අනුමැතිය 2021 වසරේ දී ලබා ගැනීම.
- කාර්මික ගණිතය විද්‍යාවේදී ගෞරව උපාධිය 2+2 පාඨමාලාවක් ලෙස පැවැත්වීම සඳහා සනාතන සභා අනුමැතිය හිමිවීම.
- අපගේ විෂය මාලාව තුල සංඛ්‍යානය විෂය නවක විෂයක් ලෙස නව පාඨමාලා කේතයකින් හඳුන්වා දීම.
- සංඛ්‍යානය හා ගණිතය විෂයමාලා සංශෝධනයන්ට අදාළ ලේඛන සනාතන සභාවට ලබාදී ඇති අතර එහි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ අනුමැතිය සඳහා යැවීමට සනාතන සභාවේ අනුමැතිය අපේක්ෂාවෙන් සිටී.

පශ්චාත් උපාධි ඒකකයක් ස්ථාපිත කිරීම.

ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, සෞඛ්‍ය ප්‍රවර්ධන හා සෞඛ්‍ය විද්‍යාව, ගණිතය හා පරිගණක විද්‍යාව යන විෂයන් සඳහා එක් එක් අධ්‍යයන මණ්ඩල යටතේ පශ්චාත් උපාධි හා ඩිප්ලෝමා වැඩ සටහන් ලෙස ප්‍රදානය කිරීමේ අරමුණින් බාහිර උපාධි ඒකකය ස්ථාපිත කර තිබේ.

ශාස්ත්‍රපති සහ ආචාර්ය පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා අතුරු ව්‍යවස්ථාවට විශ්වවිදයාලයීය සනාතන සභාවේ අතුරු කමිටුවන් වන විෂයමාලා සංවර්ධන කමිටුවේ අනුමැතිය හිමිවී ඇත. ළමා ආරක්ෂණ පශ්චාත් ඩිප්ලෝමා වැඩසටහනේ විෂයමාලා සංශෝධනය අවසන් කර එය සමාලෝචනය කෙරෙමින් පවතී. ළමා ආරක්ෂණ පශ්චාත් ඩිප්ලෝමා වැඩසටහනේ අතුරු ව්‍යවස්ථාවේ සංවර්ධන කටයුතු අවසන් කොට තිබේ.

පීඨය හා කර්මාන්ත අතර සහායෝගීතා ඒකකය පිහිටුවීම.

විශ්වවිද්‍යාලය සහ කර්මාන්තයන් අතර සහයෝගීතාවයන් සංවර්ධනය කිරීම සඳහා නව ඒකකයක් ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය ව්‍යවහාරික විදයා පීඨයේ ස්ථාපනය කරන ලදි. මෙමගින් කර්මාන්තයන්ට අදාල විශේෂඥ දැනුම සම්පත් දායක පදනමින් ලබාදෙන අතර නව සොයාගැනීම් සඳහා නව අවස්තාවන් විවිධ විෂයන්හි පර්යේෂණ හරහා ලබා දී ජාතියේ සංවර්ධනයට ඉවහල්වේ. මෙම සන්දර්භය තුළ කර්මාන්තයන්ගේ නවෝත්පාදනය මත පදනම් වූ පරිසරය සමඟ විශ්වවිද්‍යාලයේ සොයාගැනීම් මත පදනම් වූ සංස්කෘතිය, නිපුනතාවය මූලාශ්‍රය වූ සෞඛ්‍ය, ජලය, බලශක්තිය, පිරිසිදු වාතය සහ ආර්ථික තරඟකාරීත්වය ආදී පවතින සමාජ ගැටළු සහ අභියෝගයන්ට විසදුම් ලබා දීමේ ප්‍රබවයන් ලෙස වෙනස් වන අතර එමගින් අතිනවීන පර්යේෂණ සඳහා වැදගත් කර්යභාරයක් ඉටුකරයි.

සෞඛ්‍ය ප්‍රවර්ධනය පිළිබඳව කෙටිකාලීන හා පාඨමාලා හඳුන්වාදීම

බාහිර සහයෝගීතාකරුවන් හා විදේශීය සිසුන් සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධනය පිළිබඳව කෙටිකාලීන පාඨමාලාවන් හඳුන්වාදීමට පියවර ගෙන ඇති අතර ඒවා සති 01, සති 02 හා මාස 01 යනාදී කාල පරිච්ඡේදයන්ගෙන් යුක්තවේ.

ජාත්‍යන්තර සහයෝගීතාවයන්

- ස්වීඩනයේ ගොතන්බර්ග් විශ්වවිද්‍යාලයේ Sahlqrenska Acadmy හි ලෝක සෞඛ්‍ය පශ්චාත් උපාධි වැඩසටහනෙහි ශිෂ්‍යාවක වන සටු සුසන්නා ලට්ටිලා (Satu Susanna Lattila) ශිෂ්‍යාව ඇයගේ සීමාවාසික පුහුණුව 2021.11.03 සිට 2022.01.16 දක්වා සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යයනාංශයේදී සම්පූර්ණ කරනලදි.
- සිඩ්නි විශ්වවිද්‍යාලයේ ප්‍රජා සෞඛ්‍ය විද්‍යාලයේ පශ්චාත් උපාධි වැඩසටහනෙහි හි ශිෂ්‍යාවක වන Chnstine Joya Awuor සති 06 ක තම සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යයනාංශයේදී සම්පූර්ණ කළාය.

ගෞරවණීය මහාචාර්යවරයෙකු පත් කිරීම.

- සෞඛ්‍ය ප්‍රවර්ධනය අධ්‍යයන පාඨමාලාවේ උපදේශවරයෙකු වශයෙන් සේවය කරන මානසික රෝග පිළිබඳ ජ්‍යෙෂ්ඨ විශේෂඥවරයෙකු වන මහාචාර්ය දියනාත් සමරසිංහ මහතා සෞඛ්‍ය ප්‍රවර්ධනය අධ්‍යයනාංශයේ ගෞරවණීය බාහිර මහාචාර්යවරයෙකු වශයෙන් පත් කෙරිණි.

පවත්වන ලද පර්යේෂණ

- භෞතික විද්‍යා අධ්‍යයනාංශයේ අභ්‍යන්තර හා බාහිර අධීක්ෂකවරුන්ගේ අධීක්ෂණ යටතේ කාර්මික ගණිතය අවසන් වසර උපාධි අපේක්ෂකයින් විසින් පර්යේෂණ 08 ක් සිදු කරන ලදි.
- භෞතික විද්‍යා අධ්‍යනාංශය විසින් ඉහත උපාධි අපේක්ෂක ව්‍යාපෘති අතරින් තෝරාගත් ව්‍යාපෘතියක් සඳහා ජාත්‍යන්තර සඟරාවක පත්‍රිකාවක් ප්‍රකාශයට පත් කරන ලදි.
- උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ ආචාර්ය පී.කේ. හේමචන්ද්‍ර මහත්මිය විසින් මහනුවර ජාතික රෝහලේ සහයෝගීතාවයෙන් හදුනා නොගත් නිදන්ගත වකුගඩු රෝගියෙකුගේ මුල් අදියරේදී ප්‍රෝටීන් ප්‍රතිචාරයන් හදුනාගැනීමට මෙවලම් කට්ටලයක් නිර්මාණය කිරීම සහ දත්ත පද්ධතියක් සංවර්ධනය කිරීමේ නිරතව සිටී.
- භෞතික විද්‍යා අධ්‍යනාංශයේ අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් ජාත්‍යන්තර හා දේශීය පර්යේක්ෂණ සම්මන්ත්‍රණ වලදී සාරාංෂ 08ක් ප්‍රකාශයට පත් කරන ලද අතර තීරක සුචිගත සඟරා, ව්‍යුත් සඟරා සහ වෙනත් සඟරා වල ප්‍රකාශන 08ක් ප්‍රකාශයට පත් කරන ලදි.
- සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යනාංශය විසින් ''නිවාස පාදක පූර්ණ ළමා විය ආරක්ෂණය සහ සංවර්ධනය මඟින් ළමුන් ආරක්ෂා කිරීම'' සමඟ සහයෝගයෙන් පර්යේක්ෂණ ව්‍යාපෘතියක් සම්පුර්ණ කරන ලදි. නුවර එළිය දිස්ත්‍රික්කයේ තේ වත්තක තෝරාගත් කලාප 04ක ක්‍රියාකාරි පර්යේෂණ ප්‍රවේශය අනුගමනය කරමින් මෙම පර්යේෂණ ව්‍යාපෘතිය සිදුකෙරිණි.
- සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යනාංශය විසින් ප්‍රජා සාමාජිකයින්ගේ පෝෂණය සහ තෝරාගත් පෝෂණයන් සම්බන්ධ අංශ වැඩිදියුණු කිරීම සඳහා ප්‍රජා පාදක සෞඛ්‍ය ප්‍රවර්ධන මැදිහත්වීමක ප්‍රතිලාභ ඇඟයීම අරමුණු කරගනිමින් ලෝක අහාර වැඩසටහන සමඟ සහයෝගයෙන් පර්යේෂණ ව්‍යාපෘති සම්පුර්ණ කරල ලදි.
- සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යනාංශයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් 2021 වර්ෂය තුළ පර්යේෂණ ලිපි 07ක් සහ සම්මන්ත්‍රණ ඉදිරිපත් කිරීම් 04ක් ප්‍රකාශයට පත් කර ඇත.
- සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යනාංශයේ සිසුන් 2021 වර්ෂය තුළ සම්මන්ත්‍රණ ඉදිරිපත් කිරීම් 07ක් ප්‍රකාශයට පත් කරන ලදි.
- ජීව විද්‍යා අධ්‍යනාංශයේ කාර්ය මණ්ඩලය විසින් ක්ෂුද්‍රජීව විදයාව, උද්භිද විද්‍යාව, පරිසර විද්‍යාව සහ ධීවර හා ජලජීවී වගාව යන ප්‍රධාන විෂය ක්ෂේත්‍රවල පර්යේක්ෂණ ප්‍රශාශන 24ක් ප්‍රකාශයට පත් කරන ලදි. ඒවායින් පර්යේෂණ ප්‍රකාශන 09ක් දේශීය සඟරාවල ක්‍රියාදාමයන් ලෙස ප්‍රකාශයට පත් කරන ලද අතර 15ක් පාත්‍යන්තර සඟරාවල ක්‍රියාදාමයන් ලෙස ප්‍රකාශයට පත් කරන ලදි.
- රසායන විද්‍යා ාඅධ්‍යනාංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් තීරක සූචිගත ජර්නලවල ප්‍රකාශන 05ක් සහ සාරාංශ 16ක් ප්‍රකාශයට පත් කරන ලදි.
- පරිගණක අධ්‍යනාංශ කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් විසින් ප්‍රකාශන හතක් සහ සිසුන් විසින් ප්‍රකාශන හතක් ප්‍රකාශයට පත් කරන ලදි.

පවත්වන ලද ව්‍යාපෘති

- සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යනාංශය විසින් 'ප්‍රජා මට්ටම් සමාජ හා චර්යා වෙනස්වීම් සන්නිවේදනය/සෞඛය හා පෝෂණ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් මැයෙන් ව්‍යාපෘතියක් සිදු කරන ලදි. මෙහිදී ළදරු හා කුඩා දරුවන්ගේ ආහාර වැඩි දියුණු කිරීම් සහ සෞඛ්‍ය හා පෝෂණ ප්‍රවර්ධන සඳහා පිරිමි සහභාගීත්වය වැඩි කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු විය. ළමයි ආරක්ෂා කිරීම වැඩසටහනේ සහයෝගීතාවයෙන් මාතර දිස්ත්‍රික්කයේ කොටපොල, පස්ගොඩ සහ මොරවක පැවති වැඩසටහන් සඳහා මහජන සෞඛ්‍ය පවුල් සෞඛ්‍ය උපදේශීකාවන් 24ක් සහ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරීන් තිදෙනෙකු මේ සඳහා සහභාගි විය.
- සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යනාංශය විසින් 'කොවිඩ් 19 ප්‍රතිචාර මධ්‍යයේ සෞඛ්‍ය සම්පන්න සැකසුම් ප්‍රවේශය සඳහා ප්‍රජා සහභාගීත්වය' යන මාතෘකාව යටතේ අලව්ව සෞඛ්‍ය නිලධාරි ප්‍රදේශයේ දී වර්ෂ 2020-2021 කාලයේ දී ව්‍යාපෘතියක් සිදු කරන ලදි.
- සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යනාංශය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ සහයෝගීතාවයෙන් ''තෝරාගත් ස්ථානවල නව යොවුන් වියේ ළමුන්ගේ යහ පැවැත්ම වැඩිදියුණු කිරීම'' පිළිබඳ ව්‍යාපෘතියක් වර්ෂ 2020-2021 කාලයේදී සිදු කරන ලදි.

ලැබූ ප්‍රදානයන්

- ස්වීඩනයේ Liníaeus-Palme ප්‍රධාන - 2021
  ගොතන්බර්ග් විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යනාංශය අතර හුවමාරු වැඩසටහන් සැලසුම් කිරීම සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යනාංශයට ස්වීඩනයේ Liníaeus-Palme Grant 2021 වෙතින් ශ්‍රී ලංකා රුපියල් මිලියන 1.7ක තරඟකාරී ප්‍රදානයක් ලැබිණි.
- විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදානය
  සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යනාංශයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු වන සී.පී. සෙනෙවිරත්න මහතා සහ කේ. ජී. පී. එච්. කන්දෙගෙදර මහත්මිය 2021 වසර සඳහා විශ්වවිදයාල පර්යේෂණ ප්‍රදානය ලබා ගත්හ.
- මහාචාර්ය එච්. එම්. ඒ. එම්. සී හේරත්, විසින් විමර්ශක මගින් මෙහෙයවන ප්‍රදාන අංක 20-028, යටතේ රු 5,000,000.00ක මුදලක ප්‍රදානයක් ''පරිසරයේ විෂ ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා ස්මාට් මුද්‍රණය කළ හැකි සංවේදක සැකසීම'' සඳහා හිමි කරගන්නා ලදි.
- ආචාර්ය සුචිත්‍රා ඒ. සෙනෙවිරත්න විසින් විමර්ශක මගින් මෙහෙයවන ප්‍රදාන අංක 20-28, යටතේ රු 4,000,000.00ක මුදලක ප්‍රදානයක් ''දේශීයව ලබා ගත හැකි පුනර්ජනනීය ප්‍රභවයන්ගේ සුසර කළ හැකි ජෛව භායනයට ලක්විය හැකි බහු අවයවයක සහ බහු අවයවීය නැනෝකොම්පොසිට්'' සඳහා හිමි කරගන්නා ලදි.

ලැබූ සම්මාන

- ජාතික විද්‍යා ව්‍යාපෘති සම්මානය 2021
  සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යනාංශයේ ශිෂ්‍යයෙකු වන පී.ආර්.බී. විමුක්ති ධනංජය විසින් නිපුනතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2021 හි සංවිධානය කරන ලද ජාතික විද්‍යා ව්‍යාපෘතියේ හොඳම දසදෙනා අතරට තේරී පත් විය.
- උපකුලපති සම්මාන 2021
  රසායන විදයා අධ්‍යනාංශය විසින් සම්මානය දිනා ගන්නා ලද සම්මින
  - ව්‍යවහාරික විද්‍යා පීඨයේ ඉහළම සමාන්‍ය H-දර්ශකය හිමි කර ගැනීම
  - ව්‍යවහාරික විද්‍යා පීඨයේ ඉහළම සමාන්‍ය උපුටා ගැනීම් සංඛ්‍යාවක් ඇති අධ්‍යනාංශය බවට පත් වීම
- ව්‍යවහාරික විද්‍ය පීඨයේ ඉහළම H-දර්ශකය ඇති පර්යේෂකයන් අතරින් පළමු ස්ථානය මහාචාර්ය එච්. එම්. ඒ. එම්. සී හේරත් විසින් ලබා ගන්නා ලදි
- ව්‍යවහාරික විදයා පීඨයේ ඉහළම උපුටා ගැනීම් සංඛ්‍යාවක් ඇති පර්යේෂකයන් අතරින් පළමු ස්ථානය මහාචාර්ය එච්. එම්. ඒ. එම්. සී හේරත් විසින් ලබා ගන්නා ලදි
- ව්‍යවහාරික විද්‍යා පීඨයේ සුවිගත සඟරාවල වැඩිම පර්යේෂණ සංඛ්‍යාවක් ප්‍රකාශයට පත් කළ පරීක්ෂකයන් අතරින් පළමු වන ස්ථානය මහාචාර්ය එච්. එම්. ඒ. එම්. සී හේරත් විසින් ලබා ගන්නා ලදි.
- ව්‍යවහාරික විද්‍යා පීඨයේ සුවිගත සඟරාවල වැඩිම පර්යේෂණ සංඛ්‍යාවක් ප්‍රකාශයට පත් කළ පරීක්ෂකයන් අතරින් තුන් වන ස්ථානය ආචාර්ය එන්. බී. ජයරත්න් විසින් ලබා ගන්නා ලදි.
- ව්‍යවහාරික විද්‍යා පීඨයේ විශිෂ්ට.තම ජ්‍යෙෂ්ඨ පර්යේෂක ලෙස මහාචාර්ය එච්. එම්. ඒ. එම්. සී හේරත් විසින් සම්මානය ලබා ගන්නා ලදි.
- ව්‍යවහාරික විද්‍යා පීඨයේ 2019 වර්ෂයේ විශිෂ්ට.තම ජ්‍යෙෂ්ඨ පර්යේෂක ලෙස මහාචාර්ය එච්. එම්. ඒ. එම්. සී හේරත් විසින් ලබා ගත් අතර එය 2021 වර්ෂයේදී ප්‍රදානය කරන ලදි
- ව්‍යවහාරික විද්‍යා පීඨයේ 2019 වර්ෂයේ විශිෂ්ට.තම තරුන කනිෂ්ඨ පර්යේෂක ලෙස ආචාර්ය එන්. බී. ජයරත්න විසින් ලබා ගත් අතර එය 2021 වර්ෂයේදී ප්‍රදානය කරන ලදි.

වැඩමුළු සහ පුහුණුවීම්

සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යනාංශය විසින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය, දුම්කොළ සහ මත්පැන් වැළැක්වීම සහ රැකියා ස්ථානයේ සෞඛ්‍ය මැයෙන් වැඩමුළු තුනක් පවත්වා ඇති අතර සෞඛ්‍ය ප්‍රවර්ධනය, ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සහ ප්‍රජා සෞඛ්‍ය යන මැයෙන් පුහුණු වැඩසටහන් තුනක් 2021 වසර තුළ පවත්වන ලදි.

මාධ්‍ය දායකත්වය

සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යනාංශයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් 2021 වර්ෂයේදී සෞඛ්‍ය සහ යහපැවැත්ම, පවුල් යහපැවැත්ම, ළමා යහපැවැත්ම සහ දුම්කොළ සහ මධ්‍යසාර නිවාරණය පිළිබඳ රූපවාහිනී වැඩසටහන් 02කට සහ ගුවන් විදුලි වැඩසටහන් 03කට සහභාගී වුහ.

ඇ. අසමර්ථයන් හා නිර්දෝෂිභාවය

- කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් අධ්‍යයන හා පර්යේෂණ කටයුතුවල අතිමහත් බාධාවක් එල්ල වූ අතර අධ්‍යයන වැඩසටහන් වැඩි ප්‍රමාණයක් අවලංගු කිරීමටත් නැවත සැලසුම් කිරීමට සිදුවිය. සිසුන් ද වසරේ වැඩි කාලයක් විශ්වවිද්‍යාලය තුළ නොසිටි අතර පහසුකම් ද ප්‍රමාණවත් නොවීය
- එම කාලය තුල සැලසුම් කර තිබූ වැඩසටහන් බහුතරයක් අවලංගු කිරීමට සහ නැවත සැලසුම් කිරීමට සිදු වුයේ කොවිඩ් 19 වසංගතය හේතුවෙන් වසරේ වැඩි කාලයක් සිසුන් විශ්වවිද්‍යාල පරිශ්‍රය තුල නොසිටීමය.
- කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් ක්ෂේත්‍ර චාරිකා කිහිපයක් නැවත සංවිධානය කිරීමට සිදුවිය.
    - කාර්මික පුහුණු වැඩසටහන් නිසි ලෙස සැලසුම් කිරීමට නොහැකි වීම.
    - ගණිතය සහ සංඛ්‍යානය යන විෂයන් හි දේශක වරුන්ගේ හිග කම නිසා දේශන පැවැත්වීමේදී විවිධ ගැටළු සඳහා මුහුණ දීමට සිදු විය.
    - කොවිඩ් 19 වසංගතය හේතුවෙන් විශේෂඥයින් සහ පාර්ශව කරුවන් සමඟ සන්නිවේදනය කිරීමේ ඇති වූ ගැටළු හේතුවෙන් භෞතික විද්‍යාව, ජීව විදයාව, රසායන විද්‍යාව හා තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙන් සිදු කිරීමට නියමිතව තිබූ විෂය මාලා සංශෝධන සිදු නොකරන ලදි.
- කොවිඩ් 19 හේතුවෙන් විභාග කටයුතු ද යම් ප්‍රමාණයක් කල් දැමුවද මාර්ගගත ක්‍රමය ඔස්සේ ඒවා නැවත සාර්ථක ලෙස සම්පූර්ණ කරන ලදී
- සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යනාංශය වර්ෂ 2021 සඳහා සැලසුම් කරන ලද ක්‍රියාකාරකම්, සැලසුම් සහ අරමුණු කරා ලගා විය නොහැකි වුයේ පැවති කොවිඩ් වසංගත තත්වයයි. එසේ වුවද අධ්‍යනාංශය විසින් උපරිම ආයාසයක් යොදා වෙනස් කිරීම් තුලින් ඒවා ක්‍රියාවට නංවන ලදි.

ඈ. අනාගත සැලසුම

පහත ක්‍රියාකාරකම් තුළින් උපාධි පාඨමාලා වල ගුණත්ත්වය නැංවීම.

- දැනුම හා තාක්ෂණය ප්‍රදේශයේ ප්‍රජාවට ලබාදීම උදෙසා වැඩමුළු සංවිධානය කිරීම
- සිසුන්ගේ දැනුම හා ධාරිතාව සංවර්ධනය වන පරිදි මත්ස්‍ය, ජලජීවී, ක්ෂුද්‍රජීවී, උද්භිද විද්‍යා, සත්ත්ව විද්‍යා යන අංශ සඳහා පුහුණු වැඩමුළු සංවිධානය කිරීම.
- උපාධි අපේක්ෂකයින්ගේ පර්යේෂණ හා ඉදිරිපත් කිරීමේ කුසලතාවය වර්ධනය කිරීම උදෙසා අනෙක් විශ්වවිද්‍යාල වල සහයෝගීතාවය ඇතිව ශිෂ්‍ය පර්යේෂණ සමුළු සංවිධානය කිරීම.
- උතුරු මැද පළාතේ පාසල් වල අධ්‍යාපනයේ ගුණත්ත්වය නැංවීම උදෙසා පාසල් ගුරුවරුන් හා සිසුන් සඳහා වැඩමුළු සංවිධානය කිරීම.
- අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පාඩම් සඳහා සූදානම්වීමේ තාක්ෂණය වෙබ් අඩවි නිර්මාණය කිරීමේ හා පර්යේෂණ කුසලතා සම්බන්ධව පුහුණු වැඩමුළු සංවිධානය කිරීම.
- විද්‍යාගාර මෙහෙයවීමේ ප්‍රමිතීන් පිළිබඳව විද්‍යාගාර කාර්ය මණ්ඩලය සඳහා වැඩමුළු සංවිධානය කිරීම.
- තරුණ ජීවවිද්‍යාඥයින්ගේ සංගමය නැවත පණගැන්වීම.
- කාර්මික ගණිතය සිසුන් කාර්මික පුහුණුව සඳහා යොමුකිරීමේ නිසි සැලසුමක සකස් කිරීම.
- සාමාන්‍ය උපාධි පාඨමාලා හදාරන සිසුන් සඳහා ද කාර්මික පුහුණුව ලබා දීම.
- නවක සිසුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් හඳුන්වාදීම.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හදාරන සිසුන් සඳහා ක්ෂේත්‍ර චාරිකා හා වැඩමුළු සංවිධානය කිරීම.
- වර්ෂය සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩල බඳවා ගැනීම.

විෂය මාලා සංශෝධනය හඳුන්වාදීම/සම්පූර්ණ කිරීම

- ව්‍යවහාරික විද්‍යා (ජීවවිද්‍යා පාඨමාලාව) හා ව්‍යවහාරික ජීවවිද්‍යා ගෞරව උපාධි.
- භෞතික විද්‍යා ගෞරව උපාධියක් සඳහා භෞතික විද්‍යා විෂය නිර්දේශය.
- රසායන විද්‍යා ගෞරව උපාධිය.
- නව පාරිසරික විද්‍යා ගෞරව උපාධි පාඨමාලාව.
- පරිගණක විද්‍යා විෂය ධාරාව ආරම්භ කිරීම.

ජීව විද්‍යාව, භෞතික විදයාව සහ රසායනික විදයාව විසින් පිරිනමනු ලබන උපාධි වැඩසටහන් පිළිබඳ වැඩසඵයන සමාලෝචනය සම්පුර්ණ කිරීම.

නව සංවර්ධනයන්

- ගණිතය පිළිබඳව නව ගෞරව උපාධියක් ස්ථාපිත කිරීම.
- පරිගණක අධ්‍යයනාංශය මගින් නව විෂය මාලාව දියත් කිරීම.
- පාරිසරික විද්‍යාව ගෞරව උපාධි පාඨමාලාවේ විෂය මාලාව සකස් කර අවසන් කිරීම.
- සෞඛ්‍ය ප්‍රවර්ධනය පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාව නුදුරේදීම හඳුන්වා දීම.
- ගණිතය හා දත්ත විශ්ලේෂණය පිළිබඳව අධ්‍යයනාංශ/ඒකක ස්ථාපිත කිරීම.

පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලා

- ළමා ආරක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ අතුරු ව්‍යවස්ථාව සඳහා අනුමැතිය ලබා දීම.
- විවිධ විෂයමාලා යටතේ දර්ශනපති හා ආචාර්ය වැනි පශ්චාත් උපාධි පාඨමාලා හඳුන්වා දීම.
- රසායන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන සඳහා විෂය මාලාව සකස් කිරීම සහ ආරම්භ කිරීම.

යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

- හරිත සරසවි සංකල්පය පිළිබඳ අවධානය යොමු කිරීම.
- පීඨය සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් සකස් කිරීම.
- සූර්ය බලශක්ති පද්ධතියක් ස්ථාපිත කිරීම.
- ආබාධ සහිත සිසුන් සඳහා යටිතල පහසුකම් සකස් කිරීම.
- කුසලතාපූර්ණ හා ගැටළු නිරාකරණය කරගැනීමේ හැකියාව සහිත සිසුන් නිර්මාණය කිරීමේ අරමුණින් රසායන විද්‍යා අධ්‍යයනාංශයේ විද්‍යාගාර සංවර්ධනය කිරීම.
- පරිගණක පර්යේෂණ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම.
- තොරතුරු තාක්ෂණ හා පරිගණක විද්‍යා සිසුන්ගේ අධ්‍යයන කටයුතු කරගෙන යාමට අවශ්‍ය භෞතික සම්පත් වැඩිදියුණු කිරීම.
- සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යයනාංශයේ ගොඩනැගිල්ල ඉහළ යන ශිෂ්‍ය සංඛ්‍යාවට පහසුකම් සැපයිය හැකි පරිදි වැඩිදියුණු කිරීම.
- රසායන විද්‍යා විද්‍යාගාරය නවීකරණය කිරීම හා වාහන අංගනයේ ඉතිරි වැඩ කොටස් හා දේශනා ශාලා සංකීර්ණයේ ඉතිරි වැඩ කොටස් සම්පූර්ණ කිරීම. (අදියර II)

19. කළමනාකරණ අධ්‍යයන පීඨය

අ. හැඳින්වීම

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයිය කළමනාකරණ අධ්‍යයන පීඨය කළමනාකරණ අධ්‍යනය පිළිබඳව විශිෂ්ඨතම මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මකවේ. කළමනාකරණ අධ්‍යයන පීඨය මඟින් මූලික උපාධි පාඨමාලා මෙන්ම පශ්චාත් උපාධි පාඨමාලාද ක්‍රියාත්මක කෙරේ. වර්තමානයේදී කළමනාකරණ අධ්‍යයන පීඨය 4500 ඉක්මවූ සිසු ප්‍රජාවකින් සමන්විත වන අතර එහි සංයුතිය අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් 2000ක්, බාහිර උපාධි අපේක්ෂකයින් 2400ක් සහ පශ්චාත් උපාධි අපේක්ෂකයින් 150ක් පමණ වේ. කළමනාකරණ අධ්‍යයන පීඨය අධ්‍යනාංශ හයකින් සමන්විත වන අතර ඒවා ගිණුම්කරණ හා මූල්‍ය අධ්‍යනාංශය, ව්‍යාපාර කළමනාකරණ අධ්‍යනාංශය, මානව සම්පත් කළමනාකරණ අධ්‍යනාංශය ව්‍යාපාර තොරතුරු තාක්ෂණ අධ්‍යනාංශය, අලෙවිකරණ කළමනාකරණ අධ්‍යනාංශය, සහ සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණ අධ්‍යනාංශය වේ. එම අධ්‍යනාංශ මඟින් පහත සඳහන් උපාධි පිරිනමනු ලැබේ.

- ගණකාධිකරණය හා මූල්‍ය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය
- ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය
- මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය
- ව්‍යාපාර තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය
- අලෙවිකරණ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය
- සංචාරක හා හෝටල් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය

තවද පීඨය විසින් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති සහ ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි වැඩසටහන් ද පවත්වනු ලැබේ. පීඨය මඟින් ආචාර්යය උපාධියක් පිරිනැමීමේ වැඩ කටයුතුද ආරම්භකර ඇති අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියද ඒ සඳහා හිමිවී ඇත.

කළමනාකරණ අධ්‍යයන පීඨයේ මෙහෙය වනුයේ කළමනාකරණ අධ්‍යයනයට හා නායකත්වයට ප්‍රායෝගික කුසලතා සහිත ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම සහ වෙනස් වන පරිසරය පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වන පර්යේක්ෂණ පැවැත්වීමයි.

පීඨයේ අරමුණු සහ අභිමතාර්ථ

- ව්‍යාපාර ව්‍යවසායන්ට සහය විය හැකි හා සංවර්ධනය කල හැකි ව්‍යාපාර හා කළමනාකරණය පිළිබඳ මනා අධ්‍යාපනයක් සහිත සිසුන් බිහි කිරීම.
- නැගී එන කර්මාන්ත/ව්‍යාපාරික ව්‍යවසායන් සඳහා අවශ්‍ය කුසලතා හා දැනුම ලබා ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දීම සහ වේගයෙන් සංවර්ධනය වන ව්‍යාපාරික පරිසරය තුල වෘත්තීකයන් වීමට අවශ්‍ය හැකියාවන් ඔවුන්ට ලබා දීම.
- ව්‍යාපාරික ලෝකයේ ගැටළු හඳුනා ගැනීමට සහ ඔවුන්ගේ අනාගත වෘත්තීන් සංවර්ධනය කර ගැනීමට අත්‍යවශ්‍ය ප්‍රමානවත් න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුමක් ලබා දීම.
- සිසුන්ගේ නිශ්චිත අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාල නිර්මානාත්මක චින්තනය, ගැටළු විසඳීම, සන්නිවේදනය සහ පර්යේක්ෂණ කුසලතා පිළිබඳ පුර්න හැකියාවන් ලබා ගැනීමට ශිෂ්‍යයින් දිරිමත් කිරීම.
- පහසුකම් ඇතිවිට උප විෂයන් කෙරෙහි හබා යෑම සඳහා සිසුන්ට වැඩි සහයෝගයක් ලබා දීම.

ආ. ජයග්‍රහනයන්

- විද්‍යාවිදි (ගෞරව) අලෙවි කළමනාකරන උපාධි වැඩසටහන සඳහා විෂයමාලා සංශෝධනය සාර්ථකව නිම කිරීම.
- උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීම යන ව්‍යාපෘතියේ ප්‍රදාන යටතේ අධ්‍යනාංශ හතරක් සඳහා සම්පත් මධයස්ථානයක් පිහිටුවීම.
- ව්‍යාපාර කළමනාකරණ අධ්‍යානාංශයේ සහ අලෙවි කළමනාකරණ අධ්‍යනාංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මඟපෙන්වීම යටතේ සිසුන් විසින් ප්‍රජා පාදක ව්‍යාපෘති 31ක් සම්පුර්ණ කිරීම.
- වාර්ශික පීඨ පර්යේෂණ සම්මන්ත්‍රණය ලෙස කළමනාකරණය පිළිබඳ 4 වන ජාතික පර්යේෂණ සම්මන්ත්‍රණය - (NRSM -2021)2021 සාර්ථකව පැවැත්වීම.
- වර්ෂ 2021 සඳහා සංචාරක දින වැඩසටහන සාර්ථකව පැවැත්වීම.
- විශ්වවිද්‍යාලයේ පළමු පර්යේෂණ සම්මාන උළෙලේදී පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් හතර දෙනෙකු පමණක් සම්මාන හිමිකර ගැනීම.

- ''උතුරුමැද පළාත සුරක්ෂා කිරීම'' වැඩසටහන ආරම්භ කරමින් උතුරුමැද පළාත් උසස් පෙළ සිසුන් සහ පාසල් ගුරුවරුන් කේන්ද්‍ර කර ගනිමින් අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම.
- ''කළමනාකරණ කරුණු'' පීඨ ජර්නලයෙ හි වෙළුම් දෙකක් ප්‍රකාශයට පත් කිරීම.
- පහත දැක්වෙන සිසුන්ගේ සඟරා ප්‍රකාශයට පත් කරන ලදි.
  - ව්‍යාපාර තොරතුරු (BITSA) - වෙළුම 33
  - උරුමය සඟරාව (URUMAYA) - වෙළුම 03
  - වර්ණ සඟරාව (WARNA Magazine) - වෙළුම 02

ඇ. අසමර්ථයන් හා නිර්දෝෂිභාවය

- කොවිඩ් 19 වසංගතය පැතිරීම හේතුවෙන් සිසුන් සඳහා සැලසුම් ගරන ලද වැඩසටහන් කිහිපයක් සහ විෂය බාහිර ක්‍රියාකාරකම් පැවැත්වීමට නොහැකි වීම.
- කොවිඩ් 19 වසංගතය හේතුවෙන් පීඨයට අදාළ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද විය.
- මූල්‍ය සම්පත් සීමා කිරීම හේතුවෙන් සැලසුමු කරන ලද ක්‍රියාකාරකම් කිහිපයක් කල් දමන ලදි.

ඈ. අනාගත දැක්ම

- පහත සඳහන් සංවිධාන සමඟ අවබෝදතා ගිවිසුම් සංවර්ධනය කිරීම.
  - ඒ. මහජන බැංකුව
  - බී. සෙනිඩි ව්‍යාපාර විසදුම් සීමාසහිත පුද්ගලික සමාගම
  - සී. පුද්ගල කළමනාකරණය පිළිබඳ වරලත් ආයතනය
  - ඩී. සීමාසහිත සිලෝන් බිස්කට්
  - ඊ. ජැට් හොල්ඩින්ග්
  - එෆ්. බ්‍රැන්ඩික්ස් ඇඟලුම්
  - ජී. එල්.ඕ.එල්.සී හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම
  - එච්. ඇඩ්වේටා හෝල්ඩින්ග් පුද්ගලික සමාගම
  - අයි. වරලත් ගණකාධිකාරි ආයතනය
  - ජේ. එපික් ලංකා පුද්ගලිග සමාගම
  - කේ. මොරිසන් ලංකා පුද්ගලික සමාගම
  - එල්. මීඩා ශ්‍රී ලංකා
  - එම්. එම්. ඒ. එස්. ෆැබ්රික්ස් මෙට්‍රික්ස්
  - එන්. ආර්. කේ. එල්. එස්. ඇසෝසියේට්ස්

- පහත සඳහන් විශ්වවිද්‍යාල සහ ආයතන සමඟ එක්ව ජාත්‍යන්තර සහයෝගීතාව වැඩිදියුණු කර ගැනීම.
  - ඒ. ආසියා පැසිෆික් විශ්වවිද්‍යාලය - බංගලාදේශය, ඩකා නුවර
  - බී. බ්‍රෙඩා විශ්වවිද්‍යාලය - නෙදර්ලන්තය
  - සී. රාජකීය තාක්ෂණ ආයතනය - ස්වීඩනය
  - ඩී. අජීන්ක්‍යා ඩීවයි පටීල් විශ්වවිද්‍යාලය - ඉංදියාව පූන් නුවර

- ව්‍යාපාරික ආයතන සමඟ සහයෝගීතාවයෙන් පර්යේෂණ පැවැත්වීම.
- මානව සම්පත් කළමනාකරණ සිසුන්ට නව උපදේශන මනෝවිද්‍යා වැඩසටහනක් හඳුන්වා දීම.
- ව්‍යවසායකත්ව ව්‍යාපාර පුහුණු කිරීම පිළිබඳ ඩිප්ලෝමාව හඳුන්වා දීම
- මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව හඳුන්වා දීම.
- ''කළමනාකරණ කරුණු'' පීඨ සඟරාව සුචිගත කිරීම.
- නව ආචාර්ය උපාධි පාඨමාලාවක් ආරම්භ කිරීම.
- පැරණි පීඨ ගොඩනැගිල්ල වැඩි දියුනු කිරීමේ ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කිරීම.
- විධායක නිළධාරීන් සඳහා ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි වැඩසටහනක් හඳුන්වා දීම.
- ශිෂ්‍යයින් සඳහා පහත දැක්වෙන තරඟ පැවැත්වීම.
  - ඒ. ක්වීස් ෆියෙස්ටා 2022
  - බී. තාක්ෂණය සොයා ගැනීම. (DOT 2K22)
  - සී. RUIZ-G 2K22 ක්‍රීඩා තරඟාවලිය
  - ඩී. ''පික්සල් අයි'' අන්තර් විශ්වවිද්‍යාල ග්‍රැෆික් නිර්මාණ තරඟාවලිය
  - ඊ. "BIT Cde V4.0" අන්තර් විශ්වවිදයාලයීය කේත තරඟාවලිය

- පහත ශිෂ්‍ය සඟරා එළිදැක්වීම
    - ඒ. ව්‍යාපාරික ස්පන්දනය (Business Pulse)
    - බී. මුහුදු ගමන (Voyage)
    - සී. මානව සම්පත් දිස්නය (HR Glimmer)
    - ඩී. සංචාරක සහ ආගන්තුක සත්කාර කර්මාන්තයේ දර්ශනය : පර්යේෂණ ප්‍රතිදානය

20. වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය

අ. හැඳින්වීම

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය වර්ෂ 2006 ජූලි මාසයේදී ස්ථාපනය කරන ලද අතර එය අධ්‍යනාංශ 15කින් සහ අධ්‍යයන ඒකක 3කින් සමන්විත විය. ශ්‍රී ලංකාවේ තෙවැනියට විශාලතම රෝහල වන අනුරාධපුර ශික්ෂණ රෝහල පීඨයේ ප්‍රධානතම ශික්ෂණ රෝහලවේ. නවීන රෝග විනිශ්චය සහ කළමනාකරණ පහසුකම් වලින් සමන්විත ප්‍රධාන සායන අංශය වන විශ්වවිද්‍යාලයීය මහාචාර්ය ඒකකය අනුරාධපුර ශික්ෂණ රෝහල තුල පිහිටා ඇත. සියළුම සායනික අධ්‍යනාංශ වල අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින් අනුරාධපුර ශික්ෂණ රෝහලේ නිර්චේතනික උපදේශකයින් ලෙස සේවාවන් සපයයි. ප්‍රජා කටයුතු සිදු කෙරෙන ප්‍රදේශය, සමාජ-ආර්ථික වශයෙන් විවිධ වූ ජනගහනයකින් සමන්විත බැවින් ප්‍රාථමික හා වැළැක්වීමේ ප්‍රතිකාර පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා ගැනීමට ඉඩකඩ සැලසේ.

වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය විසින් සපයනු ලබන ප්‍රජා සත්කාර සේවාවන් අතර මානසික ආබාධිත ළමුන් සඳහා වනසේවාවන්, බාහිර සායන, සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සහ මාතෘ හා ළදරු සත්කාර සේවා විශේෂයෙන්ම ළමා මන්දපෝෂනය වැළැක්වීම සහ මාතෘ රෝගාබාධ පිළිබඳ පුළුල්ව සොයා බැලීම ප්‍රධාන තැනක් ගනු ලැබේ. සිසුන්හට ඔවුන්ගේ උපරිම හැකියාවන් කරා ළඟා වීමට මඟ පාදමින් ආයතනයේ ප්‍රමිතීන් ඉහළ නැංවීමට පීඨය අඛණ්ඩව උත්සාහ කරයි. පීඨයේ කෙටි කාලින ඉතිහාසය පුරාවටම අපගේ උපාධි අපේකෂකයින් පොදු විශිෂ්ඨතා ශ්‍රේණිගත කිරීමේ ඉදිරියෙන් සිටින අතරම විවිධ පශ්චාත් උපාධි පාඨමාලාවලද ඉහල දස්කම් දක්වා ඇත.

ආ. ජයග්‍රහනයන්

නව අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් බඳවා ගැනීම

- වෛද්‍ය කේ. එම්. එස්. එස්. රත්නසිරි, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II වන ශ්‍රේණිය, ළමාරෝග අධ්‍යනාංශය සඳහා
- වෛද්‍ය එච්. බී. ඩී. ජීවන්ත, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II වන ශ්‍රේණිය, කායච්ඡේදන අධ්‍යනාංශය සඳහා

අධ්‍යන කාර්ය මණ්ඩල උසස්වීම්

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - I වන ශ්‍රේණිය

- වෛද්‍ය එස්. පී. වික්‍රමගේ - භෞතවේදී අධ්‍යනාංශය
- වෛද්‍ය එස්. පී. ඒ. එස්. සේනාඩීර - ජෛව රසායන අධ්‍යනාංශය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II වන ශ්‍රේණිය

- වෛද්‍ය වයි. පී. ජේ. එන්. වර්ණසේකර (2020 සිට) - ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශය
- වෛද්‍ය එම්. පී. ආර්. එස්. එස්. ගුණතිලක (2020 සිට) - ක්ෂුද්‍රජීව විද්‍යා අධ්‍යනාංශය
- වෛද්‍ය ඒ. එම්. එම්. වී. කුමාරි - භෞතවේදීය අධ්‍යනාංශය
- වෛද්‍ය පී. එස්. අමරසිංහ (2020 සිට) - ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශය

අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් පශ්චාත් උපාධිය පාඨමාලා සම්පූර්ණ කිරීම

ආචාර්ය උපාධි

- වෛද්‍ය වයි. පී. ජේ. එන්. වර්ණසේකර, අංශ ප්‍රධාන / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (දෙවන ශ්‍රේණිය), ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශය

දර්ශනපති උපාධි

- වෛද්‍ය ජේ. එම්. ඩී. ඩී. ජයසුන්දර කථිකාචාර්ය (ආධුනික), ක්ෂුද්‍රජීව විද්‍යා අධ්‍යනාංශය

විද්‍යාපති උපාධි

- වෛද්‍ය ආර්. එම්. එස්. අයි. රාජපක්ෂ කථිකාචාර්ය (ආධුනික), භෞතවේදීය අධ්‍යනාංශය - නැනෝ තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය

පශ්චාත් ඩිප්ලෝමා

- වෛද්‍ය ජේ. එම්. ඩී. ඩී. ජයසුන්දර, කථිකාචාර්ය (ආධුනික), ක්ෂුද්‍රජීව අධ්‍යනාංශය - වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

(අ) පර්යේක්ෂන. නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

විෂය	ප්‍රකාශන සංඛ්‍යාව
අ. පර්යේෂණ ප්‍රකාශන සංඛ්‍යාව (සාරාංශ, සම්පූර්ණ පත්‍රිකා)	(80+87) = 167
ආ. නවෝත්පාදන සංඛ්‍යාව	1
ඇ. ශාස්ත්‍රීය සඟරා සංඛ්‍යාව	2
ඈ. පොත් සංඛ්‍යාව	1
ඉ. ජර්නල ලිපි සංඛ්‍යාව	80

(ආ) සම්මන්ත්‍රණ වැඩමුළු සහ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ පිළිබඳ විස්තර

විෂය	සැලසුම් කරන ලද	පවත්වන ලද
අ. පශ්චාත් උපාධි වැඩසටහන සම්බන්ධව	3	3
ආ. පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන සම්බන්ධව	-	-
ඇ. මූලික උපාධි වැඩසටහන සම්බන්ධව	10	10
ඈ. පශ්චාත් උපාධි පාඨමාලා සම්බන්ධව	1	1
ඉ. සෞඛ්‍ය සේවා සහ සුරක්ෂිතතාවයේ තත්ත්වයන් වැඩි දියුණු කිරීම හා සම්බන්ධව වැඩමුළුව (වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශය සහ ප්‍රජා වෛද්‍ය අධ්‍යනාංශය)	3	5

(ඇ) ලැබුණු සම්මාන පිළිබඳ විස්තර

විෂය	සම්මාන සංඛ්‍යාව	අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින් ලබාගන්නා ලද	සිසුන් විසින් ලබාගන්නා ලද
අ. දේශීය සම්මාන	15	6	-
ආ. ජාතික සම්මාන	2	2	6
ඇ. ජාත්‍යන්තර සම්මාන	1	1	-
ඈ. වෙනත්	1	1	-

ඇ. අසමර්ථයන් හා නිර්දෝෂිභාවය

- සුදුසුකම් ලත් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් බඳවා ගැනීම ප්‍රධාන අභියෝගයක් ලෙස පවතී. වසරතුල දෙවතාවක් දැන්වීම් පළ කළත් අපට අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් බඳවා ගැනීමට නොහැකි විය. වෛද්‍යවරුන් හට සෞඛ්‍ය අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල මඟින් සපයන පහසුකම්වල ඇති කැපිපෙනෙන වෙනස සහ ශ්‍රී ලංකා රජරට විශ්වවිදයාලයීය වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය ස්ථාපිත ස්ථානය අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් බඳවා ගැනිමට ඇති ප්‍රධාන බාධක ලෙස හැඳින්විය හැක.
- පර්යේෂණ ප්‍රතිදානය ප්‍රශංසනීය වුවත් විශ්වවිද්‍යාලයෙන් ලැබෙන මුල්‍ය අනුග්‍රහයේ හිඟකම, ප්‍රමාණවත් අධ්‍යයන කාර්ය මණ්ඩලයක් නොමැතිකමින් සිටින අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින් ඉගැන්වීමේ කටයුතු සමඟ කාර්ය බහුල වීම සහ දක්ෂ තාක්ෂණික කාර්ය මණ්ඩලයක් සහ කළමණාකාර සහායකයින් නොමැතිකම නිසා අපගේ උපරිම හැකියාවන් කරා ළඟා වීමට නොහැකි විය.
- කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් සැලසුම් කර තිබූ බොහෝ ක්‍රියාකාරකම් නොපැවැත්විය.

ඈ. අනාගත දැක්ම

- හරිත විශ්වවිද්‍යාල සංකල්පය ක්‍රියාත්මක කිරීම.
- පීඨ කාර්ය මණ්ඩලය සඳහා රථගාලක් ඉදි කිරීම.
- පීඨ පරිශ්‍රය අලංකරණය කිරීම.
- පීඨයේ ප්‍රධාන ආපන ශාලාවේ වහලය ප්‍රතිසංස්කරණය කිරීම.
- පීඨ නේවාසිකාගාරය සඳහා ජීව වැටක් ඉදිකිරීම.
- පාවිච්චි කළ නොහැකි තත්වයේ ඇති කුඩා දේශන ශාලා අලුත්වැඩියා කිරීම.
- පෙනහළු ක්‍රියාකාරකම් සම්බන්ධ විද්‍යාගාරයක් ස්ථාපනය කිරීම සහ එහි සේවාවන් ප්‍රජාවට සපයා දීම.
- වර්ෂ 2022 දී පවුල් සෞඛ්‍ය උපාධි අපේක්ෂකයින්ගේ පුහුණු සායනය හඳුන්වාදීම
- මානව ජාන ඒකකය පිහිටුවීම

21. සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය

අ. හැඳින්වීම

1995 වර්ෂයේ විශ්වවිද්‍යාලයේ ආරම්භයක් සමඟම සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය ස්ථාපිත කිරීම සිදුවිය. වර්තමාන පීඨ ශිෂ්‍ය සංඛ්‍යාව 1795 ක් වන අතර 2021 වසරේ දී නවක සිසුන් 549 ක් පීඨයට ඇතුළත් කරගන්නා ලදී. පීඨය අධ්‍යයනාංශ 07 කින් සමන්විත වන අතර ශාස්ත්‍රවේදී හා ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි ප්‍රදානය කරනු ලබයි.

අධ්‍යයනාංශය	උපාධි පාඨමාලාව
පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය	පුරාවිද්‍යා හා උරුම කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය
ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය	-
පරිසර කළමනාකරණ අධ්‍යයනාංශය	පරිසර කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය
මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශය	ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රවේදී මානව ශාස්ත්‍ර ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය සිංහල හා සමාජ ජන සන්නිවේදනය පිළිබඳ ශාස්ත්‍රවේදි (සාමාන්‍ය) උපාධිය
භාෂා අධ්‍යයනාංශය	සිංහල පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය
සමාජ විද්‍යා අධ්‍යයනාංශය	සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය
ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය	ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය

මෙම උපාධි පාඨමාලා තුළින් උපාධිධාරීන් පහත ප්‍රතිඵල ලඟා කරගනු ඇත.

- දේශීය හා ජාත්‍යන්තර සමාජ හා සංස්කෘතික හැකියාවන් මනාව හඳුනාගැනීමට හා ප්‍රශස්ත දැනුමක් ලබාගැනීමට හා අවශ්‍යතාවයට සරිලන පරිදි ඒවා වැඩිදියුණු කිරීමට හා වෙනස් කිරීමට කුසලතාවය හා ආත්ම විශ්වාසය වර්ධනය කරගැනීම.
- ඔවුන්ගේ භෞතික හා ආත්මීය අවශ්‍යතා අතර ආවේණික අන්තර් සම්බන්ධතාවය පිළිබඳව සංජානනය වැඩිදියුණු කළ හැකි හා පුළුල් කළ හැකි සමතුලිත අධ්‍යාපනයක් හිමි කරගැනීම.

ආ. ජයග්‍රහණ

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය

- පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ ශාස්ත්‍රවේදී හා ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාවල ප්‍රායෝගික අත්පොත සඳහා ප්‍රායෝගික පාඩම් සැලසුම් සකස් කිරීම.
- අධ්‍යයනාංශයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලයේත්, සිසුන්ගේත් ජයග්‍රහණ අගය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම.
- පාලිප්පොතාන මෙගලිතික සුසාන භූමිය පාදක කරගත් පර්යේෂණ වාර්තාව "පාලිප්පොතාන සංස්කෘතික භූ දර්ශනය" (Cultural Landscape of Palippothana) නමින් එළිදැක්වීම.
- අධ්‍යයනාංශයේ පුරාවිද්‍යා හා උරුම අධ්‍යයන සඟරාවේ 06 වන වෙළුමේ, පළමු, දෙවන හා තෙවන නිකුතුවන් හා 'පුරාවේද' සඟරාව එළිදැක්වීම.

පරිසර කළමනාකරණ අධ්‍යයනාංශය

- ජර්මනියේ බර්ලින් නුවර Konrad Adenauer Stiftung (KAS) පදනම මඟින් සංවිධානය කළ දේශගුණික අර්බුදය හා කොවිඩ් වසංගතය හමුවේ නගර වල තිරසාර බව හා ඔරොත්තු දීමේ හැකියාව" සම්මන්ත්‍රණය සියයකට අධික සිසුන් සංඛ්‍යාවකගේ සහභාගිත්වයෙන් පැවැත්වීම.
- උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨයේ අනෙකුත් අධ්‍යයනාංශ වල සහයෝගය ද සහිතව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වලට අදාළ පර්යේෂණ ව්‍යාපෘතියක් සිදු කිරීම.
- අධ්‍යනාංශයේ "සර්ම කලාපීය පරිසරය" නැමති සඟරාවේ දෙවන වෙළුම සාර්ථකව සම්පූර්ණ කිරීම.

ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය

- ආර්ථික විද්‍යාව ශාස්ත්‍රවේදී හා ගෞරව උපාධි පාඨමාලාවල උපාධි අපේක්ෂකයින්ගේ ආර්ථික මිතික විශ්ලේෂණයට පහසුකම් සපයනු පිණිස ආර්ථික මිතික විද්‍යාගාරය ස්ථාපිත කිරීම.

- අධ්‍යයනාංශය තුළ දත්ත විශ්ලේෂණ ඒකකයක් හා ව්‍යාපාර ඉන්කියුබේටර ඒකකයක් ස්ථාපිත කිරීම.
- රජරට ආර්ථික සමාලෝචන ජර්නලයේ පළමු වෙළුම, ප්‍රතිපක්ති සංෂිප්ත 2020 හිපළමු වෙළුම හා සාරාංශ එකතුව පළමු වෙළුම අන්තර් ගත කොට ආර්ථික විද්‍යා අධයනාංශයේ ජර්නලය එළිදැක්වීම.
- කුඩා හා මධ්‍ය පරිමාන ව්‍යවසාය අංශයේ ආයතනික කාර්ය සාධනය වර්ධනය කිරීම සහ දත්ත විශ්ලේෂණය පිළිබඳව කෙටි කාලීන පාඨමාලාවන් සකස් කිරීම.

මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය

- ඉතිහාසය හා ජන සන්නිවේදනය යන ශාස්ත්‍රවේදී ගෞරව උපාධි සහ ශාස්ත්‍රවේදී උපාධියන් හී ප්‍රායෝගික අත්පොත සකස් කිරීම.
- අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව පිළිබඳ යෝජනාව විෂයමාලා සමාලෝචන කමිටුව වෙත ඉදිරිපත් කිරීම.
- 'සංහිතා' මාධ්‍ය සඟරාවේ පළමු වෙළුම විද්‍යුත් පිටපතක් ලෙස එළිදැක්වීම.
- ''මානවශාස්ත්‍ර අධ්‍යයන'' ජර්නලයේ වෙළුම් දෙකක් ප්‍රකාශයට පත් කිරීම සහ 'සංහිතා' මාධ්‍ය සඟරාවේ දෙවන වෙළුමේ කටයුතු සම්පූර්ණ කිරීම.

ඇ. අසමර්ථයන් හා නිර්දෝශීභාවය

- පූර්ව නූතන ශ්‍රී ලංකාවේ මැටි භාණ්ඩ තාක්ෂණය සහ පුරාවිද්‍යා සහ උරුම කළමනාකරණ අධ්‍යනාංශයේ ගල් මෙවලම් තාක්ෂණය පිළිබඳ එක්දන වැඩමුළුව කොවිඩ් 19 වසංගතය හේතුවෙන් අවලංගු කරන ලදි.
- මානව ශාස්ත්‍ර අධ්‍යනාංශයේ ජන සන්නිවේදනය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාව, ව්‍යාපාර පරිපාලන, ශාස්ත්‍රපති සහ ආචාර්ය උපාධි වැඩසටහන්වල විෂයමාලා සංවර්ධනය සම්පූර්ණ කළ නොහැක.

ඈ. අනාගත සැලසුම්

- ශාස්ත්‍රවේදී සාමාන්‍ය සහා ශාසත්‍රවේදී ගෞරව උපාධි සඳහා අනිවාර්ය තොරතුරු තාක්ෂණ පාඨමාලාවන් ප්‍රදානය කිරීම සඳහා තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය පිහිටුවීම.
- ලෝක බැංකු ව්‍යාපෘතියක හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ මානවශාස්ත්‍ර සඳහා තොරතුරු තාක්ෂණය (IT for Humanities) ව්‍යාපෘතියේ සහයෝගයෙන් පරිගණක 60 කින් සමන්විත නව තොරතුරු තාක්ෂණ විද්‍යාගාරයක් ස්ථාපනය කිරීම.
- සිසුන්ගේ කාර්මික පුහුණුව සඳහා වන අවබෝධතා ගිවිසුමක් පීඨයේ සියළුම අධ්‍යයනාංශ මගින් අත්සන් කිරීම.
- පීඨයේ උපාධි අපේක්ෂකයින්ගේ දෙවන පර්යේෂණ සමුළුව පැවැත්වීම.

22. තාක්ෂණ පීඨය

අ. හැඳින්වීම

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ සය වන පීඨය ලෙස තාක්ෂණ පීඨය වර්ෂ 2017 සැප්තැම්බර් මස 14 දිනැති ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලදි. විශ්වවිද්‍යාලයේ වර්තමාන සමස්ත අධ්‍යයන ව්‍යුහය පුළුල් කිරීමේ අරමුණින්, තාක්ෂණ පීඨයේ මූලාරම්භය 2015 ජනවාරි මාසයේ දී ව්‍යවහාරික විද්‍යාපීඨය තුළදී සිදුවිය.. මෙම මුල පිරීම මඟින් අපේක්ෂා කරන ලද්දේ ප්‍රමාණවත් නොවන අයුරින් ව්‍යාප්ත වී ඇති අධ්‍යයන ව්‍යුහය ශ්‍රී ලංකාවේ අනෙකුත් විශ්වවිද්‍යාලවල ප්‍රමාණයට හා විෂය පථයට සමගාමීව වැඩිදියුණු කිරීමයි.

තාක්ෂණ පීඨය, ජෛව ක්‍රියාවලි තාක්ෂණය, විද්‍යුත් හා ඉලෙක්ට්‍රෝනික තාක්ෂණය, ආහාර තාක්ෂණය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හා ද්‍රව්‍ය තාක්ෂණය යන අධ්‍යයනාංශ 05 කින් සමන්විත වන අතර ඒ එක් එක් අධ්‍යයනාංශය මඟින් උපාධි පාඨමාලා ප්‍රදානය කරනු ලබයි. ශ්‍රී ලංකා තත්ව රාමුව (SLQF) 04 ආකෘතියට සැකසුණු එම සෑම උපාධි පාඨමාලාවක්ම වසර 04 ක් පුරා විහිදේ. අ.පොෂ (උ.පෙළ) විභාගය තාක්ෂණ විෂය ධාරාවෙන් හදාරා විශ්වවිද්‍යාල සුදුසුකම් ලබන සිසුන් තාක්ෂණ පීඨය සඳහා බඳවාගන්නා අතර පළමු වසර සඳහා ඔවුන් ජෛව පද්ධති තාක්ෂණය, ඉංජිනේරු තාක්ෂණය හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ. ජෛව පද්ධති තාක්ෂණය හා ඉංජිනේරු තාක්ෂණය පළමු අධ්‍යයන වර්ෂය තුළදී හදාරන සිසුන් දෙවන අධ්‍යයන වර්ෂයේදී ජෛව සැකසුම් තාක්ෂණය, ආහාර තාක්ෂණය, විද්‍යුත් හා ඉලෙක්ට්‍රෝනික තාක්ෂණය, ද්‍රව්‍ය තාක්ෂණය යන අධ්‍යයනාංශ සඳහා සිසුන්ගේ කැමැත්ත, ඔවුන්ගේ අධ්‍යයන කාර්ය සාධනය, පවතින සම්පත් හා රැකියා වෙළඳපොළෙහි ඉල්ලුම මත වර්ග කරනු ලැබේ.

දැනට ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියෙහි ඇති උපාධි පාඨමාලා හා සන්සන්දනය කිරීමේ දී තාක්ෂණ උපාධි පාඨමාලා වඩාත් වෘත්තීමය වන අතර සිසුන්ගේ ශිල්පීය දක්ෂතා වැඩිදියුණු කිරීමෙහිලා වැඩි අවධානයක් යොමු කරනු ලබයි. එසේම ආයතනික/ වෘත්තීය හා කර්මාන්ත ආශ්‍රිත ක්‍රියාකාරකම් ආරම්භයේ සිටම විෂය මාලාවට ඇතුළත් කර තිබේ. මෙය ඉතා වටිනා අංශයක් වන අතර සියළුම සිසුන් කර්මාන්ත පුහුණුවක් සඳහා අනුයුක්ත විය යුතු අතරම සයමාසිකයක් පුරා දිවෙන පර්යේෂණ ව්‍යාපෘතියක් ද සම්පූර්ණ කළ යුතු වේ.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම මඟින් සපයනු ලබන අරමුදල් වලට අමතරව පීඨයේ යටිතල හා මානව සම්පත් සංවර්ධනය සඳහා ආසියානු සංවර්ධන බැංකුව (ADB) මඟින් ද මූල්‍ය අනුග්‍රහය සපයනු ලබයි. මේ වන විට පීඨය සඳහා අ.පොෂ (උ.පෙළ) තාක්ෂණ විෂය ධාරාව සමත් කණ්ඩායම් 05 කින් සිසුන් 1177ක් බඳවා ගෙන ඇති අතර ඉන් ජ්‍යෙෂ්ඨතම ශිෂ්‍ය කණ්ඩායම සිය විභාග අවශ්‍යතා සම්පූර්ණ කර උපාධි ප්‍රදානෝත්සවය සඳහා සූදානමින් සිටී. පීඨයේ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය 37 ක් වන අතර තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩලය 09 කි.

ආ. ජයග්‍රහණයන්

2021 වසරේ නොවැම්බර් මාසයේ දී ද්‍රව්‍ය තාක්ෂණ අධ්‍යයනාංශයට අයත් ඉංජිනේරු වැඩපල හා සෙරමික් නියමු බලාගාරය ඉදිකිරීම් අවසන් කර පීඨය සඳහා භාර ගන්නා ලදී. ඉංජිනේරු වැඩපල විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (Science and Technology Human Resources Development - STHRD) යටතේ මිලදී ගන්නා ලදී. නවීන State of art උපකරණ වලින් සමන්විත වේ. ගෝලීය වසංගතය හමුවේ ප්‍රමාද වී වුවද (අදියර II හා III) ගොඩනැගිලි වල ඉදිකිරීම් මේ වන විට සියු කෙරෙමින් පවති. විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (STHRD) යටතේ ඉදිවන ගොඩනැගිලි සංකීර්ණයෙහි ඉදිකිරීම් 2021 නොවැම්බර් මාසයේ දී ආරම්භ කළ අතර ඒ යටතේ ඉදිවන විද්‍යාගාර සංකීර්ණයේ ඉදිකිරීම් මාස 18 කදීත්, සම්පූර්ණ ඉදිකිරීම් කටයුතු මාස 30 කදීත් අවසන් කිරීමට සැලසුම් කර ඇත. 2015/2016 අධ්‍යයන වර්ෂ සඳහා බඳවා ගත් පීඨයේ පළමු ශිෂ්‍ය කණ්ඩායම සිය අධ්‍යයන කටයුතු සම්පූර්ණ කර 2022 වසරේ පැවැත්වෙන උපාධි ප්‍රදානෝත්සවයේ දී උපාධි ලබා ගැනීමට නියමිතය.

2016/2017 අධ්‍යයන වර්ෂ සඳහා බඳවා ගත් පීඨයේ දෙවන ශිෂ්‍ය කණ්ඩායම සිය කාර්මික පුහුණුව සම්පූර්ණ කළ අතර පීඨයේ පස්වන ශිෂ්‍ය කණ්ඩායම සඳහා (2019/2020 අධ්‍යයන වර්ෂය) සමාරම්භක උත්සවය සූම් තාක්ෂණය ඔස්සේ පවත්වන ලදී. කොවිඩ් වසංගතය හමුවේ අධ්‍යයන කටයුතු වැඩිවශයෙන් මාර්ගගත ක්‍රමය ඔස්සේ පවත්වන ලද අතර මේ වන විට ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා සිසුන් පීඨය වෙත භෞතිකව ගෙන්වනු ලබයි. පළමු වතාවට පීඨය මඟින් සියළුම සිසුන් සඳහා මාර්ගගත ක්‍රමයට විභාග වාර කිහිපයක් පවත්වන ලද අතර ඒ සඳහා විශේෂිත විභාග අතුරු ව්‍යවස්ථාවක් ද සම්පාදනය කරන ලදි.

විශ්වවිද්‍යාලයේ කොවිඩ් නිවාරණ කටයුතු සඳහා රු. මිලියන 25 ක අතිරේක ප්‍රදානයක් ආසියානු සංවර්ධන බැංකුව (ADB) මඟින් ලබා ගැනීමට පීඨය සමත් වූ අතර එමඟින් සියළුම පීඨ වල මාර්ගගත අධ්‍යයන කටයුතු

දිරිමත් කිරීම උදෙසා අවශ්‍ය උපකරණ ද මිලදී ගැනීමට හා සියළුම ශිෂ්‍ය නේවාසිකාගාර වලට උසස් පහසුකම් ලබා දීමට අවකාශ සැලසිණි.

ඔරකල් අධි ක්‍රියාකාරී පරිසනක ව්‍යාපෘතිය යටතේ ඇමරිකානු ඩොලර් 100,000 ක් වටිනා තරඟකාරී පර්යේෂණ ප්‍රදානයක් ලබාගැනීමට පෙව ක්‍රියාවලි තාක්ෂණ අධ්‍යයන අංශයට හැකි වී ඇත.

අධි ක්‍රියාකාරී පරිසනක සඳහා ප්‍රචලිත ''ඔරකල්'' නැමැති ඇමරිකානු බහුජාතික පරිගණක සමාගම මඟින් ඇමරිකානු ජනපද ඩොලර් 100,000 ක් වටිනා තරඟකාරී පර්යේෂණ ණය ප්‍රදානයක් හිමිකර ගැනීමට පෙව ක්‍රියාවලි තාක්ෂණ අධ්‍යයනාංශයට හැකි වී තිබේ. අධ්‍යයනාංශයේ පර්යේෂකයින් විසින් SCI පත්‍රිකා 18 ක්, ජාත්‍යන්තර පොත් පරිච්ඡේද 1ක් හා සංක්ෂිප්ත (abstracts) වාර්තා 05 ක් ප්‍රකාශයට පත් කර ඇත. 2021 සැප්තැම්බර් 24 සිට දෙසැම්බර් 24 දක්වා කාලයේ දී මැදවච්චිය සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී බලප්‍රදේශයේ ප්‍රජා සාමාජිකයින් 15 ක්, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් හා උපාධිධාරීන් 30 ක් හා 'සර්වෝදය' රාජ්‍ය නොවන සංවිධානයේ ස්වේච්ඡා සෞඛ්‍ය ප්‍රතිකාරක නිළධාරීන් 15 යුත් කණ්ඩායමක් සඳහා ත්‍රෙමාසික මාර්ගගත වැඩමුළුවක් ද අධ්‍යයනාංශය මඟින් පවත්වන ලදී. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ සහයෝගීතාවයෙන් ලෝක මදුරු වැඩසටහනේ Open call 2021 පිළිබඳව හඳුන්වාදීමේ වෙබිනාර් වැඩසටහනක් 2021 නොවැම්බර් මස 08 වන දින පෙ.ව. 10.00 සිට 10.30 දක්වා සූම් තාක්ෂණය ඔස්සේ පවත්වන ලදී. පෙව තාක්ෂණ අධ්‍යයනාංශය විසින් පහත සඳහන් උපකරණ විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (STHRD) යටතේ මිලදී ගෙන ඇත.

1. ප්‍රකාශ දියෝඩය සහිත අධික්‍රියාකාරී දියර වර්ණදේහක (UPLC with Photodiode)
2. ඩිජිටල් පොලිමරේස් දාම ප්‍රතික්‍රියාකාරකය (Digital PCR)
3. බහුජාල වැඩපොල පෙට්ටිය (Glove box workstation)
4. දියර සමජාතීකාරකය (Bead homogenized)
5. නැනෝ ඩ්‍රොප් (Nano drop)

විද්‍යුත් හා ඉලෙක්ට්‍රෝනික අධ්‍යයනාංශය විසින් ඉගැන්වීම් හා පර්යේෂණ කාර්යයන් සඳහා අවශ්‍ය වන දියුණු මට්ටමේ උපකරණ කිහිපයක් මිලදී ගන්නා ලද අතර වායුමය පුහුණු කට්ටලය, නවීනතම රොබෝ අත, විවිධ විද්‍යුත් පර්යේක්ෂණ යන්ත්‍ර, ධාවක හා විදුලි සංදේශ පුහුණු කට්ටලය ඒ අතර විය. විදුලි හා ඉලෙක්ට්‍රොනික අධ්‍යයනාංශයේ විෂයමාලාව සමාලෝචනය ප්‍රතීතන මාර්ගෝපදේශ අනුව සිදුකිරීමට අධ්‍යයනාංශය විසින් ජ්‍යෙෂ්ඨ උපදේශකවරයෙකු හා නියමු උපදේශකවරයකු පත් කරන ලදී.

විද්‍යුත් හා ඉලෙක්ට්‍රෝනික අධ්‍යයනාංශය විසින් ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ පිළිගැනීම අනුව ස්වයං ඇගයීම සම්පූර්ණ කර එම ඇගයීම් වාර්තාව ප්‍රතීතන උපදේශක වෙත භාර දෙන ලදී.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යයනාංශය අංශ කිහිපයක් යටතේ සාර්ථකත්වයට පත් වී තිබේ. පරිගණක ජාලකරණයට නව තොරතුරු තාක්ෂණ උපකරණ මිලදී ගැනීම ඒ අතර වන අතර එමගින් සිසුන්ට නවීන සන්නිවේදන උපකරණ භාවිතය සම්බන්ධව ප්‍රායෝගික පුහුණුවක් ලබා ගැනීමේ හැකියාවන් හිමිව ඇත. සිසුන් විසින් තොරතුරු තාක්ෂණය පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කරන ලද අතර කාර්මාන්තයන් හී ප්‍රවීනයන් විසින් එය මෙහෙයවනු ලැබීය. අධ්‍යයනාංශයේ විෂය මාලාව විශේෂඥ උපදේශකවරුන් දෙදෙනෙකු යටතේ මේ වන විට සමාලෝචනය වෙමින් පවතී. ඊට අදාළව අධ්‍යයනාංශය විසින් දේශකවරුන්, සිසුන් හා අදාළ බාහිර පාර්ශව සඳහා සැසි පවත්වන ලදී. ශ්‍රී ලංකා පරිගණක සමාජයේ මාර්ගෝපදේශයන් කෙරෙහි ද විෂයමාලාස සංවර්ධනයේදී අවධානය යොමු කෙරේ. එමෙන්ම විෂය මාලා නව්‍යකරණය කර්මාන්ත හා අධ්‍යයන ප්‍රමිතීන්ට අනුකූලව සිදු කෙරේ. දැනට ක්‍රියාත්මක විෂයමාලා සංශෝධනයේ කොටසක් ලෙස හා අධ්‍යයනාංශයේ සංවර්ධනය හා විෂයමාලා සංවර්ධනයට අදාළව සියළුම දේශකවරුන්ගේ අදහස් ලබා ගැනීමේ අරමුණින් සැසියක් පවත්වන ලදී.

ආහාර තාක්ෂණ අධ්‍යයනාංශය, විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ප්‍රධාන උපකරණ කිහිපයක් මිලදී ගෙන ඇත. වියමන විශ්ලේෂකය, පරාවර්තකමානය, දුස්ස්‍රාවිතාමානය,ජල ක්‍රියාකාරකම් මීටරය, ඖෂධ තැන්පත් කරන ශීතකරණය, අධිශීතකරණය සහ අවර්ත යන්ත්‍රය ඒ අතර විය. එමෙන්ම ආහාර තාක්ෂණ අධ්‍යයනාංශයේ ආචාර්යවරුන් විසින් 2022 වර්ෂය තුළදී ජර්නළ ලිපි 03 ක් ප්‍රකාශයට පත් කර ඇත.

2021 වසරේ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය වාර්ෂික පර්යේෂණ සමුළුව වන ISymRU, තාක්ෂණ පීඨය විසින් සංවිධානය කරන ලද අතර එම වසරේ සිට විශ්වවිද්‍යාලයේ වාර්ෂික පර්යේෂණ සමුළුව මෙම නමින් හැඳින්වීමට විශ්වවිද්‍යාලය තීරණය කරනලදි. කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් සමුළුව මාර්ගගත ක්‍රමවේදය

ඔස්සේ පවත්වන ලද අතර ලෝක ප්‍රසිද්ධ විද්‍යාඥයින් කිහිපදෙනෙකු ආරාධිත දේශකවරුන් ලෙස සහභාගී වූහ. මෙම සමුළුව සඳහා මූල්‍ය අනුග්‍රහය විශ්වවිද්‍යාල විසින් හා ආසියානු සංවර්ධන බැංකුව යටතේ වන විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය මඟින් ලබාදෙන ලදී.

විශ්වවිද්‍යාලයේ හොඳම පර්යේෂකයින් අගයනු වස් ප්‍රථම වරට විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සම්මාන උත්සවය හඳුන්වාදෙන ලද්දේ තාක්ෂණ පීඨයයි. විශ්වවිද්‍යාලයේ 25 වන සංවත්සරයට සමගාමී ව විශ්වවිද්‍යාලයේ සේවය කළ උපකුලපතිවරුන්ගේ සේවය ඇගයීම ද පර්යේෂණ සම්මාන උත්සවයේ දී සිදු කරන ලදී. උත්සවයේ ප්‍රධාන අමුත්තන් ලෙස කුලපති ස්වාමීන් වහන්සේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාවේ උපසභාපතිවරයා හා උපකුලපතිතුමිය සහභාගී වූ අතර උත්සවය සඳහා මූල්‍ය අනුග්‍රහය ආසියානු සංවර්ධන බැංකුව යටතේ වන විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය විසින් දරන ලදී.

ඇ. අසමර්ථයන් හා නිර්දෝෂිභාවය

කොවිඩ් 19 වසංගතය හේතුවෙන් අසාර්ථකවීම් කිහිපයක්ම සිදුවිය. සිසුන් හට වැඩි කාලයක් නිවෙස් වලට වී සිටීමට සිදුවීම නිසා ඉගැන්වීම් හා ඉගෙනුම් ක්‍රියාවලිය පූර්ණ වශයෙන්ම මාර්ගගත ක්‍රමවේදයට සිදුවිය. ප්‍රමාණවත් අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයක් නොමැති වීම නිසා ද අසාර්ථකවීම් සිදුවිය.

- ඒදිනෙදා කටයුතු ප්‍රමාද වීම.
- දුර්වල සම්පත් කළමනාකරණය.
- ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය වන දෑ විද්‍යාගාර තුළ නොමැති වීම නිසා ප්‍රායෝගික ක්‍රියාකාරකම් කළට වේලාවට කළ නොහැකිවීම.
- අධ්‍යයන කාර්ය මණ්ඩලයට වැඩි කාලයක් පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ කටයුතු සිදුකිරීම සඳහා යෙදවීමට සිදුවීම.
- අඵතෙන් පිහිටුවන ලද පීඨයක් වීම හේතුවෙන් කාර්යභාරයන් කළමණාකරනය කර ගැනීමට වර්තමාන කාර්ය මණ්ඩලය දැඩි වෙහෙසක් දැරීමට සිදු වී ඇති අතර ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැතිවීමට අමතරව ප්‍රමාණවත් විද්‍යාගාර හා කාර්යාල ඉඩකඩ නොමැතිවීම ද ගැටළුවක් වී ඇත.
- සිසුන් සඳහා ප්‍රමාණවත් නේවාසිකාගාර නොමැතිවීම ද ගැටළුවක් වී පවතී.
- ප්‍රමාණවත් ආපනශාලා නොමැතිවීම නිසා සිසුන්ට නියමිත වේලාවට දේශන වලට සහභාගී වීමට නොහැකිවීම.
- උපාධි පාඨමාලා නියමිත වේලාවට අවසන් කිරීමට අවශ්‍ය නිසා දේශන, ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා විභාග රාත්‍රී කාළයේදීත් පැවැත්වීමට සිදුවී ඇති අතර එවන් අවස්ථා වලදී දේශකවරුන් මෙන් ම සිසුන් ද නිසි ප්‍රවාහන පහසුකම් නොමැති වීම නිසා අපහසුතාවයන්ට මුහුණ දීමට සිදුවේ.

ඈ. අනාගත දැක්ම

යටිතල පහසුකම් සංවර්ධනය

ගොඩනැගිලි ඉදිකිරීම;

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාවේ මූල්‍ය ප්‍රතිපාදන මත ඉදිවන මහල් ගොඩනැගිල්ලේ දෙවන හා තෙවන අදියර ඉදිකිරීම් වර්ෂ 2022 අගෝස්තු මාසය වන විට නිමකිරීමට සැලසුම් කර ඇත
- ආසියානු සංවර්ධන අරමුදලේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ ඉදිවන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් 2021 වසරේ නොවැම්බර් මාසයේ දී ආරම්භ කළ අතර විද්‍යාගාර සංකීර්ණය 2023 අප්‍රේල් මාසයේ දීත් සම්පූර්ණ ව්‍යාපෘතිය 2024 වසරේ අප්‍රේල් මාසයේ දීත් නිම කිරීමට නියමිතය.

විෂයමාලා සංවර්ධනය

- සියළුම අධ්‍යයනාංශ වලට අදාළ විෂයමාලා සංවර්ධනය එහි අවසාන අදියර කරා ළඟා වී ඇති අතර 2022 වසර තුළ දී සම්පූර්ණ කිරීමට නියමිතය
- සියළුම උපාධි පාඨමාලා වලට අදාළ ස්වයං ඇගයීම් වාර්තා (SER) සම්පූර්ණ කර ඇති අතර විශේෂඥ අදහස් ලැබී තිබේ.
- ව්‍යාපාර ඉන්ක්‍යුබේටර දියත් කිරීම.
- පාර්ශවකරුවන්ගේ වාර්ෂික රැස්වීම හා කර්මාන්ත උපදේශන කමිටු රැස්වීම් සංවිධානය කිරීම.
- පශ්චාත් උපාධි වැඩසටහන්ද ආරම්භ කිරීම.

මානව සම්පත් සංවර්ධනය

- තාක්ෂණ උපාධි පාඨමාලාවට අදාළ විෂයන්හි විශේෂඥ දැනුම ඇති අය පීඨ සාමාජිකයින් ලෙස බඳවා ගැනීම.
- ආසියානු සංවර්ධන බැංකු මූල්‍ය සහයෝගය මත ආධුනික කථිකාචාර්යවරුන් පශ්චාත් උපාධි පාඨමාලා සඳහා යොමු කිරීම.
- නවීන තාක්ෂණය පිළිබඳව අධ්‍යයන කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමට හා පුහුණු කිරීමට වැඩමුළු පැවැත්වීම සඳහා විදේශ විශේෂඥයින්ට ආරධනා කිරීම.
- විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා කෙටිකාලීන පුහුණු පාඨමාලා සංවිධානය කිරීම.

23. පුස්තකාල පද්ධතිය

අ. හැඳින්වීම

පුස්තකාල ඉතිහාසය

1995 නොවැම්බර් 07 දිනැති අංක 896/2 දරණ ගැසට් නිවේදනය මඟින් 1978.08.16 දිනැති විශ්වවිද්‍යාල පනත ප්‍රකාරව ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය 1996 ජනවාරි 31 වන දින ස්ථාපිත කරන ලදි. ඒ, මධ්‍යම, උතුරුමැද හා වයඹ පළාත් අනුබද්ධ විශ්වවිද්‍යාල වල සම්පත් ඒකාබද්ධ කිරීමෙනි. රජරට විශ්වවිද්‍යාලයේ පුස්තකාල පද්ධතිය ආරම්භ කරන ලද්දේ 1996 සැප්තැම්බර් 02 වන දින වන අතර පළමු පුස්තකාලයාධිකාරීවරයා වූයේ මහාචාර්ය පියදාස රණසිංහ මහතාය. අනතුරුව කපිල ජයලාල් සිරිසේන මහතා, ගාමිණී ද සිල්වා මහතා, හේමා විජේතුංග මහත්මිය (සප්ත වාර්ෂික නිවාඩු මත 2007-2009 දක්වා) ධූරය හොබවන ලද අතර අශෝකා සිරිවර්ධන මහත්මිය 2013 වසරේ සිට පුස්තකාලයාධිකාරී ධූරය දරමින් සිටී.

පුස්තකාල පැතිකඩ (Library Profile)

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ හදවත වන්නේ එහි පුස්තකාලය වන අතර පුළුල් ව ව්‍යාප්ත වූ වෘක්ෂයක් පරිදි එය දැනුම එක්රැස් කිරීමේ, සංවිධානය කිරීමේ හා බෙදා හැරීමේ නියුක්තව සිටී. පුස්තකාලයෙහි පාඨක ප්‍රජාව උපාධි අපේෂක සිසුන්, පශ්චාත් උපාධිධාරීන්, අධ්‍යයන කාර්ය මණ්ඩලය, විධායක කාර්ය මණ්ඩලය හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය පමනක් නොව පර්යේෂකයින්ට හා ප්‍රදේශයේ බාහිර ප්‍රජාවද වන අතර එම ස්යළු දෙනා හට සිය සේවාවන් සපයනු ලබයි.

පීඨ පුස්තකාල

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පුස්තකාල පද්ධතිය ප්‍රධාන පුස්තකාලය හා විවිධ පරිශ්‍රයන්හි පිහිටා ඇති පීඨ පුස්තකාල 04කින් සමන්විත වන අතර ප්‍රධාන පුස්තකාලය, ව්‍යවහාරික විද්‍යා පීඨ පුස්තකාලය හා තාක්ෂණ පීඨ පුස්තකාලය මිහින්තලේ පරිශ්‍රයේ පිහිටා ඇත. ප්‍රධාන පුස්තකාලය මඟින් සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, කළමනාකරණ අධ්‍යයන පීඨය, ව්‍යවහාරික විද්‍යා පීඨය හා තාක්ෂණ පීඨය සඳහා පුස්තකාල සේවා සපයනු ලබයි. කෘෂිකර්ම පීඨ පුස්තකාලය පුලියන්කුලම පීඨ පරිශ්‍රයේත්, වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨ පුස්තකාලය සාලියපුර පරිශ්‍රයේත්, සායනික පුස්තකාලය අනුරාධපුර ශික්ෂණ රෝහල් පරිශ්‍රයේත් පිහිටා ඇත.

පුස්තකාල කාර්ය මණ්ඩලය

වර්තමාන පුස්තකාල කාර්ය මණ්ඩලය අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 07 දෙනෙක් පරිපාලන නිළධාරියෙකුගෙන් හා සහායක කාර්ය මණ්ඩල සාමාජිකයින් 38 දෙනෙකුගෙන් යුක්ත වේ.

පුස්තකාල එකතුව

ප්‍රධාන පුස්තකාලය, පෙළපොත්, ජර්නල සඟරා, පුවත්පත්, රජයේ ලිපිලේඛන, විශේෂ එකතු, විමර්ශන ද්‍රව්‍ය, පසුගිය ව්‍යාපෘති වාර්තා, පර්යේෂණ නිබන්ධන, පසුගිය ප්‍රශ්න පත්‍ර හා විද්‍යුත් සම්පත් (e- resources) වලින් සමන්විත වේ. මේ සියල්ලම විෂයමාලා වලට අනුකූලව සපයාගෙන ඇත. පුස්තකාල සම්පත් මුද්‍රිත හා විද්‍යුත් යන දෙයාකාරයෙන්ම සමන්විත වේ.

වෛද්‍ය විද්‍යාව, කෘෂිකර්මය, ව්‍යවහාරික විද්‍යාව, සමාජවිද්‍යාව, පරිගණක විද්‍යාව හා කළමනාකරණය යන විෂයන්හි සම්පූර්ණ පෙළ සහිත ලිපි සඳහා ප්‍රවේශ විය හැකි මාර්ගගත ජර්නල දත්ත සමුදායක් සේවය ශ්‍රී ලංකා අධ්‍යයන පුස්තකාල එකතුව (කෙන්සාල්) ඔස්සේ සපයනු ලබයි. පුස්තකාලය වර්තමානයේ දී ජර්නල සඟරා විශාල සංඛ්‍යාවක් සඳහා දායකත්වය දක්වන අතර එමඟින් පාඨකයින්ට නව ප්‍රවණතාවයන් යටතේ දැනුම යාවත් කාලීනව පවත්වා ගැනීමට උපකාරීවීම එහි අරමුණය. විවිධ විෂය ධාරා යටතේ වන පෙළපොත් හා සාමාන්‍ය දැනුම සඳහා වන පොත් විශ්වවිද්‍යාලයේ සියළුම පීඨයන්ට ගැලපෙනසේ රජරට විශ්වවිද්‍යාලයීය පුස්තකාලය සමන්විත වේ.

2021.12.31 දිනට පුස්තකාලයේ ඇති පොත් සංඛ්‍යා

ප්‍රධාන පුස්තකාලය	ව්‍යවහාරික විද්‍යා පුස්තකාලය	කෘෂිකර්ම පීඨ පුස්තකාලය	වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨ පුස්තකාලය	තාක්ෂණ පීඨ පුස්තකාලය	එකතුව
83430	14039	15220	10660	1708	125072

පවතින ඉලෙක්ට්‍රෝනික/ විද්‍යුත් සම්පත් හා දත්ත සමුදායන්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම අනුග්‍රහය දක්වන ශ්‍රී ලංකා ශාස්ත්‍රීය පුස්තකාල සංගමය (කොන්සාල්) මඟින් ප්‍රවේශ විය හැකි එමරල්ඩ්, ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලය මුද්‍රණාලය, ටේලර් සහ ෆැන්සිස් පුස්තකාල දත්ත සමුදායන් සඳහා දායකත්වය සපයයි.

පුස්තකාලයේ ප්‍රධාන සේවා

බැහැර දෙන සේවා, විමර්ශන සේවා, පුස්තකාල (අභ්‍යන්තර) අතර හුවමාරු පද්ධති, කාලීන දැනුවත් කිරීමේ වැඩසටහන්, තොරතුරු සාක්ෂරතා වැඩසටහන්, පරිශීලක අධ්‍යාපන වැඩසටහන්, වැඩමුළු හා පුස්තකාල වෙබ් අඩවි නඩත්තුව යනාදිය පුස්තකාලයේ ප්‍රධාන සේවාවන් අතර වේ. මාර්ගගත සම්පත් සඳහා ප්‍රවේශ වීමට වැදගත් වන සබඳතා මාර්ග සපයා දීමද පුස්තකාල වෙබ් අඩවිය මඟින් සිදුකෙරේ. මාර්ගගත පොදු ප්‍රවේශ නාමාවලිය (ඔපැක්) ඔස්සේ පුස්තකාල නාමාවලියට පිවිසිය හැක. විශ්වවිද්‍යාලයේ පර්යේක්ෂණ වාර්තා සහ ලිපි එකතුව පුස්තකාලය මඟින් නඩත්තු කෙරේ. අන්තර්ජාලය ඔස්සේ පරිශීලකයින්ට පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර සඳහා පිවිසිය හැක. පුස්තකාලය උතුරුමැද පළාත සඳහා ප්‍රජා ව්‍යාප්ති වැඩසටහන් ද සම්පාදනය කරයි. පාසල් හා මහජන පුස්තකාල කාර්යක්ෂම ආකාරයෙන් නැවත සකස් කිරීම, පොත් ප්‍රදානයන්, පාසල් හා මහජන පුස්තකාල කාර්යමණ්ඩල සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම ඒ අතරවේ.

2021.12.31 දිනට පුස්තකාලයේ සාමාජික සංඛ්‍යා

	ප්‍රධාන පුස්තකාලය	ව්‍යවහාරික විද්‍යා පීඨ පුස්තකාලය	කෘෂිකර්ම පීඨ පුස්තකාලය	වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨ පුස්තකාලය	තාක්ෂණ පීඨ පීඨ පුස්තකාලය	එකතුව
පශ්චාත් උපාධිධාරීන්	00	00	00	00	00	00
උපාධි අපේක්ෂකයින්	6117	1418	1119	1789	1014	11457
අධ්‍යයන කාර්ය මණ්ඩල	384	109	81	48	11	633
තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩල	37	63	60	00	14	174
පරිපාලන නිළධාරීන්	22	01	05	06	00	34
අනධ්‍යයන කාර්ය මණ්ඩල	408	29	59	55	03	554

- **ස්වයංක්‍රීය පුස්තකාල සේවා සැපයීම**

දැනට පවතින පුස්තකාල තොරතුරු දත්ත සමුදාය කළමනාකරණ පද්ධතිය ''කොහා'' විවෘත කේත මෘදුකාංගය මඟින් සාර්ථක ලෙස ස්වයංක්‍රීයකරණය කර ඇත. රජරට විශ්වවිද්‍යාලයේ පුස්තකාල පද්ධතිය ''කොහා'' විවෘත කේත මෘදුකාංගය හා භාවිතා කර පොත් සංසරණය ඇනවුම් කිරීම, අයවැයකරණය, ප්‍රවේශවීම, සංඛ්‍යාලේඛන ලබාගැනීම, යෝජනා ඉදිරිපත් කිරීම සහ භාවිතා කරන පරිශීලකයින්ට පුස්තකාල නාමාවලිය මාර්ගගත ක්‍රමය ඔස්සේ සෙවීම වැනි කටයුතු සිදු කල හැකිය. පුස්තකාලය එහි පරිශීලකයින්ට නවීන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කර දුරස්ථ ව ප්‍රවේශවීමේ අවස්ථාව ලබා දෙයි.

- **ආයතනික පර්යේක්ෂණ ලිපි සහ වාර්තා එකතුව**

ආයතනික පර්යේක්ෂණ ලිපි සහ වාර්තා එකතුව යනු විශ්වවිද්‍යාලයේ පර්යේෂණ හා සොයාගැනීම් පිළිබඳ වාර්තා හා ලිපි මාර්ගගත එකතුවක් ලෙස පවත්වාගෙන යාමයි. එය විශ්වවිද්‍යාලයේ පර්යේෂණ නිමවුම් සඳහා ප්‍රවේශවීම හා දෘෂ්‍යතාවය වර්ධනය කිරීම කෙරෙහි වැදගත් වන අතර උපුටාගැනීම් අනුපාතය හා විශ්වවිද්‍යාලයේ ශ්‍රේණිගත කිරීම ඉහළ නැංවීමට බලපායි. එය ප්‍රකාශන 3000කට අධික සංඛ්‍යාවක් සහ සම්පූර්ණ ලිපි වලින් සමන්විත වේ.

- **පසුගිය ප්‍රශ්ණ පත්‍ර සඳහා ඉන්ට්‍රානෙට් පිවිසුම් පහසුකම්**

ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය මගින් පවත්වනු ලබන අභ්‍යන්තර විභාග වල පසුගිය ප්‍රශ්නපත්‍ර පරිගණකගත කොට ඉන්ට්‍රානෙට් ඔස්සේ පාඨකයන්ට බාගත කර ගැනීමට හැකියාව ලබා දී ඇත. එම නිසා පාඨකයන්ගේ අවශ්‍යතාවය මත පසුගිය ප්‍රශ්ණ පත්‍ර සඳහා ප්‍රවේශ වීමට මෙන්ම හුවමාරු කර ගැනීමටද අවස්ථාව සැලසේ.

- **තෝරාගත් තොරතුරු සේවාව සහ පර්යේෂණ පහසුකම් සැපයීම**

තෝරාගත් තොරතුරු සේවාව භාවිතා කරමින් පරිශීලකයින්ට ඔවුන්ගේ නිශ්චිත තොරතුරු අවශ්‍යතා සඳහා තොරතුරු රිසිකරණය කළ හැකිය. වර්තමාන දැනුවත් කිරීමේ සේවාවන් නව මාතෘකා සහ ඔවුන්ගේ නිශ්චිත පර්යේක්ෂණ අවශ්‍යතා සඳහා තොරතුරු විද්‍යුත් තැපෑලෙන්, වාචිකව සහ දැන්වීම් මගින් දැනුම් දෙනු ඇත. පුස්තකාලය පරිශීලකයින්ට ඔවුන්ගේ පර්යේක්ෂණ කටයුතු සිදු කිරීමට සහ ඔවුන්ගේ පර්යේක්ෂණ කටයුතු සහ අඛණ්ඩ ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය තොරතුරු විද්‍යුත් තැපෑලෙන් සහ වෙනත් ක්‍රම මගින් ලබා දීමට සහය වේ.

- **ශ්‍රව්‍ය හා දෘශ්‍ය සම්පත් සේවාව සහ වයි-ෆයි ප්‍රවේශයන්**

විද්‍යුත් පහසුකම් සැපයීමේ ඒකකය මගින් පරිශීලකයන්හට ඉලෙක්ට්‍රොණික දත්ත සමුදායන් වෙත පිවිසිම, අන්තර්ජාල පහසුකම් සහ සංයුක්ත තැටි වැනි සේවාවන් සපයනු ලබයි. මෙම ඒකක යසතුව පරිගණක යන්ත්‍ර කිහිපයක් පවතින අතර පරිශීලකයන්ට තොරතුරු සෙවීම, බාගත කිරීම සහ හුවමාරු කර ගැනීම සිදු කල හැකිය. එමෙන්ම ඔවුන්ට නොමිලේ ශාස්ත්‍රීය සම්පූර්ණ ප්‍රකාශණ වාර්තා වලට පිවිසීමේ හැකියාවද ලැබේ. මෙම ඒකකය මගින් පුස්තකාලය සතු සියලුම ඉලෙක්ට්‍රෝණික මූලාශ්‍ර සඳහා පහසුවෙන් පිවිසිය හැක. මෙම ඒකකය වයි-ෆයි පරිශීලන කළාපයකින් සමන්විත වන අතර සිසුන්ගේ පුද්ගලික ලැප්ටොප් පරිගණක, අයිපෑඩ්, ස්මාර්ට් දුරකතන වැනි උපාංග භාවිතයෙන් ඉලෙක්ට්‍රෝණික තොරතුරු සඳහා පිවිසිය හැක.

- **ඡායා පිටපත් කිරීමේ පහසුකම් (පුද්ගලික)**

පුස්තකාලය පරිශීලකයින්ට ඡායා පිටපත් ලබා ගැනීමේ පහසුකම් සලසනු ලැබේ. පර්යේෂණ වාර්තා හැර සෙසු තොරතුරු පාඨකයන් හට ඡායා පිටපත් ලබා ගත හැකිය. පොත්පත් ස්කෑන් කිරීමේ සහ පොත් බැඳීමේ පහසුකම්ද මෙම ඒකකය මගින් සපයනු ලබයි.

- **පුවත්පත් ලිපි එකතු කිරීමේ සේවාව**

පුස්තකාලය මගින් විෂයන් මාලාවක් සඳහා පුවත්පත් ලිපි එකතුවන් පවත්වාගෙන යනු ලැබේ. මෙම පුවත්පත් ලිපි ස්කෑන් කොට ඩිජිටල් ආකාරයට පරිවර්තනය කොට පවත්වාගෙන යෑමට පුස්තකාලය බලාපොරොත්තු වේ. එවිට දෛනික තොරතුරු සඳහා පිවිසිමට, බාගත කර ගැනීමට සහ හුවමාරු කර ගැනීමට පරිශීලකයින්ට පහසු වේ.

ආ. ජයග්‍රහණ

- **පරිශීලකයින් දැනුවත් කිරීමේ වැඩසටහන**

  කළමනාකරණ අධ්‍යයන පීඨයේ, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨයේ, කෘෂිකර්ම පීඨයේ, ව්‍යවහාරික විද්‍යා පීඨයේ හා තාක්ෂණ විද්‍යා පීඨයේ සිසුන් උදෙසා පුස්තකාල නම්නීකරණ වැඩසටහන් 06 ක් පවත්වන ලදී. කොවිඩ් 19 වසංගත ව්‍යාප්තිය හේතුවෙන් සූම් තාක්ෂණය ඔස්සේ දැනුවත් කිරීමේ වැඩසටහන් 33 ක් පවත්වන ලදී.

- **ලිපි ලේඛන මාර්ගගත ක්‍රමය ඔස්සේ බෙදාහැරීමේ සේවාව**

  කොවිඩ් 19 වසංගත ව්‍යාප්තිය හේතුවෙන් ලිපිලේඛන මාර්ගගත ක්‍රමය ඔස්සේ බෙදා හැරීමට ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පුස්තකාල පද්ධතිය ආරම්භ කළේය. වසංගත ව්‍යාප්තිය මධ්‍යයේ වුව ද පරිශීලකයින්ගේ ඉල්ලීම පරිදි පුස්තකාල ද්‍රව්‍ය විද්‍යුත් තැපෑල හරහා ලබා දෙන ලද්දේ ඔවුන්ගේ කියවීමේ පරිචය අඛණ්ඩව පවත්වාගෙනයාමට දක්වන රුකුලක් වශයෙනි. වර්ෂය තුළදී ලේඛන 4000 ක් මෙසේ බෙදා හැර ඇත.

- **මාර්ගගත ලියාපදිංචිය**

  කොවිඩ් 19 වසංගතය හේතුවෙන් පරිශීලකයින් මාර්ගගත ක්‍රමය ඔස්සේ ලියාපදිංචි කිරීම පුස්තකාලය විසින් හඳුන්වා දුන් අතර 2019 අධ්‍යයන වර්ෂයට අදාළ කළමනාකරණ අධ්‍යයන පීඨ ශිෂ්‍ය කණ්ඩායම සාර්ථක ලෙස ලියාපදිංචි කර ඇත.

- **මාර්ගගත නිරවුල් කිරීම**

  වසංගත තත්ත්වය හේතුවෙන් මාර්ගගත නිරවුල් කිරීමේ ක්‍රමය පුස්තකාලය විසින් හඳුන්වා දුන් අතර කළමනාකරණ අධ්‍යයන පීඨයේ 2014/2015 ශිෂ්‍ය කණ්ඩායම සාර්ථක ලෙස නිරවුල් කරන ලදී.

- **වසංගතය මධ්‍යයේ කටයුතු කිරීම සඳහා කාර්ය මණ්ඩලය පුහුණු කිරීම**

  නවීන තාක්ෂණය උපයෝගී කරගනිමින් වසංගතය හමුවේ කටයුතු කිරීමේ හැකියාව හා ආකල්ප සංවර්ධනය කිරීම උදෙසා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කෙරිණි.

- **ප්‍රජා ව්‍යාප්ති කටයුතු**

  ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පුස්තකාල පද්ධතිය මඟින් ප්‍රදේශයේ මහජන පුස්තකාලයාධිකාරීවරුන්ට, මහජන පුස්තකාල වෘත්තිකයින්ට, පාසල් පුස්තකාලයාධිකාරීවරුන්ට සහා පිරිවෙන් පුස්තකාලයාධිකාරීවරුන්ට පුස්තකාල සහ තොරතුරු විද්‍යා ක්ෂේත්‍ර පිළිබඳ වැඩමුළු සහ සම්මන්ත්‍රණ ආවර්ජිතව සංවිධානය කරන ලදි.

- **පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර බෙදාහැරීමේ මාර්ගගත ක්‍රමය**

  විශ්වවිද්‍යාලයේ ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය සඳහා පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර ඇතුළත් කරන අතර කොවිඩ් 19 තත්ත්වය හමුවේ සිසුන් විශ්වවිද්‍යාලට නොපැමිණිය ද ඔවුනට පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර වලට පිවිසීමට හැකියාව මෙමඟින් ලබා දුනි.

ඇ. අසමර්ථතා හා සාධාරණීකරණයන්

- විද්‍යුත්/ඉලෙක්ට්‍රෝනික සම්පත් හිඟවීම.
- මාර්ගගතක්‍රමවේදය ඔස්සේ සේවා සැපයීමට ප්‍රමාණවත් පරිගණක නොමැතිවීම
- සම්පත් මිලදී ගැනීම සඳහා ප්‍රමාණවත් අරමුදල් නොමැතිවීම
- කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් පරිශීලකයින්ගේ අමතර කියවීමේ පරිචය කැපී පෙනෙන ලෙස හීනවී තිබීම

ඈ. අනාගත සැලසුම්

- **ඩිජිටල් පුස්තකාලය**

  පොත් පරිච්ඡේද ඩිජිටල් ආකෘතියෙන් රැස්කර තබාගැනීමට හැකි ඩිජිටල් පුස්තකාලයක් නිර්මාණය කර අභ්‍යන්තර ජාලය ඔස්සේ පිවිසිය හැකි ලෙස සකස් කිරීමට විශ්වවිද්‍යාලයේ පුස්තකාල පද්ධතිය අපේක්ෂා කරයි. ඩීස්පේස් විවෘත මෘදුකාංගය මේ සඳහා භාවිතා කිරීමට නියමිතය. ස්කෑන් කොට මාර්ගගත ක්‍රම වේදය ඔස්සේ බෙදාහැරින ලද සියළුම තොරතුරු මේ ඔස්සේ ලබාගැනීමට සිසුන්ට මෙන් ම කාර්යමණ්ඩලයටද හැකියාව පවතී.

- **ටර්නිටින් සාහිත්‍ය චෞර්යය මෘදුකාංගය හඳුන්වා දීම**

  අධ්‍යයන කාර්යමණ්ඩලයේ සුභසිද්ධිය උදෙසා හා බුද්ධිමය වෙළඳපොලෙහි ඇති ආන්තික කාර්යභාරය සළකා විශ්වවිද්‍යාලයේ පුස්තකාල පද්ධතිය ර්නිටින් සාහිත්‍ය චෞර්යය මෘදුකාංගය හඳුන්වාදීමට සැලසුම් කරමින් සිටී. මූලික අදියරේදී සියළුම ස්ථීර අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් සඳහා හඳුන්වා දීමේ ගිණුම් ආරම්භ කිරීමටත්, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය සඳහා ශාස්ත්‍රීය ලේඛන කොල්ලකෑම පිළිබඳ ප්‍රතිපත්තියක් සංවර්ධනය කිරීමට අපේක්ෂා කරයි.

- **කතෘ ඒකකයක් ස්ථාපිත කිරීම.**

  විශ්වවිද්‍යාල ප්‍රජාවගේ පර්යේෂණ කටයුතු සඳහා පහසුකම් සැපයීමට හැකිවන පරිදි කතෘ ඒකකයක් විශ්වවිද්‍යාල පරිශ්‍රය තුල ස්ථාපිත කිරීමට පුස්තකාලය සැලසුම් කරමින් සිටී.

- **ආයතනගත පුහුණු වැඩසටහන්**

  පුස්තකාල කාර්යමණ්ඩල සඳහා ආයතනගත පුහුණු වැඩසටහන් පැවැත්වීමට පුස්තකාලය අදහස් කරන අතර ඒ සඳහා සම්පත්දායකයින් ලෙස පුස්තකාල අධ්‍යයන කාර්යමණ්ඩලය කටයුතු කරයි.

- **සිසුන් සඳහා දුරස්ථ ප්‍රවේශ (Remote access) පහසුකම**

සියළුම සිසුන් සඳහා දුරස්ථ ප්‍රවේශ ගිණුම් සපයාදී මාර්ගගත දත්ත පද්ධති සඳහා දුරස්ථව ප්‍රවේශවීමේ හැකියාව ලබා දීමට එමඟින් පුස්තකාල පද්ධතිය සැලසුම් කරයි.

- **ආයතනික සමාජ වගකීම් සඳහා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම**
  පුස්තකාලය තුළ ආයතනික සමාජ වගකීම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට සඳලසුම් කර ඇති අතර පවත්වන ලද ආයතනික සමාජ වගකීම ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු එකතු කිරීම සහ පවත්වාගෙන යාම මෙහි ප්‍රදාන කර්තව්‍ය වේ.

2021 වසරේ කාර්ය සාධන වාර්තාව

01 කොවිඩ් 19 වසංගත ව්‍යාප්තිය පැවති කාළය තුළ මාර්ගගත පුස්තකාල සේවාව මඟින් ඉගෙනුම් හා ඉගැන්වීම්
ක්‍රියාවලිය සඳහා කැපී පෙනෙන සේවාවක් සිදුවිය.

02. ඩිජිටල් ප්‍රදර්ශන පැනල සකස් කර එමඟින් කාලීන ප්‍රවණතා, නව පැමිණීම්, කාලීන අන්තර්ගතයන්, නිති හා රෙගුලාසී හා අතිරේක නවීන තොරතුරු පිළිබඳව සිසුන් දැනුවත් කිරීම සිදුකෙරිනි. එම තොරතුරු ආශ්‍රයෙන් ඒදිනෙදා තොරතුරු අන්තර්ජාලය ඔස්සේ සොයා යෑමට සිසුන්ට හැකි වේ.

04. පුස්තකාල පද්ධතිය විසින් ජාල පුස්තකාල අතර ණය ක්‍රම වේදයක් ක්‍රියාත්මක කෙරේ.

05. පුස්තකාල පරිශ්ය තුල Wi-fi කලාපයක ස්තාපනය කර තිබේ.

06. අධ්‍යන කාර්ය මණ්ඩලය සඳහා දුරස්ථ ප්‍රවේශ පහසුකම සැපයීම මඟින් මාර්ග ගත සම්පත් සඳහා ප්‍රවේශය පහසු කොට තිබේ.

24. ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අ. හැඳින්වීම

ශාරීරික අධ්‍යයන දෙපාර්තමේන්තුව මඟින් විශ්වවිද්‍යාලයීය සිසු ප්‍රජාවට පුළුල් පරාසයක විහිදුණු ක්‍රීඩා හා විනෝදාස්වාද වැඩ සටහන් සඳහා අවස්ථා සපයනු ලැබේ. ශාරීරික අධ්‍යාපන අංශයේ මූලික අරමුණ වනුයේ සිසුන්ගේ ක්‍රීඩා කුසලතා වැඩි දියුණු කිරීම හා ප්‍රවර්ධනය කිරීම සහ ඒකල හා කණ්ඩායම් ක්‍රීඩා කුසලතා සංවර්ධනය සඳහා අවස්ථා සලසා දීම තුළින් ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයිය සිසු ප්‍රජාව සෞඛ්‍ය සම්පන්න ක්‍රියාකාරී ජීවන රටාවක් සඳහා හුරුපුරුදු කිරීමය.

ආ. ජයග්‍රහණයන්

ඉහත අරමුණු ලඟාකර ගැනීම සඳහා ශාරීරික අධ්‍යාපන අංශය වෙනත් වසරවලදී බොහෝ ක්‍රියාකාරකම් සහ වැඩසටහන් සංවිධානය කර පවත්වන ලදි. නමුත් 2021 වසරේදි කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් කිසිදු ක්‍රීඩා කටයුක්තක් විශ්වවිද්‍යාලය තුල පැවැත්වීමට නොහැකි විය. කෙසේ වුවද අපගේ ශිෂ්‍යයින් අන්තර් විශ්වවිද්‍යාල කරාටේ සහ චෙස් (අතථ්‍ය) තරඟාවලි සඳහා සහභාගි විය.

අන්තර් විශ්වවිද්‍යාල මාර්ගගත කරාටේ ශූරතාවලිය 2021

පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් ප්‍රථම වරට සංවිධානය කරන ලද අන්තර් විශ්වවිද්‍යාල කරාටේ අතථ්‍ය ශූරතාවලිය වර්ෂ 2021 නොවැම්බර් මස 18 සිට 26 දක්වා පැවැත්විණි. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයිය ක්‍රීඩා සංගමය විසින් ඒ සඳහා අනුග්‍රහය දක්වන ලදි. මෙම ශූරතාවලිය සඳහා ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් ක්‍රීඩකයින් 07 දෙනෙකු සහ ක්‍රීඩිකාවන් 04 දෙනෙකු සහභාගි විය. කරාටේ කාන්තා ශූරතාවලියේදී ''ජ්‍යෙෂ්ඨ කාන්තා කාතා 4වන මට්ටම'' තරඟයේ රන් පදක්කම කළමනාකරණ අධ්‍යන පීඨයේ එන්. පී. ජයලත් විසින් ලබා ගත් අතර තරඟාවලියේ තෙවැනි අනුශූරතාවය ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය ලබා ගැනීමට සමත් විය.

අන්තර් විශ්වවිද්‍යාලයීය මාර්ගගත චෙස් ශූරතාවලිය 2021

පළමු වැනි අන්තර් විශ්වවිද්‍යාලයීය අතථ්‍ය චෙස් ශූරතාවලිය - 2021 ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමය විසින් මොරටුව විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා චෙස් සම්මේලනය සමඟ එක්ව වර්ෂ 2021 නොවැම්බර් මස 6 සහ 7 යන දිනවල සංවිධානය කරන ලදි. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල 14ක් නියෝජනයෙන් කණ්ඩායම් 28ක (බාලක 14 සහ බාලිකා 14) සහභාගිත්වයෙන් මෙම ඉසව්ව පැවැත්විණි. එම තරඟාවලියේ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය කණ්ඩායම් විශිෂ්ඨ දක්ෂතාවයන් දක්වන ලදි.

ජාත්‍යන්තර විශ්වවිද්‍යාල ක්‍රීඩා දිනය - 2021

එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යා හා සංස්කෘතික සංවිධානය විසින් ජාත්‍යන්තර විශ්වවිද්‍යාල ක්‍රීඩා දිනය 2016 වසරේ සිට නිල වශයෙන් ප්‍රකාශයට පත්කරන ලදි. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමය දෙවන වරටත් ජාත්‍යන්තර විශ්වවිදාල ක්‍රීඩා දිනය ශ්‍රී ලංකාවේදි සැමරීම සඳහා උත්සවයක් වර්ෂ 2021 සැප්තැම්බර් මස 19 සහ 20 යන දින වල අතථ්‍ය ලෙස සංවිධානය කරන ලදි. මෙම උත්සවය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්දන උඩවත්ත මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත් වූ අතර ශ්‍රී ලංකා රජරට විශ්වවිදාලය නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 70ක් මෙම වැඩසටහන සඳහා සහභාගි විය.

විශ්වවිද්‍යාලයේ ශාරීරික අධ්‍යාපනය සහ ක්‍රීඩා පිළිබඳ හඳුන්වා දීමේ වැඩසටහනක් කළමනාකරණ අධ්‍යයන පීඨය, තාක්ෂණ පීඨය සහ කෘෂිකර්ම පීඨයේ පළමු වසර සිසුන් සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ සංවිධානය කරන ලදි.

ශ්‍රී ලංකා ඔලිම්පික් කමිටුව විසින් පවත්වන ලද ඔලිම්පික් ඇකඩමි සැසිවාරය සඳහා එම්. වී. එස්. සුභාෂණ සහ ඊ. ඩබ්ලිව්. එම්. එම්. විතාරණගේ යන අය පිලිවෙලින් කළමනාකරණ අධ්‍යන පීඨය සහ තාක්ෂණ පීඨය නියෝජනයෙන් සහභාගි විය

වෙනත් තොරතුරු

- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීමේදි 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමයේ උපසභාපතිවරයා ලෙස ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වන එස්. යූ. විජේසිංහ මහතා පත් කරන ලදි.
- ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ශාරීරික අධ්‍යාපන උපදේශක එස්. කේ. රණසිංහ මහත්මිය, ශ්‍රී ලංකා හොකී සම්මේලනයේ කාන්තා කමිටුවේ සාමාජිකාවක් ලෙස මහ සභා රැස්වීමේදි පත් කරන ලදි.
- ශාරීරික අධ්‍යාපනය පිළිබඳ උපදේශක, ඒ. ටී. පී. කුමාර මහතා වර්ෂ 2021 මැයි 20වැනි දින පැවැත්වූ ශ්‍රී ලංකා ක්‍රිකට් 60 වැනි වාර්ෂික මහ සභා රැස්වීම සඳහා අතථ්‍ය ලෙස සහභාගි විය.
- ශ්‍රී ලංකා බර ඉසිලීමේ සම්මේලනයේ වාර්ෂික මහ සභා රැස්වීම වර්ෂ 2021 ජුනි 29 වැනි දින පවත්වන ලද අතර ඒ සඳහා එස්. ජී. එස්. වික්‍රමනායක සහ ඒ. ටී. පී. කුමාර යන මහත්වරු සහභාගි විය.

- මෙම වසරේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පවත්වන ලද ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන ස්ථාවර කමිටු රැස්වීම් දෙකකට ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය සහභාගි විය.

ඇ. අසමර්ථයන් හා නිර්දෝෂිභාවය

- 2021 වර්ෂය සඳහා පැවැත්වීමට නියමිතව තිබූ කායික ක්‍රීඩා වැඩසටහන් කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් පැවැත්වීමට නොහැකි විය.
- අන්තර් විශ්වවිද්‍යාල තරඟාවලි සහ ආරාධිත තරඟාවලි කිසිවක් සංවිධානය කිරීමට නොහැකි විය.
- මෙම වර්ෂයේදී ගෘහස්ථ ක්‍රීඩාංගනයේ අදියර III ඉදිකිරීමේ කටයුතු සම්පූර්ණ කිරීමට නොහැකි විය

ඈ. අනාගත දැක්ම

- 2022 වසරේ අන්තර් විශ්වවිද්‍යාල තරඟාවලි දෙකක් සංවිධානය කිරීමට බලාපොරොත්තුවේ.
- 2022 වර්ෂයේදි ගෘහස්ථ ක්‍රීඩාංගනයේ අදියර III ඉදිකිරීමේ කටයුතු සම්පූර්ණ කිරීමට බලාපොරොත්තුවේ.

25. වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය

අ. හැඳින්වීම

අධ්‍යක්ෂක

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II වන ශ්‍රේණිය, ආචාර්ය එච්. ඕ. විජේවර්ධන මිය

වෘත්තීය මාර්ගෝපදේශක

ඒ. මංගලිකා දිසානායක මහත්මිය – AS 2 (II)
ජේ. ඩී. රත්නායක මහතා – AS 2 (II)

වෘත්තීය මාර්ගෝපදේශන සම්බන්ධීකාරක

වෘත්තීය මාර්ගෝපදේශන අංශය සහ පීඨයන් අතර වෘත්තීමය මාර්ගෝපදේශන කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා සෑම පීඨයකින්ම එක් අයෙකු වශයෙන් වෘත්තීය මාර්ගෝපදේශන සම්බන්ධීකාරක වරුන් පස් දෙනෙකු පත් කර ඇති අතර කළමනාකරණ සහකාර සහ වැඩ සහායක වශයෙන් සහායක කාර්ය මණ්ඩල සහභාගිත්වයෙන් දෙදෙනෙකු ඇත.

ආ. ජයග්‍රහණයන්

01. ''කැණිමඩල'' වැඩමුළුව පැවැත්වීම

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය මගින් අනධ්‍යන කාර්ය මණ්ඩලය සඳහා වූ ''කැණිමඩල'' වැඩසටහන 2021 මාර්තු මස 19, 29 සහ 30 යන දිනයන්හි පෙ.ව 09.00 සිට ප.ව.12.00 දක්වා වෘත්තීය මාර්ගෝපදේශ ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදි. මෙම වැඩමුළුව වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයෙහි උපදේශිකා මංගලිකා දිසානායක මහත්මිය සහ උපදේශක ජේ. ඩී. රත්නායක මහතා විසින් මෙහෙයවන ලදි.

02. ''කර්මාන්ත ප්‍රවීනයන්'' මැයෙන් වෙබිනර් වැඩසටහන පැවැත්වීම.

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වාත්තීය මාරගෝපදේශන ඒකකය විවිධ කර්මාන්තවල ප්‍රවීණයන් සම්බන්ධ කර ගනිමින් වෙබිනර් (සුම් තාක්ෂණයෙන්) වැඩසටහන් 20ක් සාර්ථකව පවත්වන ලදි.

03. උපාධි අපේක්ෂකයින් සඳහා ''ජීවන කුසලතා'' පිළිබඳ වැඩසටහන

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් ''උපාධි අපේක්ෂකයින් සඳහා ජීවන කුසලතා'' මැයෙන් වැඩසටහන් 10ක් සුම් තාක්ෂණය ඔස්සේ සාර්ථකව පවත්වන ලදි. මෙම වැඩමුළු වාත්තීය මාර්ගෝපදේහ ඒකකයෙහි උපදේශිකා මංගලිකා දිසානායක මහත්මිය විසින් මෙහෙයවන ලදි.

04. ''ඉගෙනීමේ කුසලතා'' පිළිබඳ වැඩසටහන

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් කළමනාකරණ අධ්‍යයන පීඨයේ උපාධි අපේක්ෂකයින් සඳහා ''ඉගෙනීමේ කුසලතා'' පිළිබඳ වැඩසටන් දෙකක් සූම් තාක්ෂණය හරහා සාර්ථකව පවත්වන ලදි. මෙම වැඩසටහන වාත්තීය මාර්ගෝපදේශ ඒකකයෙහි උපදේශිකා මංගලිකා දිසානායක මහත්මිය විසින් මෙහෙයවන ලදි.

05. ප්‍රජා සමාජ ආරම්භ කිරීම

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් උපාධි අපේක්ෂකයින් සඳහා ප්‍රජා සමාජ දෙකක් ආරම්භ කරන ලදි. උපාධි අපේක්ෂකයින්ගේ පොදු කථන කුසලතා වැඩි දියුණු කිරීමේ අරමුණින් ග්‍රෙවල් සමාජය ආරම්භ කරන ලද අතර රොට්රැක්ට් සමාජය ආරම්භ කිරීමෙන් උපාධි අපේක්ෂකයින්ගේ නායකත්ව කුසලතා වැඩි දියුණු කිරීම අරමුණු විය.

06. වෘත්තීය සංවර්ධන වැඩසටහන්

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ වෘත්තීය මාර්ගෝපදේශක වරුන් විසින් සූම් තාක්ෂණය හරහා වෘත්තීය සංවර්ධන පාඨමාලා තුනක් කෘෂිකර්ම පීඨය සඳහා පවත්වන ලදි.

01. වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් සාරාංශය - 2021

වැඩසටහන	වැඩසටහන් සංඛ්‍යාව
නේවාසිකාගාර වැඩසටහන් - (ජීවන කුසලතා වැඩසටහන/විවාහ ජීවිතයේ කුසලතා)	10
ජීව දත්ත පත්‍රිකාවක් සැකසීම සහ සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීම.	03
කර්මාන්ත ප්‍රවීනයන්ගේ වෙබිනර් වැඩසටහන	20
වෘත්තීය මාර්ගෝපදේශන හඳුන්වා දීමේ වැඩසටහන	07
ඉගෙනුම් තාක්ෂණ පිළිබඳ වැඩසටහන	02
අනධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා වැඩ ජීවිතය සමබර කර ගැනීමේ වැඩසටහන	03
ප්‍රජා සමාජ රැස්වීම්	07
වෙනත් වැඩසටහන්	14
වෘත්තීය උපදේශන සහ උපදේශන සැසි	538

02. පුද්ගලික/වෘත්තීය උපදේශනය සහ උපදේශන සැසි පිළිබඳ විස්තර

මාසය	සිසුන්	දුරකථන හරහා	වෙනත්	එකතුව
ජනවාරි	02	10	04	16
පෙබරවාරි	03	11	03	17
මාර්තු	01	22	05	28
අප්‍රේල්	-	25	11	36
මැයි	-	27	05	32
ජූනි	-	34	01	35
ජූලි	-	31	17	48
අගෝස්තු	01	59	20	80
සැප්තැම්බර්	-	64	26	90
ඔක්තෝම්බර්	-	31	18	49
නොවැම්බර්	-	51	09	60
දෙසැම්බර්	03	30	14	47
එකතුව				**538**

ඇ. අසමර්ථයන් හා නිර්දෝෂිභාවය

රටේ පැවති වසංගත තත්ත්වය හේතුවෙක් විශ්වවිද්‍යාලය වසා දැමීමට සිදු විය. එබැවින් සැලසුම් කල පරිදි නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන් සහ වැඩමුළු හා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් නොපවත්වන ලද අතර වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයේ අනෙකුත් සියලුම සේවාවන් සූම් තාක්ෂණය සහ දුරකථන මාර්ග ඔස්සේ ක්‍රියාත්මක කරන ලදි

ඈ. අනාගත දැක්ම - 2022 වෘත්තීය මාර්ගෝපදේශණ ඒකකයේ ක්‍රියාකාරී සැලැස්ම

අනු අංකය.	වැඩසටහනේ නම	වැඩසටහනේ කාරණය	දිනය
01	උපාධි අපේක්ෂකයින් සඳහා ජීවන කුසලතා'' නේවාසිකාගාර වැඩසටහන	මෘදු කුසලතා සහ පෞරුෂ සංවර්ධනය පිළිබඳ දැනුවත් කිරීම - වැඩසටහන් 20ක් පැවැත්වීම.	අවුරුද්ද පුරා
02	නාට්‍ය චිකිත්සක වැඩමුළු	ඉදිරිපත් කිරීමේ කුසලතා සහ ආතතිය මඟ හැරීම සඳහා - වැඩසටහන් 03ක් පැවැත්වීම.	2022 සෙප්තැම්බර්, ඔක්තෝම්බර්, නොවැම්බර්

03	තනි පුද්ගල වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශන	අභිරුචිකරණ වෘත්තීය මාර්ගෝපදේශන විසඳුම් ලබා දීම.	අවුරුද්ද පුරා
04	මෘදු කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන්	මෘදු කුසලතා වර්ධනය	පෙබරවාරි, මාර්තු, මැයි. අගෝස්තු
05	කර්මාන්ත ප්‍රවීනයන්ගේ වෙබිනර් වැඩසටහන් මාලාව	සෘජුව කර්මාන්තයන්ට නිරාවරණය වීමේ අවස්ථාවන් ලබා දීම.	අවුරුද්ද පුරා
06	සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨ සිසුන් සඳහා රැකියාවකට ඉල්ලුම්පත් සැකසීම, සම්මුඛ පරීක්ෂණයකට මුහුණදීම සහ සාරාංශ ලිවීම පිළිබඳ වැඩසටහන	අවසන් වසර සිසුන්ගේ සම්මුඛ පරීක්ෂණ කුසලතා වැඩි දියුණු කිරීම.	ජනවාරි - 2022
07	කළමනාකරණ අධ්‍යන පීඨ සිසුන් සඳහා රැකියාවකට ඉල්ලුම්පත් සැකසීම, සම්මුඛ පරීක්ෂණයකට මුහුණදීම සහ සාරාංශ ලිවීම පිළිබඳ වැඩසටහන	අවසන් වසර සිසුන්ගේ සම්මුඛ පරීක්ෂණ කුසලතා වැඩි දියුණු කිරීම.	මාර්තු - 2022
08	ව්‍යවහාරික විද්‍යා පීඨ සිසුන් සඳහා රැකියාවකට ඉල්ලුම්පත් සැකසීම, සම්මුඛ පරීක්ෂණයකට මුහුණදීම සහ සාරාංශ ලිවීම පිළිබඳ වැඩසටහන	අවසන් වසර සිසුන්ගේ සම්මුඛ පරීක්ෂණ කුසලතා වැඩි දියුණු කිරීම.	මැයි - 2022
09	කෘෂිකර්ම පීඨ සිසුන් සඳහා රැකියාවකට ඉල්ලුම්පත් සැකසීම, සම්මුඛ පරීක්ෂණයකට මුහුණදීම සහ සාරාංශ ලිවීම පිළිබඳ වැඩසටහන	අවසන් වසර සිසුන්ගේ සම්මුඛ පරීක්ෂණ කුසලතා වැඩි දියුණු කිරීම.	නොවැම්බර් - 2022
10	තාක්ෂණ පීඨ සිසුන් සඳහා රැකියාවකට ඉල්ලුම්පත් සැකසීම, සම්මුඛ පරීක්ෂණයකට මුහුණදීම සහ සාරාංශ ලිවීම පිළිබඳ වැඩසටහන	අවසන් වසර සිසුන්ගේ සම්මුඛ පරීක්ෂණ කුසලතා වැඩි දියුණු කිරීම.	අගෝස්තු - 2022
11	කෘෂිකර්ම පීඨ සිසුන් සඳහා කථන ශිල්ප හැකියාව වැඩිදියුණු කිරීමේ වැඩසටහන	සිසුන්ගේ පොදු කථන හැකියාව වැඩි දියුණු කිරීම	ජනවාරි - 2022
12	තාක්ෂණ පීඨ සිසුන් සඳහා කථන ශිල්ප හැකියාව වැඩිදියුනු කිරීමේ වැඩසටහන	සිසුන්ගේ පොදු කථන හැකියාව වැඩි දියුණු කිරීම	මාර්තු - 2022
13	ව්‍යවහාරික විද්‍යා පීඨ සිසුන් සඳහා කථන ශිල්ප හැකියාව වැඩිදියුනු කිරීමේ වැඩසටහන	සිසුන්ගේ පොදු කථන හැකියාව වැඩි දියුණු කිරීම	මැයි - 2022
14	කළමනාකරණ පීඨ සිසුන් සඳහා කථන ශිල්ප හැකියාව වැඩිදියුනු කිරීමේ වැඩසටහන	සිසුන්ගේ පොදු කථන හැකියාව වැඩි දියුණු කිරීම	ජූලි - 2022
15	සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨ සිසුන් සඳහා කථන ශිල්ප හැකියාව වැඩිදියුනු කිරීමේ වැඩසටහන	සිසුන්ගේ පොදු කථන හැකියාව වැඩි දියුණු කිරීම	ඔක්තොම්බර් - 2022
16	කෘෂිකර්ම පීඨ සිසුන් සඳහා පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන	සිසුන්ගේ පෞරුෂත්ව සංවර්ධනය	නොවැම්බර් - 2022
17	තාක්ෂණ පීඨ සිසුන් සඳහා පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන	සිසුන්ගේ පෞරුෂත්ව සංවර්ධනය	අගෝස්තු - 2022
18	ව්‍යවහාරික විද්‍යා පීඨ සිසුන් සඳහා පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන	සිසුන්ගේ පෞරුෂත්ව සංවර්ධනය	ජූලි - 2022

19	කළමනාකරණ අධ්‍යන පීඨ සිසුන් සඳහා පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන	සිසුන්ගේ පෞරුෂත්ව සංවර්ධනය	මැයි . 2022
20	සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨ සිසුන් සඳහා පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන	සිසුන්ගේ පෞරුෂත්ව සංවර්ධනය	පෙබරවාරි - 2022
21	වෘත්තීමය සහ ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන වැඩසටහන්	ව්‍යවසායකත්ව කුසලතා වර්ධනය කිරීමේ වැඩසටහන් 06 ක්	ජනවාරි, මාර්තු, ජුනි, අගෝස්තු ඔක්තෝම්බර්, දෙසැම්බර්
22	වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය මඟින් මාර්ගගත රැකියා ද්වාරය සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.	වෘත්තීය මාර්ගෝපදේශ සම්බන්ධ තොරතුරු හුවමාරු කිරීම.	අවුරුද්ද පුරා
23	වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය විසින් පවත්වනු ලබන පාඨමාලා	වාත්තීය මාර්ගෝපදේශන පිළිබඳ දැනුම හා කුසලතා සංවර්ධනය	අවුරුද්ද පුරා
24	ග්‍රැවල් සමාජය	පොදු කථන කුසලතා වැඩි දියුණු කිරීම.	අවුරුද්ද පුරා
25	රොටරැක්ට් සමාජය	නායකත්ව කුසලතාව වැඩි කිරීම.	අවුරුද්ද පුරා
26	නිදහස් සහ විවෘත මෘදුකාංග සමාජය	තාක්ෂණ සාක්ෂරතාවය වැඩිදියුණු කිරීම.	අවුරුද්ද පුරා
27	ආර්ථික හා ව්‍යාපාර පිළිබඳ ජාත්‍යන්තර ශිෂ්‍ය සංගමය	සිසුන්ගේ නායකත්ව කුසලතාව වැඩි දියුනු කිරීම.	අවුරුද්ද පුරා

26. දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාන මධ්‍යස්ථානය

අ. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ පෞරාණික අගනගරයක් වූ අනුරාධපුර නගරයට කිලෝමීටර් 20ක් පමණ නැගෙනහිර දෙසට වූ මිහින්තලය පරිශ්‍රයේ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය ස්ථාපනය කොට තිබේ. ශ්‍රී ලංකා රජරට විශ්වවිදයාලය පීඨ 06කින් සමන්විත වන අතර ඒවා කෘෂිකර්ම පීඨය, ව්‍යවහාරික විද්‍යා පීඨය, කළමනාකරණ අධ්‍යන පීඨය, වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය, සාමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය සහ තාක්ෂණ පීඨයවේ. කෘෂිකර්ම පීඨය පුලියන්කුලමද වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය සාලියපුර ද ස්ථාපනය කොට ඇති අතර අනෙකුත් සියළුම පීඨ, ඒකක සහ මධ්‍යස්ථාන මිහින්තලයේ විශ්වවිද්‍යාල ප්‍රධාන පරිශ්‍රයතුල ස්ථාපනය කොට තිබේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සිසුන්හට බාහිර වැඩසටහන් මඟින් පුළුල් පරාසයක්තුල විහිදුණු ඉගැනුම් අවස්ථා ලබා දීමට නිශ්චිත මාර්ගෝපදේශ සකස්කොට තිබෙනුයේ නිපුණතා ඇති, දැනුමැති සහ රැකියා කළ හැකි උපාධිධාරීන්, ඩිප්ලෝමාලාධාරීන් සහ සහතිකපත්‍ර ධාරීන් බිහි කිරීමේ අභිප්‍රාය ඇතිවය. බාහිර අධ්‍යන වැඩසටහන් වඩාත් ඵලදායි හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා වෙනම පරිපාලන ව්‍යුහයක් ස්ථාපනය කර දෙන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම් සභාවෙන් ඉල්ලීම් කර තිබේ. එමගින් පීඨ සහ අධ්‍යනාංශ මගින් සිදුකෙරෙන වැඩ ප්‍රමානය අඩුකර ගත හැකිය. විශ්වවිද්‍යාලයේ විවිධ පීඨ මගින් බාහිර උපාධි වැඩසටහන් කිහිපයක් සහ සහතිකපත්‍ර සහ ඩිප්ලෝමා මට්ටමේ විස්තාරිත වැඩසටහන් පවත්වනු ලබයි.

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යන මධ්‍යස්ථානය සහ විශ්වවිද්‍යාලීය බාහිර අධ්‍යන වැඩසටහන්වල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම සඳහා ස්ථාපිත ස්වාධීන පරිපාලන ව්‍යුහයවේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම් සභාවේ චක්‍රලේඛ අංක 932 අනුව වර්ෂ 2011 ඔක්තෝම්බර් 24 වන දින පැවති 155වන පාලක සභා අනුමැතියෙන් විශ්වවිද්‍යාලයීය දුරස්ථ හා අඛණ්ඩ මධ්‍යස්ථානය ස්ථාපනය කරන ලදි. ආරම්භයේ සිට වර්ෂ 2014 මාර්තු 31 දක්වා දුරස්ථ හා අඛණ්ඩ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් ව්‍යවහාරික විද්‍යා පීඨයේදි සිදුකෙරුනු අතර වර්ෂ 2014 අප්‍රේල පළමු වන දා සිට දුරස්ථ හා අඛණ්ඩ මධ්‍යස්ථානය ප්‍රධාන පරිපාලන ගොඩනැගිලි පරිශ්‍රය වෙත ගෙන එන ලදි.

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයෙහි දැක්ම


''දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපනයේ ජාත්‍යන්තරව පිළිගත් විශිෂ්ටත මධ්‍යස්ථානයක් වීම''

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයෙහි මෙහෙවර

''සියලු වයස් කාණ්ඩවල විද්වතුන්ට ඉහළ ඉල්ලුමක් ඇති උසස් අධ්‍යාපන වැඩසටහන් සඳහා ප්‍රවේශය ලබා දීම සහ බුද්ධිමය වශයෙන් උත්තේජනය කරන අධ්‍යයන පරිසරයක් තුළ ව්‍යක්තීය දියුණුව සඳහා උසස් අධ්‍යාපනය අපේක්ෂා කරන වැඩිහිටි ඉගෙනුම්කරුවන්ගේ අවශ්‍යතා සපුරාලීම තුළින් දැනුම පදනම් වූ සමාජයක් ගොඩනැගීමට දායක වීම.''

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය හි පරිපාලන ව්‍යුහය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශයන්ට අනුව පහත දැක්වේ.

දු.අ.අ.ම හි පරිපාලන ව්‍යුහය



* අනාගතයේදී දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය තවදුරටත් පුළුල් කිරීමත් සමඟ මෙම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කෙරෙනු ඇත.

2. දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය හි කළමනාකරණ කමිටු පැවැත්වීම

පහත සඳහන් දින තුළ කළමනාකරණ කමිටු රැස්වීම් දෙකක් වර්ෂ 2021දී පවත්වන ලදි.

1. 33 වන කළමනාකරණ කමිටු රැස්වීම - 23 පෙබරවාරි 2021
2. 34 වන කළමනාකරණ කමිටු රැස්වීම - 18 අගෝස්තු 2021

3. දැනට ක්‍රියාත්මක වැඩසටහන්

අනු අංකය	වැඩසටහන
01	විද්‍යාවේදී සාමාන්‍ය උපාධි වැඩසටහන විද්‍යාවේදී (ජීව විද්‍යා) බාහිර උපාධි වැඩසටහන
02	විද්‍යාවේදී සාමාන්‍ය උපාධි වැඩසටහන විද්‍යාවේදී (භෞතික විද්‍යා) බාහිර උපාධි වැඩසටහන
03	ව්‍යාපාර පරිපාලනවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය
04	ඉංග්‍රිසි ඩිප්ලෝමා පාඨමාලාව
05	ඉංග්‍රිසි උසස් සහතික පත්‍ර (විස්තාරිත) පාඨමාලාව
06	දෙමළ ඩිප්ලෝමා (විස්තාරිත) පාඨමාලාව
07	දෙමළ සහතික පත්‍ර (විස්තාරිත) පාඨමාලාව
08	තොරතුරු හා සන්නිවේදන ඩිප්ලෝමා (විස්තාරිත) පාඨමාලාව
09	තොරතුරු හා සන්නිවේදන සහතික පත්‍ර (විස්තාරිත) පාඨමාලාව
10	පරිසර කළමණාකරනය පිළිබඳ ඩිප්ලෝමා (විස්තාරිත) පාඨමාලාව

අ. ජයග්‍රහණයන්

- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යන මධ්‍යස්ථානය සඳහා නව ගොඩනැගිලි සංකීර්ණය.
  දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යන මධ්‍යස්ථානය සඳහා නව ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු අනුරාධපුර නගරයේ සිදුකෙරෙමින් පවති.
- අධ්‍යයන මධ්‍යස්ථානය සඳහා පොලොන්නරුවේ ඉඩම.
  දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යන මධ්‍යස්ථානය සඳහා අධ්‍යන මධ්‍යස්ථානයක් ඉදිකිරීමට පොලොන්නරුව නගරයේ නව ඉඩමක් ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයට ලබා ගැනීම.
- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යන මධ්‍යස්ථානය සඳහා නව වෙබ් අඩවියක්.
  දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යන මධ්‍යස්ථානය සඳහා නව වෙබ් අඩවියක් හදුන්වා දෙන ලදි.
- බාහිර වැඩසටහන්වල ප්‍රථිපල නිකුත් කිරීම.
  කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ වුවද බාහිර උපාධි සහ දිගු වැඩසටහන් වල ප්‍රථිපල ප්‍රමාදයකින් තොරව කිකුත් කිරීම.
- බාහිර වැඩසටහන් පැවැත්වීඹ
  කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් බොහෝ බාහිර වැඩසටහන් අථත්‍ය ක්‍රමවේද යටතේ පැවැත්වීම.

5. වර්ෂ 2021 දී මුහුණ දුන් අභියෝගයන්

- කොවිඩ් 19 වසංගතය හේතුවෙන් බාහිර වැඩසටහන් පවැත්වීමේ ප්‍රගතිය මන්දගාමීව සිදුවීම.
- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයට නිසි ලෙස ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය භෞතික හා මානව සම්පත් ප්‍රමාණවත් නොමැති අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 932 මගින් තීරණය කරනු ලැබූ කාර්ය මණ්ඩල ප්‍රමාණයට අනුවද සිටිය යුතු අවම පරිපාලන, මූල්‍ය, ලිපිකාර හා තාක්ෂණික කාර්ය මණ්ඩලයද නොමැත.
- ස්වාධීන, කාර්‍යක්ෂම හා ඵලදායී මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වීමට ඇති බාධාවන්
- බාහිර අධ්‍යන මධ්‍යස්ථාන සම්බන්ධ ගැටළු
- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ සමීක්ෂණ මණ්ඩලය හා වැඩසටහන් සම්බන්ධීකාරක අතර සම්බන්ධීකරණයට අදාල ගැටළු

ඈ. අනාගත දැක්ම

- සිදුකෙරෙමින් පවතින බාහිර වැඩසටහන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ තත්වය සහතික කිරීමේ කමිටුවේ බාහිර උපාධි වැඩසටහන් සඳහා වූ නිර්නායකයන් අනුව සමාලෝචනය කිරීම.
- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය පූර්ණ නිදහස් පරිපාලන ආයතනයක් ලෙස පුළුල් කිරීම මඟින් අධ්‍යයන වැඩසටහන් වඩාත් හොඳින් ක්‍රියාත්මක කරීමට පහසුම් සැලසීම.
- ව්‍යාපාර පරිපාලනවේදී උපාධි වැඩසටහන සඳහා විෂය මාලා සංශෝධනය සිදු කිරිම.
- ශාලා සහ බාහිර අධ්‍යන මධයස්ථානවල පහසුකම් වැඩි දියුණු කිරිම.
- දත්ත සමුදාය කළමනාකරණ පද්ධතිය දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය හඳුන්වා දීම.
- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ සමීක්ෂණ මණ්ඩල සහ වැඩසටහන් සම්බන්ධීකාරක අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරිම.
- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ අරමුදල වඩාත් කාර්යක්ෂම හා ඵලදායි කටයුතු සඳහා යෙදවීම.
- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ ශිෂ්‍ය අත්පොත යාවත්කාලීන කිරීම.
- දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ පරිපාලන හා ලිපිකරු කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

27. කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය

අ. හැදින්වීම

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය වර්ෂ 2005 දී ස්ථාපනය කරන ලදි. මෙම මධ්‍යස්ථානයේ අරමුණ වනුයේ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ සියළුම අංශ සඳහා අඛණ්ඩ, අවශ්‍යතා පදනම් කරගත් ඉගැනුම් සහ වෘත්තීය සංවර්ධන අවස්ථා සැලසීමයි. කාර්ය මණ්ඩල සංවර්ධන ඒකකයෙහි ප්‍රධාන අරමුණ වනුයේ විශ්වවිදයාලයේ ඉගැන්වීම් සහ ඉගනුම් ක්‍රියාවලිය වඩාත් ඵලදායි ලෙසද, වඩාත් යෝග්‍ය ලෙසද, සිසුන් මුලික කරගනිමින් සහ නව්‍ය ඉගැන්වීම් ක්‍රමවේදයන් ඔස්සේ අලුතින් බඳවා ගන්නා අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින් පුහුණු කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ජාත්‍යන්තර ප්‍රමිතීන් කරා ලඟා වීමයි. තවද, විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් අතර වඩාත් ඵලාදායි හා කාර්යක්ෂම කාර්ය සාධනයක් සඳහා අවශ්‍ය කුසලතා සහ නිපුණතා වර්දනය ඇති කිරීම සහ ප්‍රවර්ධනය කිරීමට කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය කැපවී සිටී.

දැක්ම

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ දැක්ම වන්නේ වෘත්තීය සංවර්ධනයේ විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානයක් වීමයි.

මෙහෙවර

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ මෙහෙවර වන්නේ සේවකයින්ට කැපවූ, අභිප්‍රේරිත සහ දක්ෂ වෘත්තිකයන් බවට පත්වීමට සුදුසු පුහුණුවක් සහ සංවර්ධන අවස්ථා ලබා දීමයි.

ඉලක්කය

විශ්වවිද්‍යාලය තුළ සිටින සියලුම කාර්ය මණ්ඩලය සඳහා අඛණ්ඩ, අවශ්‍යතා මත පදනම් වූ ඉගෙනුම් සහ වෘත්තීය සංවර්ධන අවස්ථා ලබා දීම.

කාර්යය මණ්ඩලය

- ආචාර්ය ලලිත් සේනාරත්න - අධ්‍යක්ෂ
- ඒ. පී. එස්. එන්. අබේකෝන මෙනවිය - ආධුනික කථිකාචාර්ය
- කේ. එම්. එස්. කේ. සමරකෝන් මහත්මිය - කළමනාකරණ සහකාර
- ඩී. එස්. රත්නසුරිය මහතා - කාර්යාල සහයක

ආ. ජයග්‍රහණයන්

සම්පූර්ණ කරන ලද වැඩ සටහන්

අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා උසස් අධ්‍යාපනය පිළිබඳ ඉගැන්වීමේ සහතික පත්‍ර වැඩසටහන

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය වාර්ෂිකව විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ප්‍රේරක වැඩසටහනක් ඉදිරිපත් කරයි. මෙම වැඩසටහන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද පුහුණු අත්පොත මත පදනම් වේ. වැඩසටහන සාර්ථකව නිම කිරීම මත සහභාගිවන්නන්ට උසස් අධ්‍යාපනය පිළිබඳ ඉගැන්වීමේ සහතිකය පිරිනමනු ලැබේ. යෝජිත පුහුණු වැඩසටහන සංචිප්ත වුයේ ප්‍රධාන ක්ෂේත්‍ර අටක් ආවරණය වන පරිදි වෙනම මොඩියුල වලින් වේ.

2021 වර්ෂයේදී අධ්‍යයන කාර්ය මණ්ඩල අභිපේරන වැඩ සටහන අප්‍රේල් මාසයේදී ආරම්භ කල අතර අගෝස්තු මාසය වන විට අවසන් විය. මෙම වැඩසටහන සඳහා 30 දෙනෙකු ලියාපදිංචි වී සාර්ථකව අවසන් කරන ලදි. ඒ අතර ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින් 26 දෙනෙකු, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකු සහ IDM ජාත්‍යන්තර විශ්වවිද්‍යාල එක් සාමාජිකයෙකු විය.

කැණිමඩල වැඩසටහන

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය සහ විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය සමඟ එක්ව අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා පුද්ගලික සහ වෘත්තීය ජීවිතය තුළ ඔවුන්ගේ කුසලතා වර්ධනය කර ගැනීම සඳහා පුහුණු වැඩසටහනක් පවත්වන ලදි.

මෙම වැඩසටහන මාර්තු 29, 30 සහ 31 යන දින තුනේදී පවත්වන ලද අතර මෙම සැසිය සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් 63 දෙනෙකු සහභාගි විය.

අ) අධ්‍යනාංශ ප්‍රධානින් සහ විධායක නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන

කාර්ය මණ්ඩල සංවර්ධන ඒකකය විසින් විධායක කාර්ය මණ්ඩලය සහ අධ්‍යනාංශ ප්‍රධානීන් සඳහා විශ්වවිද්‍යාල මූල්‍ය හා පරිපාලන ක්‍රියා පටිපාටි පිළිබඳ පුහුණු වැඩසටහනක් හඳුන්වා දෙන ලදි. මෙම පුහුණු වැඩසටහන මොඩියුල 8කින් සමන්විත වූ අතර සතියකට එක් දින බැගින් සති පහක් සඳහා දින පහක වැඩසටහනක් ලෙස සැලසුම් කර තිබුණි. 2021 නොවැම්බර් මාසයේ පුහුණුව ආරම්භ කරන ලද අතර මෙම වැඩසටහන සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් 35 දෙනෙකු සහභාගි විය. මෙම වැඩසටහන වාර්ෂික පුහුණුවක් ලෙස ඉදිරියට පවත්වා ගෙන යාමට පියවර ගනු ලැබේ.

බ) රියදුරු මහතුන් සඳහා වැඩමුළුවක් පැවැත්වීම.

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ සේවය කරන රියදුරු මහතුන් සඳහා මෙම පුහුණු වැඩසටහන සංවිධානය කරන ලදි. මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වුයේ සහභාගිවන්නන් වෘත්තීයමහ රියදුරන් ලෙස පුහුණු කිරීමයි. 21 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 2021 ජනවාරි 06වන දින මෙම වැඩසටහන පවත්වන ලදි.

ඇ. අසමර්ථයන් හා නිර්දෝෂිභාවය

- වැඩසටහන් පැවැත්වීමේදී හා සම්පූර්ණකිරීමේදි ප්‍රමාදයන් සිදුවීම. වසංගත තත්ත්වය තුළ ගමන් සීමා කිරීම් සහ විශ්වවිද්‍යාලය වසා දැමීම හේතුවෙන් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා ප්‍රේරන වැඩසටහන් පැවැත්වීම.
- වසංගත තත්ත්වය හේතුවෙන් පුහුණු වැඩසටහන් සඳහා සම්පත් දායකයින් ගෙන්වා ගැනීම අභියෝගයක් විය. මේ සඳහා සැලසුම් කර තිබූ සමහර වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය.

ඈ. අනාගත සැලසුම්

අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා වාර්ෂික පුහුණු වැඩසටහන් දෙකක් හඳුන්වා දීම.

අනෙක් විශ්වවිද්‍යාලවල සාමාජිකයින්ටද සහභාගි විය හැකි වැඩසටහන් හඳුන්වා දී එයින් ලැබෙන ආදායම් කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ ඉදිරි ක්‍රියාකාරකම් සඳහා භාවිතා කිරීම.

28. තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය

අ. හැදින්වීම

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පරිගණක මධ්‍යස්ථානය 1996 විශ්වවිද්‍යාලයේ ආරම්භයත් සමඟ උපාධි අපේක්ෂකයන්ගේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ (ICT) කුසලතා වැඩිදියුණු කිරීම සඳහා ස්ථාපිත කරන ලදි. පරිගණක මධ්‍යස්ථානයේ පරිපාලන කටයුතු සෘජුවම උප කුලපතිතුමියගේ අධීක්ෂණය යටතේ සිදුකරන ලැබීය. එහි ක්‍රියාකාරකම් උපකුලපතිතමිය විසින් පත් කරන ලද පරිගණක මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂක මගින් සිදු කරයි. කළමණාකරන පීඨයේ සහ සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨයේ උපාධි අපේක්ෂකයින්ගේ මූලික පරිගණක හඳුන්වාදීමේ වැඩසටහනක් පවත්වා ගෙන යාමට පරිගණක මධ්‍යස්ථානය මූලික වී කටයුතු කරයි. විශ්වවිද්‍යාලයේ පුළුල් විමත් සමඟ පරිගණක මධ්‍යස්ථානය විශ්වවිදයාලයේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ (ICT) පහසුකම් සපයන මධ්‍යස්ථානයක් බවට පත්විය. මෙහි මූලික අරමුණ ව්‍යාප්ත විමත් සමඟ ඇතිවන පරිපාලනමය ගැටළු අවමකර ගැනීම සඳහා වර්ෂ 2011දී පාලක සභාව මගින් පරිගණක මධ්‍යස්ථානයේ අධ්‍යන හා පරිපාලන කටයුතු සඳහා අධ්‍යක්ෂකවරයෙකු පත්කරනු ලැබීය. අධ්‍යක්ෂකවරයා තොරතුරු සන්නීවේදන තාක්ෂණය (ICT) පිළිබඳ මනා දැනුම ඇති අධ්‍යන කාර්යමණ්ඩලයේ සාමාජිකයෙකි. නම් කරන ලද අධ්‍යක්සකවරයෙකුගේ ධූර කාලය වසර තුනකි.

පරිගණක මධ්‍යස්ථානය සතියේ දිනවල පෙ.ව 8.00 සිට ප.ව 6.00 දක්වාද, සෙනසුරාදා දින පෙ.ව 8.00 සිට ප.ව 4.00 දක්වා විවෘතව පවතී. සමාන්‍යයෙන් විවෘත වේලාවට අමතරව විශේෂ ඉල්ලීම් මත උපකුලපති වරයාගේ අනුමැතිය ඇතිව අධ්‍යන නිවාඩු සහ විභාග කාලසීමාවලදී ප.ව 8.00 දක්වා විවෘතව තබනු ලබයි. පරිගණක මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය පරිගණක තාක්ෂණ උපදේශකවරයෙකු, පද්ධති විශ්ලේෂකයෙකු, සහකාර ජාල කළමනාකරුවෙකු, තාක්ෂණ නිළධාරියෙකු, විද්‍යාගාර සහයකයෙකු හා වැඩ සහයකයෙකුගෙන් සමන්විත වේ.

ආ. ජයග්‍රහණයන්

මිහින්තලේ පරිශ්‍රයේ පිහිටි සියළු පීඨවල අධ්‍යයන කටයුතු සඳහා අත්‍ය අවශ්‍ය පහසුකම් සැලසීමට තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයට හැකිවිය.

1. පරිපාලන ගොඩනැගිල්ලේ සිට දැනට තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය ස්ථාපිත ගොඩනැගිල්ල වෙත සර්ව පරිගණක
   ගෙන යාමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදි.

2. තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයට ප්‍රවේශ වීම සඳහා වෙනම පිවිසුමක් ඉදිකිරීම.

3. විශ්වවිද්‍යාලය සඳහා නව වෙබ් අඩවියක් දියත් කිරීම.
.
4. ශිෂ්‍ය නේවාසිකාගාරයලින් 90%කට Wi-Fi පහසුකම් ලබා දීම.

ඇ. අනාගත දැක්ම

විශ්වවිද්‍යාලයේ සෙසු අංශවලට අන්තර්ජාල පහසුකම් ලබා දීම.

29. තත්ත්වය සහතික කිරීමේ මධ්‍යස්ථානය

අ. හැඳින්වීම

අභ්‍යන්තර ගුණත්වය තහවුරුකරණය, ගුණත්ව තහවුරු කිරීමේ කේන්ද්‍රය හා අභ්‍යන්තර ගුණත්ව තහවුරුකරණ ඒකක යටතේ විධිමත් කරනු ලබන අතර 2013 අභ්‍යන්තර ගුණත්ව තහවුරුකරණ මාර්ගෝපදේශ වලට සමගාමී අතුරු ව්‍යවස්ථා මඟින් මෙහෙයවනු ලබයි. ගුණත්වය උසස් කිරීමේ අරමුණින් අභ්‍යන්තර ගුණත්ව තහවුරුකිරීමේ කේන්ද්‍ර වල කාර්යභාරය පුළුල් කෙරෙමින් පවතී. සෑම ක්‍රියාකාරකමක්ම අභ්‍යන්තර ගුණත්ව තහවුරුකිරීමේ කේන්ද්‍ර සමාජිකයෙකුගේ වගකීමක් වන අතර ඔහු/ඇය පීඨ මණ්ඩලය හෝ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය අනුමත කරන ලද කෘත්‍යාධිකාරී මණ්ඩලයක් සමග කටයුතු කරනු ලබයි. ගුණත්ව තහවුරුකරණ වැඩිදියුණු කිරීමේ ප්‍රතිපත්තිය, විෂය මාලා සංවර්ධන ප්‍රතිපත්තිය, මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය හා ශිෂ්‍ය ඇගයීම් ප්‍රතිපත්තිය යනාදී ප්‍රතිපත්ති ලේඛන පිළියෙල කිරීමේ මූලිකත්වය ගෙන කටයුතු කරනුයේ අභ්‍යන්තර ගුණත්ව තහවුරුකරණ කේන්ද්‍රයයි. එය වෙනත් ප්‍රතිපත්ති ලේඛන කිහිපයක්ම පිළියෙළ කිරීමේදී නිරතව සිටී. බාහිර ගුණත්ව තහවුරුකරණ ක්‍රියාවලියේ මූලිකත්වය ගෙන කටයුතු කරනුයේ ද ගුණත්ව තහවුරුකරණ කේන්ද්‍රයයි. ගුණත්ව තහවුරුකරණ කේන්ද්‍රයේ පීඨ සමායෝජකවරුන් හා පීඨාධිපතිවරුන් පීඨ තුළ අභ්‍යන්තර ගුණත්ව තහවුරුකරණය පිළිබඳව වගකිව යුතු වන අතර දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානයේ වගකීම භාරවනුයේ එහි අධ්‍යක්ෂවරයාටයි. කළමනාකරණ කමිටුව උපකුලපතිවරයා/වරිය මූලසුන හොබවන සනාතන සභා ස්ථාවර කමිටුව බවට පරිවර්ථනය කර ඇත. සනාතන සභාවේදී විශ්වවිද්‍යාලයේ මධ්‍යස්ථාන හා ඒකක යටතේ ගුණත්ව තහවුරුකරණ මධ්‍යස්ථානයේ කරුණු ලේඛනගත වේ.

ආ. ජයග්‍රහණයන්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ ගුණත්ව තහවුරු කිරීමේ මධ්‍යස්ථානය මඟින් පාඨමාලා සමාලෝචනය සඳහා ලබාදෙන ලද සමස්ත ශ්‍රේණිගත කිරීම් පහත පරිදි වේ.

- වෛද්‍ය හා ශල්‍ය වෛද්‍ය උපාධිය (MBBS)- බී ශ්‍රේණිය (හොඳයි)
- කෘෂිකර්ම - බී ශ්‍රේණිය (හොඳයි)

ගුණත්ව තහවුරු කිරීමේ මධ්‍යස්ථානය මඟින් බාහිර සමාලෝචනය (External Reiew) සඳහා ස්වයං ඇගයීම් වාර්තා ඉදිරිපත් කිරීම.

ආයතනික සමාලෝචනය (IR) පාඨමාලා සමාලෝචනය (PR)	පාඨමාලාවේ නම	ස්වයං ඇගයීම් වාර්ථා ඉදිරිපත් කිරීම
පාඨමාලා සමාලෝචනය (PR)	ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව 2021	2022. 01. 31
පාඨමාලා සමාලෝචනය (PR)	ජීවවිද්‍යා (විද්‍යාවේ දී) (බාහිර)	2022. 01. 31
පාඨමාලා සමාලෝචනය (PR)	භෞතික විද්‍යා විද්‍යාවේ දී (බාහිර)	2022. 01. 31

ඇ. අසමර්ථයන් හා නිර්දෝෂි භාවය

භෞතිකව පැවැත්වීමට නියමිතව තිබූ සියළුම රැස්වීම්, වැඩමුළු හා පුහුණු වැඩසටහන් කොවිඩ් 19 වසංගත ව්‍යාප්තිය හේතුවෙන් 2021 වසර සඳහා කල්දැමූ අතර ව්‍යවහාරික විද්‍යා පීඨයේ පාඨමාලා සමාලෝචනයට අදාළ ක්ෂේත්‍ර චාරිකාවන්ද, කොවිඩ් 19 වසංගතය තත්ත්වය හේතුවෙන් අවලංගු කෙරිණි.

ඈ. අනාගත දැක්ම

2022 වසර සඳහා ක්‍රියාකාරී සැලැස්ම හා පුනරාවර්තන වියදම්

ක්‍රියාකාරකම	කාලය	ප්‍රතිලාභී කණ්ඩායම	ක්‍රියාකාරකම්	වියදම් (රු.)
ආයතනික වාර්තාව ලියන්නේ කෙසේද? වැඩමුළුව	දින 01	අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්	වැඩමුළු	100,000. 00
වෙබ් පාදක හා තාක්ෂණ පාදක ඉගෙනුම් වැඩමුළුව	දින 01	අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්	වැඩමුළු	80,000. 00
ප්‍රතිසම්පාදන, ලංසු තැබීම, මිල ගණන් කැඳවීම පටිපාටිය පිළිබඳව වැඩමුළුව	දින 01	පරිපාලන නිළධාරීන් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය	වැඩමුළු	60,000. 00
වැඩමුළු සම්මන්ත්‍රණ		අධ්‍යක්ෂක ගුණත්ත්ව තහවුරු කිරීමේ මධ්‍යස්ථානය හා සමායෝජකවරුනි		100,000. 00
රැස්වීම් සඳහා තේ පැන් සැපයීමට හා ලිපි ද්‍රව්‍ය සඳහා වියදම්				60,000. 00
එකතුව				400,000.00

30. විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකකය

අ. හැඳින්වීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 10/2016 මඟින් ලෝක බැංකු මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක උපාධි අධ්‍යාපන කෙෂ්ත්‍රය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියක් වන උසස් අධ්‍යාපනය පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර සබඳතා ඒකකය 2018 වර්ෂයේ දී ස්ථාපිත කරන ලදී.

ඒකකයේ වර්තමාන අධ්‍යක්ෂවරිය ලෙස මහාචාර්ය ජී.ඒ.එස් ගිනිගද්දර මහත්මිය සේවය කරන අතර, එහි කළමනාකාරවරිය ලෙස එරංගා ලියනගේ මහත්මිය, එම්.ඩී හරිස්චන්ද්‍ර මෙනවිය පුහුණුවන්තියක් ලෙසත් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදී සිටී.

පීඨ හා ව්‍යාපාර සම්බන්ධතා ඒකකය අතර සන්නිවේදන හා සම්බන්ධීතාව පහසු වන පිණිස සෑම පීඨයකින්ම සමායෝජකවරයකු පත් කර ඇති අතර, ඒකකයට උපදෙස් ලබා දෙනු පිණිස ව්‍යවසායක නියෝජිතයින්, පීඨාධිපතිවරුන් හා විශ්වවිද්‍යාල පරිපාලන නියෝජනය කරමින් ආයතනික නියෝජිකයින්ගෙන් සමන්විත විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකක උපදේශක මණ්ඩලයක් ද වේ.

ආ. ජයග්‍රහණයන්

ගුණවර්ධන ආයුර්වේද (පෞද්) සමාගම සමඟ ගිවිසුම් ගත වීම පර්යේෂණ හා වානිජකරණ කටයුතු සඳහා, විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ ජෛව පද්ධති අධ්‍යයනාංශය, ගුණවර්ධන ආයුර්වේද (පෞද්) සමාගම සමඟ ගිවිසුම් ගත විය.

ලංකා වානිජ මණ්ඩලයේ මාර්ගගත ප්‍රදර්ශනය

වර්ෂය තුලදී උසස් අධ්‍යාපනය කඩිනම් කිරීමේ හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (AHEAD) ලංකා වානිජ මණ්ඩලය හා එක්ව කර්මාන්ත අභිමුඛ මාර්ගගත ප්‍රදර්ශන සංවිධානය කරන ලදී.

ඉන්දියානු වානිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනයට සහභාගී වීම හා එහිදී ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ නිපැයුම් ඉදිරිපත් කිරීම.

ඇ. අනාගත දැක්ම

- විශ්වවිද්‍යාලයේ පණ ගැන්වුම් (start ups) පුළුල් කිරීම
- ආයතනික සබඳතා වර්ධනය කිරීම
- ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ හා ව්‍යාපාර සබඳතා ඒකකයේ තිරසාරභාවය සඳහා ආදායම් උත්පාදක ක්‍රියාකාරකම් පැවැත්වීම

31. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ III වන කොටසේ 17(ඈ) වගන්තිය යටතේ සඳහන් කර ඇති තිරසාර සංවර්ධන මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ III වන කොටසේ 17 (ඈ) වගන්තිය යටතේ සඳහන් කර ඇති තිරසාර සංවර්ධනය මත පදනම් වූ අනාගක අපේක්ෂිත වාර්තාව

1. වර්තමානයේදී විශ්වවිද්‍යාලයීය සියළුම සිසුන් හා කාර්ය මණ්ඩලය සඳහා ප්‍රතිලෝම ඔස්මෝසිස් ක්‍රියාවලිය භාවිතයෙන් පිරිසිදු කරන ලද පානීය ජලය සපයනු ලබන අතර අනාගතයේදී ප්‍රතිලෝම ඔස්මෝසිස් පිරිපහදු යන්ත්‍ර ගණන වැඩිකිරීමෙන් විශ්වවිද්‍යාල ප්‍රජාවට පිරිසිදු පානීය ජලය ලබා ගැනීමේ හැකියාවන් වැඩි කිරීමට බලාපොරොත්තුවේ.

2. මධ්‍යම පරිසර අධිකාරියේ සහයෝගීතාවයෙන් සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය මඟින් කසළ බැහැර කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබෙන අතර අනාගතයේදී අනෙකුත් පීඨ, නේවාසිකාගාර හා කාර්යාලද මෙම ව්‍යාපෘතියට ඇතුළත් කිරීමට බලාපොරොත්තුවේ.

3. අපජලය පරිසර හිතකාමී ලෙස බැහැර කිරීම සඳහා රුපියල් මිලියන 200ක වියදමකින් අපජල පවිත්‍ර කරන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම.

4. හරිත විශ්වවිද්‍යාල සංකල්පයට අනුව විශ්වවිද්‍යාල පරිසරය මනාව පවත්වා ගැනීම සහ එම කටයුතු සඳහා වැසි ළිං ජලය භාවිතා කිරීම.

5. තිරසාර පරිසරයක් ගොඩනැගීමේ අභිප්‍රායෙන් සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය හා කෘෂිකර්ම පීඨය මඟින් හඳුන්වාදෙන ලද රුක්රෝපන වැඩසටහන ඉදිරියටද කරගෙන යෑමට බලාපොරොත්තුවේ.

6. විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන දැරිය හැකි මුදලක් අය කරන සහ ගුණාත්මක තාක්ෂණික හා වෘත්තීය අධ්‍යයාපන වැඩසටහන් සඳහා ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය සඳහාම සමාන ප්‍රවේශයන් සහතික කිරීම.

7. විශ්වවිද්‍යාල අධ්‍යාපනයට සුදුසුකම් නොලබන සිසුන් නිපුණතා ඇති, දැනුමැති සහ රැකියා සඳහා සුදුසු උපාධිධාරීන්, ඩිප්ලෝමාධාරීන් සහ සහතිකපත් දරන්නන් බවට පත්කිරීමේ අරමුනින් බාහිර අධ්‍යාපන වැඩසටහන් සඳහා සිසු ප්‍රවේශය ඉහළ නැංවීම.

8. කළමනාකරණ අධ්‍යයන පීඨය හා සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය මඟින් පවත්වනු ලබන පශ්චාත් උපාධි හා පශ්චාත් ඩිප්ලෝමා වැඩසටහන් සඳහා බඳවා ගැනීම් ඉහළනැංවීම හා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහතික කිරීම.

9. ප්‍රදේශයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ හදාරන සිසුන්ගේ තත්වය ඉහළ නැංවීමේ අරමුණින් උතුරුමැද පළාත් පාසල් උසස්පෙළ සිසුන් සඳහා ජීව විද්‍යාව, ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය සහ තාක්ෂණය යන විෂයන්ට අදාලව පවත්වනු ලබන වැඩමුළුව වඩාත් හොඳින් ඉදිරියටත් පැවැත්වීම.

10. සියළුම පීඨයන් මඟින් සිදු කරනු ලබන දැනුම බෙදාහැරීමේ වැඩසටහන් ප්‍රමාණයෙන් හා ගුණාත්මක බවෙන් ඉහළ නංවා ක්‍රියාත්මක කිරීම.

32. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 106(1) සහ 107(ආ) වගන්ති ප්‍රකාරව සහ 1971 අංක 38 දරන මුල්‍ය පනත හා එහි සංශෝධන ප්‍රකාරව ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2021 වර්ෂය සඳහා වන මුල්‍ය ප්‍රකාශනය

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය – මිහින්තලේ
2021 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

	සටහන	2021	2020
		ශ්‍රී:ලං:රු:	ශ්‍රී:ලං:රු:
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් සහ මුදල් සමාන දෑ	2	165,369,678	118,835,657
ආයෝජන් අනෙකුත් මුදල්	3	296,667,813	289,095,311
අත්තිකාරම් - සැපයුම් සහ සේවා	4	12,659,522	11,322,935
අත්තිකාරම් - විවිධ	5	2,390,417	1,392,551
අතතිකාරම් - සේවක	6	269,600	249,450
සේවක ණය	7	7,599,991	16,783,833
ආයතන සහ අනෙකුත් විශ්වවිද්‍යාල වලින් ලැබිය යුතු මුදල්	8	1,799,000	10,680,816
ලැබිය යුතු පොලී මුදල්	9	2,970,812	2,112,675
නාමාවලි	10	41,239,241	43,450,050
ඉදිරියට කළ ගෙවීම්	11	832,331	2,034,605
පර්ශේෂණ අත්තිකාරම්	12	2,521,122	2,662,323
ඇප උල්ලංඝණය කිරීමෙන් ඇති වූ ණය ගැනියන්	13	69,717,263	45,838,543
මුළු ජංගම වත්කම්		**604,036,790**	**544,458,729**
ජංගම නොවන වත්කම්			
සේවක ණය	7	15,156,537	8,699,076
සීමිත ආයෝජන අරමුදල්	3	5,263,472	4,854,742
ශේෂ විද්‍යාතමක වත්කම්	14	3,673,818	3,939,970
ජංගම අත්තිකාරම්	15	216,224,799	278,456,724
නොනිමි වැඩ	15	649,849,925	335,529,262
දේපළ, පිරියත සහ උපකරණ	16	5,705,701,790	6,047,025,487
මුළු ජංගම නොවන වත්කම්		**6,595,870,341**	**6,678,505,261**
මුළු වත්කම්		**7,199,907,131**	**7,222,963,990**
වගකීම්			
ජංගම වගකීම්			
විවිධ තැන්පතු	17	10,800,268	11,014,577
ණය හිමියන්	18	176,488,064	261,987,059
උපචිත වියදම්	19	120,531,016	111,043,844
අනෙකුත් ගෙවිය යුතු මුදල්	20	16,414,707	16,115,837,
මුළු ජංගම වත්කම්		**324,234,055**	**400,161,317**
ජංගම නොවන වත්කම්			
විශ්‍රාමික පාරිතෝෂික	21	206,223,007	205,174,358
මුළු ජංගම නොවන වත්කම්		206,223,007	205,174,358
මුළු වගකීම්		**530,457,062**	**605,335,675**
ශුද්ධ වත්කම්/කොටස්		**6,669,450,069**	**6,617,628,315**
ප්‍රාග්ධන අරමුදල්			
ප්‍රාග්ධන ප්‍රදාන් වියදම් කළ		5,693,499,959	6,013,653,368
ප්‍රාග්ධන ප්‍රදාන වියදම් කළ නොනිමි වැඩ		649,849,925	335,529,262
ඉදිකිරීම් වියදම් නොකළ - ප්‍රාග්ධන ප්‍රදාන	22	84,792,983	110,584,697
පුනරුත්තාපන ප්‍රදාන - පුනරුත්තාපන වැඩ	23	25,277,099	48,237,465
ප්‍රාග්ධන ප්‍රදාන - උපකරණ ලී බඩු පුස්තකාල පොත් සඳහා වියදම් නොකළ	24	64,052,273	33,267,893
ප්‍රාග්ධන ප්‍රදාන - තාක්ෂණ පීඨය	25	19,826,231	24,983,038
ප්‍රාග්ධන ප්‍රදාන - මානව ප්‍රාග්ධන සංවර්ධනය	26	13,808,015	13,808,015
ප්‍රාග්ධන ප්‍රධාන් අනෙකුත් ප්‍රධාන	27	31,191,110	15,191,085
		6,582,297,596	**6,595,254,823**
වෙන් කිරීම්			
ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන වෙන් කිරීම්		28,980,803	28,980,803
ප්‍රාග්ධන වෙන් කිරීම්		218,432,934	218,432,934
පොදු වෙන් කිරීම්		(775,712,007)	(766,817,570)
		(528,298,270)	**(519,403,833)**
අනෙකුත් සම කොටස් උපාංග			
අනෙකුත් අරමුදල්	28	580,266,453	515,359,977
ශිෂ්‍යත්ව අරමුදල	29	7,175,949	6,896,876
පර්යේෂණ ප්‍රදාන	30	28,008,342	19,520,471
		615,450,743	**541,777,324**
මුළු ශුද්ධ වත්කම්/කොටස්		**6,669,450,069**	**6,617,628,315**

පිටු අංක 05 සිට 06 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 05 සිට 29 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශනවල පූර්ණ සංඛ්‍යාමය කොටසක් ලෙස අඩංගු වෙයි. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ වගකීමකි. මෙම මූල්‍ය ප්‍රකාශන විශ්වවිද්‍යාල පාලක සභාව මගින් අනුමත කර ඇති අතර ඔවුන් වෙනුවෙන් පහත සඳහන් අය විසින් අත්සන් කරන ලදි.

.....	.....	.....
ඩී.ඩී. උපනන්ද	එන්.සි.එස්. සේනක	මහාචාර්ය ජී.ඒ.එස්. ගිනිගද්දර
මූල්‍යාධිකාරී	වැඩ බලන ලේඛකාධිකාරී	උපකුලපත

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය මිහින්තලේ 2021 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය

විස්තරය	සටහන	2021	2020
ආදායම්			
රාජ්‍ය ප්‍රදාන – පුනරාවර්තන		2,033,000,000	1,874,500,000
ශිෂ්‍යාධාර		52,996,000	75,364,600
රාජ්‍ය ප්‍රදාන සහ වෙනත් ණය ප්‍රදාන නිදහස් කිරීම		510,967,837	526,425,218
		2,596,963,837	**2,476,289,818**
අනෙකුත් ආදායම්			
නඩත්තු සඳහා පුනරුත්තාපන ප්‍රදාන		140,270	1,628,153
ආයෝජන වලින් ලැබූ පොලී		19,411,174	20,081,149
කාර්යයාලීය ණය වලින් පොලී		1,047,918	1,056,835
දේපළ වලින් ලැබූ කුලීය		1,317,210	1,144,577
ස්ථාවර වත්කම් විකිණීම්		673,678	242,915
ලියාපදිංචි ගාස්තු (උපාධි අපේක්ෂකයින්)		4,749,396	2,331,566
සැපයුම්කරුවන්ගේ ලියාපදිංචි ගාස්තු		1,330,675	1,334,000
උපාධි ප්‍රධානෝත්සව ගාස්තු සහ පරිත්‍යාග		3,521,350	-
විභාග ගාස්තු (උපාධි අපේක්ෂකයින්)		332,325	107,155
ටෙන්ඩර් ගාස්තු		954,848	587,400
දඩ සහ පුස්තකාල ගාස්තු		150,771	593,895
පිටස්තරයින්ට ලබා දුන් සේවය		2,730,318	2,500
ශිෂ්‍ය නේවාසික ගාස්තු		884,447	1,826,925
සහතික ගාස්තු		90,860	203,785
පරීක්ෂණාගාර ගාස්තු		1,015,801	2,123,220
ප්‍රමාද ගාස්තු අය කිරීම්		2,315,285	89,125
පිහිණුම් තටාක සාමාජික ගාස්තු		-	4,700
සූර්යශක්ති පිරියත ආදායම්		1,525,872	653,300
පාඨමාලා දීර්ඝ කිරීමෙන් ලැබූ ආදායම්		69,261,421	21,066,665
විවිධ ආදායම්		10,032,470	5,816,357
		121,486,062	**60,894,222**
		2,718,449,899	**2,537,184,040**
වියදම්			
පුද්ගල චෙතනයන්		1,765,944,698	1,739,629,220
ගමන් වියදම්		1,661,208	1,228,192
සැපයීම්		44,335,516	51,679,393
නඩත්තු	31	12,826,239	16,377,306
ගිවිසුම්ගත සේවාවන්		302,297,725	226,290,874
අනෙකුත් වියදම්		57,159,230	46,829,777
සංවර්ධන වැය ශීර්ෂයට මාරු කිරීම්		69,261,421	-
ශිෂ්‍යයින්ට දුන් මුදල් ආධාර		52,996,000	75,370,300
ක්ෂයවීම්		507,415,102	520,074,524
		2,714,897,138	**2,677,479,585**
අදාල වර්ෂය සඳහා වූ ශුද්ධ අතිරික්තය/(ඌනතාවය)		**3,552,761**	**(140,295,545)**

2021 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ විසර්ජන ගිණුම

වර්ෂය සඳහා වූ ශුද්ධ අතිරික්තය/(ඌනතාවය)	3552,761	(140,295,545)
පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලද ශේෂය	(766,817,570)	(598,218,478)
	(763,264,809)	**(738,514,023)**
අඩුකලා ;		
පෙර වර්ෂයන් සඳහා ගැලපීම්	(12,447,198)	(28,303,547)
ඉදිරියට ගෙන යන ලද ශේෂය	**(775,712,007)**	**(766,817,570)**

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය - මිහින්තලේ - 2021 දෙසැම්බර් 31 වන දිනෙන් සඳහා වූ අවසන් වර්ෂය මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	2021 ශ්‍රී:ලං: රු:	2020 ශ්‍රී:ලං: රු:
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින්		
ලැබූ මුදල් ප්‍රවාහයන්		
සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ලැබූ අතිරික්තය/(ඌනතාවය)	3,552,761	(140,295,545)
මූල්‍යමය නොවන අවස්ථාවන් /ගැලපීම්		
කල්බදු පොළී සඳහා ගැලපීම්	-	-
ක්ෂයවීම්	514,862,879	520,074,524
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	5,781,213	80,058,586
පොදු වෙන් කිරීම් සහ අනෙකුත් ගැලපීම්	50,797,137	68,062,651
ණය සහ ආයෝජන වලින් ලැබූ ආදායම්	(20,459,092)	(21,137,984)
4204	සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල	11,127,000.00	2,656,710.80	7,470,233.35	874,516.27	803,399.09	907,613.84	286,385.93	12,998,859.28	(1,871,859.28)
4205	වැඩ බලන වැටුප්	-	438,142.53	83,982.00	-	-	10,721.25	155,100.75	687,946.53	(687,946.53)
4206	විශේෂ දීමනා	44,046,000.00	10,845,513.80	20,628,809.74	3,503,968.89	3,251,186.35	3,927,752.71	1,177,929.91	43,335,161.40	710,838.60
4207	පර්යේෂණ දීමනා	4,868,000.00	2,966,216.67	737,828.00	320,321.40	413,255.50	-	-	4,437,621.57	430,378.43
4208	අතිකාල දීමනා	29,998,000.00	10,372,086.22	5,660,558.96	767,783.25	440,246.44	1,666,970.35	588,745.86	19,496,391.08	10,501,608.92
4209	නිවාඩු ගෙවීම්	2,088,000.00	257,753.75	116,351.49	-	6,384.38	-	-	380,489.62	1,707,510.38
4210	අනිකුත් දීමනා		81,016.17	266,953.00	11,450.00	337,987.00	102,443.84	686,830.38	1,486,680.39	(1,486,680.39)
4211	භාෂා නිපුණතා දීමනා	-	-	-	-	-	-	-	-	-
4212	පාරිතෝෂික දීමනා	4,381,000.00	(6,762,836.58)	(805,183.89)	(1,117,846.38)	(393,917.93)	7,569,781.75	(578,519.45)	(2,088,522.48)	6,469,522.48
4213	සංග්‍රහ වියදම්	285,000.00	-	-	-	-	-	-	-	285,000.00
4214	මාසික හිලව් දීමනා	99,102,000.00	24,418,035.46	46,411,689.25	7,883,929.95	7,315,320.70	8,837,443.13	2,405,427.10	97,271,845.59	1,830,154.41
4220	මාසික පිවන වියදම් දීමනාව	46,145,000.00	10,266,921.90	33,397,213.28	3,746,740.77	3,205,800.00	4,488,539.34	1,006,205.55	56,111,420.84	(9,966,420.84)
	උප එකතුව	**523,336,000.00**	**125,966,075.09**	**322,632,446.77**	**37,878,839.73**	**35,793,490.88**	**51,347,455.40**	**13,431,747.67**	**587,050,055.54**	**(63,714,055.54)**
ගමන් දීමනා සහ යැපීම දීමනා										
501	දේශීය	2,498,000.00	346,449.50	3,200.00	-	45,920.15	10,320.00	36,000.00	441,889.65	2,056,110.35
502	විදේශීය	-	-	1,219,318.40	-	-	-	-	1,219,318.40	(1,219,318.40)
	උප එකතුව	**2,498,000.00**	**346,449.50**	**1,222,518.40**	**-**	**45,920.15**	**10,320.00**	**36,000.00**	**1,661,208.05**	**836,791.95**

විෂය සංකේතය	විෂය නාමය	අය වැය - 2019	වැඩ සටහන-1 පොදු පරිපාලන	වැඩ සටහන-2 අධ්‍යයන	වැඩ සටහන-3 තාක්ෂණ පරියේෂණ	වැඩ සටහන-4 සුභසාධන	වැඩ සටහන-5 නඩත්තු සහ ඉඩම්	වැඩ සටහන-7 නේවාසිකගාර	මූ එකතුව	විචලනය
සැපයුම්										
601	ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	17,249,000.00	2,342,353.28	9,068,791.23	390,359.96	597,377.63	309,987.82	159,272.60	12,868,142.52	4,380,857.48
602	ඉන්ධන සහ ලිහිසි තෙල්	7,999,000.00	8,263,892.23	2,467,949.10	246,960.00	-	-	-	10,978,801.33	(2,979,801.33)
603	නිල ඇඳුම් සහ මැහුම් ගාස්තු	2,000,000.00	151,231.00	415,786.42	98,940.00	123,204.50	31,015.00	78,870.00	899,046.92	1,100,953.08
604	යාන්ත්‍ර සහ විදුලි භාණ්ඩ	5,001,000.00	89,485.15	905,683.41	861.30	859.40	1,234,619.75	245,233.50	2,476,742.51	2,524,257.49
605	ඖෂායනික ද්‍රව්‍ය සහ විදුරු භාණ්ඩ	4,999,000.00	412,307.06	8,103,840.89	16,775.14	95,965.70	193,201.78	560,147.85	9,382,238.42	(4,383,238.42)
606	වෛද්‍ය සැපයුම්	750,000.00	1,550.00	4,084.50	-	201,801.31	-	7,937.00	215,372.81	534,627.19
607	අනිකුත් සැපයුම්	4,000,000.00	1,924,440.08	4,537,162.65	25,401.50	241,343.33	605,876.15	180,947.46	7,515,171.17	(3,515,171.17)
	උප එකතුව	**41,998,000.00**	**13,185,258.80**	**25,503,298.20**	**779,297.90**	**1,260,551.87**	**2,374,700.50**	**1,232,408.41**	**44,335,515.68**	**(2,337,515.68)**
නඩත්තු										
701	වාහන	5,999,000.00	5,929,065.02	2,250.00	-	-	-	4,015.00	5,935,330.02	63,669.98
702	පිරියත, යාන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	4,000,000.00	1,534,919.86	1,495,180.12	100,224.00	45,000.00	343,234.30	246,732.33	3,765,290.61	234,709.39
703	ගොඩනැගිලි සහ නිර්මාණ	5,000,000.00	180,270.00	18,590.00	-	-	1,922,129.96	9,968.00	2,130,957.96	2,869,042.04
704	ලී බඩු	100,000.00	-	-	-	-	-	-	-	100,000.00
705	අනෙකුත්	200,000.00	-	988,101.12	-	-	-	6,560.00	994,661.12	(794,661.12)
	උප එකතුව	**15,299,000.00**	**7,644,254.88**	**2,504,121.24**	**100,224.00**	**45,000.00**	**2,265,364.26**	**267,275.33**	**12,826,239.71**	**2,472,760.29**

විෂය සංකේතය	විෂය නාමය	අය වැය -2019	වැඩ සටහන-1 පොදු පරිපාලන	වැඩ සටහන -2 අධ්‍යයන	වැඩ සටහන-3 තාක්ෂණ පරියේෂණ	වැඩ සටහන-4 සුභසාධන	වැඩ සටහන -5 නඩත්තු සහ ඉඩම්	වැඩ සටහන -7 නේවාසිකගාර	මූ එකතුව	විචලනය
ගිවිසුම්ගත සේවා										
801	ප්‍රවාහන	1,500,000.00	642,005.53	1,810,463.33	600,000.00	600.00	-	300.00	3,053,368.86	(1,553,368.86)
802	ජනසන්නිවේදනය	25,001,000.00	14,047,504.68	22,305,047.56	339,004.28	624,241.18	647,998.93	428,214.81	38,392,011.44	(13,391,011.44)
803	තැපැල් ගාස්තු	1,500,000.00	928,676.75	190,505.00	-	-	-	-	1,119,181.75	380,818.25
804	විදුලි	35,996,000.00	21,443.05	8,807,428.69	-	-	10,836,244.26	302,766.66	19,967,882.66	16,028,117.34
805	ආරක්ෂක සේවා	43,000,000.00	42,956,982.26	-	-	-	-	-	42,956,982.26	43,017.74
806	ජල	29,960,000.00	-	3,766,968.06	-	-	5,614,744.23	379,543.22	9,761,255.51	20,198,744.49
807	පිරිසිදුකිරීම් සේවා	38,000,000.00	12,532,566.20	6,924,536.25	-	-	19,160,980.01	2,424,466.38	41,042,548.84	(3,042,548.84)
808	කුලි සහබදු ගාස්තු	7,544,000.00	-	26,000.00	-	-	-	12,404,248.56	12,430,248.56	(4,886,248.56)
809	වරිපනම් සහ බදු ගෙවීම් ප්‍රාදේශිය අධිකරින්ට	10.00	-	109,581.84	-	-	-	-	109,581.84	(109,571.84)
810	මුද්‍රණ සහ වෙළඳ දැන්වීම් ආදිය	5,001,000.00	4,597,876.76	132,533.00	-	-	-	-	4,730,409.76	270,590.24
811	අනෙකුත්	41,703,000.00	12,016,354.32	6,708,843.65	-	913,605.00	9,612,964.50	482,486.29	29,734,253.76	11,968,746.24
	උප එකතුව	**229,205,010.00**	**87,743,409.55**	**50,781,907.38**	**939,004.28**	**1,538,446.18**	**45,872,931.93**	**16,422,025.92**	**203,297,725.24**	**25,907,284.76**

අනෙකුත් පුනරාවර්ත්තන වියදම්										
901	ගමන් ප්‍රදන විශ්වවිද්‍යාල	1,000,000.00	-	-	-	-	-	-	-	1,000,000.00
902	විශේෂ සේවා පාලක සභාව	4,000,000.00	1,843,613.85	69,500.00	-	-	-	-	1,913,113.85	2,086,886.15
903	විශේෂ සේවා වෘත්තිකයන්ට	5,999,000.00	3,255,112.84	574,206.84	12,000.00	212,832.00	-	-	4,054,151.68	1,944,848.32
904	වැඩ මූලසම්මන්ත්‍රණ	1,500,000.00	48,335.00	58,545.00	-	-	-	-	106,880.00	1,393,120.00
905	අධ්‍යයන පර්යේෂණ	3,000,000.00	74,621.17	1,074,405.80	-	-	-	-	1,149,026.97	1,850,973.03
906	කාර්ය මණ්ඩල සංවර්ධනය	2,500,000.00	204,224.50	394,500.00	-	110,441.00	-	-	709,165.50	1,790,834.50
907	පශ්චාත් පර්යේෂණ	-	750.00	10,455.00	-	-	-	-	11,205.00	(11,205.00)
908	ශිෂ්‍යයන්ට පාඨමාලා සඳහා අවශ්‍ය දව්‍ය	2,000,000.00	-	-	-	-	-	-	-	2,000,000.00
909	කාර්මික පුහුණුව ප්‍රායෝගික	4,500,000.00	-	240,002.94	-	9,000.00	-	-	249,002.94	4,250,997.06
910	ශිෂ්‍යයින්ගේ/සේවකයින්ගේ සංවර්ධනය	2,500,000.00	65,445.00	62,138.00	-	32,650.00	-	-	160,233.00	2,339,767.00
911	විශ්වවිද්‍යාල ක්‍රීඩා ක්‍රියාකාරකම්	2,000,000.00	-	-	-	2,654,265.00	-	-	2,654,265.00	(654,265.00)
912	ශිෂ්‍ය සුභ සාධනවල සේවක සුභසාධනය	2,000,000.00	135,760.75	27,750.00	-	42,090.87	-	24,400.00	230,001.62	1,769,998.38
913	සමුහ සැලසම	750,000.00	-	-	-	-	-	-	-	750,000.00
914	ප්‍රදන අනෙකුත් සංවිධාන	100,000.00	-	-	-	-	-	-	-	100,000.00
915	නිවාඩු ගමන් ලේඛනරැබල පත්‍රය	1,000,000.00	32,670.00	24,080.00	-	58,220.00	-	-	114,970.00	885,030.00

916	සංගීත විෂයම්	4,500,000.00	1,120,781.93	3,050,297.38	160,521.29	59,439.22	-	13,035.00	4,404,074.82	95,925.18
917	බැංකු ගාස්තු	40,000.00	64,200.00	11,500.00	-	-	-	-	75,700.00	(35,700.00)
918	පූජන සහ වන්දී	-	15,000.00	15,200.00	7,500.00	-	2,500.00	-	40,200.00	(40,200.00)
919	දියකන්ඩය සහ සම්භීඝ ගාස්තු	151,000.00	153,000.00	-	1,250.00	1,500.00	-	-	155,750.00	(4,750.00)
920	උපාධි ප්‍රධානෝත්සවය	3,500,000.00	237,775.00	728,611.00	-	-	-	-	966,386.00	2,533,614.00
921	විභාග ඒයදම්	20,000,000.00	-	35,750,775.16	-	-	-	-	35,750,775.16	(15,750,775.16)
922	අනුශාකත් සහ සභරා	1,001,000.00	123,550.00	49,410.00	-	2,520.00	-	45,350.00	220,830.00	780,170.00
925	ඉදිපල ණය පොලී	4,000,000.00	273,168.75	3,329,410.78	264,906.13	138,904.28	136,051.59	48,385.74	4,190,827.27	(190,827.27)
	උප එකතුව	**66,041,000.00**	**7,648,008.79**	**45,470,787.90**	**446,177.42**	**3,321,862.37**	**138,551.59**	**131,170.74**	**57,156,558.81**	**8,884,441.19**
ඕෂධයන්ට මුදල් උපකාර										
1001	භාරකාර අරමුදල් මඟින් මහපොල	-	-	-	-	-	-	-	-	-
1002	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂමෙන් මහපොල	-	-	-	-	-	-	-	-	-
1003	ශිෂ්‍යධාර ගෙවීම්	-	-	-	-	52,996,000.00	-	-	52,996,000.00	
	උප එකතුව	**-**	**-**	**-**	**-**	**52,996,000.00**	**-**	**-**	**52,996,000.00**	**-**

ස්ථාවර වත්කම් ක්ෂයවීම්											
1801	ගොඩනැගිලි ක්ෂය කිරීම	-	314,986,740.27	-	-	-	-	-	314,986,740.27		
1802	ලී බඩු ක්ෂය කිරීම	-	35,996,248.04	-	-	-	-	-	35,996,248.04		
1803	විදුලි භාණ්ඩ ක්ෂය කිරීම	-	-	-	-	-	-	-	-		
1804	ජල සැපයුම් ක්ෂය කිරීම්	-	-	-	-	-	-	-	-		
1805	පිරියන සහ යන්ත්‍ර සූත්‍ර ක්ෂය කිරීම	-	11,279,538.53	-	-	-	-	-	11,279,538.53		
1806	කාර්යාල උපකරණ ක්ෂය කිරීම	-	49,927,490.29	-	-	-	-	-	49,927,490.29		
1807	පුස්තකාල පොත් ක්ෂයවීම	-	8,246,371.00	-	-	-	-	-	8,246,371.00		
1808	මොටර් වාහන ක්ෂය කිරීම	-	1,719,630.17	-	-	-	-	-	1,719,630.17		
1809	රසායනාගාර උපකරණ ක්ෂය කිරීම		84,716,393.57	-	-	-	-	-	84,716,393.57		
1810	ඔලොදු ක්ෂය කිරීම		542,690.00	-	-	-	-	-	542,690.00		
1811	පදු සම්පත් ක්ෂය කිරීම		-	-	-	-	-	-	-		
	උප එකතුව	**-**	**507,415,101.87**	**-**	**-**	**-**	**-**	**-**	**507,415,101.87**		**-**
	ප්‍රධාන එකතුව	**2,116,041,010.00**	**756,192,549.13**	**1,583,844,626.90**	**76,977,291.84**	**95,091,271.45**	**102,009,323.68**	**31,520,628.07**	**2,645,635,691.07**		**30,816,420.80**

33. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (7) වගන්තිය ප්‍රකාර 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ගිණුම් පිළිබඳ විගණකාධිපති වර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ANP/E/ RUSL/21/AQ-10

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2022 මැයි 31 දින



උපකුලපති
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ.

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත්:- 1. ලේකම්,අධ්‍යාපන අමාත්‍යාංශය
2. ලේකම්, මුදල් අමාත්‍යාංශය
3. සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. ANP/E/RUSL/21/AQ-10 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2022 මැයි 31 දින

උපකුලපති
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උප වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

පිටුව 1 | 9

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
+94 11 2 88 70 28 - 34
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
+94 11 2 88 72 23
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණු අතර සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද රු.879,604,581 ක වත්කම් විෂයයන් 12 ක් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී වැඩ නිම කර තිබුණු ඉදිකිරීම් ව්‍යාපෘති 04 ක් සඳහා වැයකර තිබුණු රු.10,893,922 ක් කෙරිගෙන යන වැඩ ගිණුමෙන් අදාළ වත්කම් ගිණුම්වලට මාරුකර නොතිබීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත හා උපකරණවල පිරිවැය ඊට සමාන අගයකින් අඩුවෙන් දැක්වේ. තවද, එම වත්කම්වලට අදාළ රු.406,566 ක් වූ ක්ෂය ගිණුම්ගත නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ඊට සමාන අගයකින් වැඩියෙන් දක්වා තිබුණි. තවද ඉකුත් වර්ෂයේදී වැඩ නිම කර තිබුණු නමුත් ප්‍රාග්ධනගත කර නොතිබුණු ගොඩනැගිලි නොවන වත්කම් වෙනුවෙන් වැයකර තිබුණු රු.15,767,310 ක් සමාලෝචිත වර්ෂයේදී කෙරිගෙන යන වැඩ ගිණුමෙන් ගොඩනැගිලි ගිණුමට මාරුකර තිබීම හේතුවෙන් ඊට සමාන අගයකින් එම වත්කම් ගිණුම්වල පිරිවැය පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දැක්වේ.

(ඇ) විශ්වවිද්‍යාලය විසින් 2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී විශ්වවිද්‍යාලය සතු නොවූ ඉඩමක ඉදිකර තිබුණු ගොඩනැගිලි 02 ක් සඳහා වැයකර තිබුණු රු.1,027,676,497 ක් ප්‍රාග්ධනගත කර තිබුණි. තවද එම කාලපරිච්ඡේදය තුළදී මිලදී ගෙන තිබුණු පිරිවැය රු.23,999,000 ක් වූ වෛද්‍ය උපකරණ වෙනුවෙන් ආරම්භයේ සිටම ක්ෂය කළ යුතුව තිබුණු රු.16,799,300 ක් ක්ෂය කර නොතිබුණි.

(ඈ) උපලබ්ධි අගයක් නොමැති පිරිවැය රු.4,730,583 ක් වූ කල් ඉකුත්වූ තොග වර්ෂය අවසන් ඉතිරි තොගයට ඇතුළත් කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා 2021 දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් ඊට සමාන අගයකින් වැඩියෙන් දැක්වේ.

(ඉ) 2021 දෙසැම්බර් 31 දිනට රු.69,717,263 ක් වූ බැදුම්කර කඩකළ ණයගැති ශේෂය තුළ තිබුණු රු.3,784,401 ක් වූ බැදුම්කරය සමාලෝචිත වර්ෂයේදී 2023 වර්ෂය දක්වා බලපැවැත්වෙන පරිදි අළුත්කර තිබුණු බැවින් එම අගය ණයගැති ගිණුමෙන් ඉවත් කළ යුතුව තිබුණු නමුත් එපරිදි කටයුතු කර නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා 2021 දෙසැම්බර් 31 දිනට බැදුම්කර කඩකළ ණයගැති ගිණුමේ ශේෂය ඊට සමාන අගයකින් වැඩියෙන් දැක්වේ.

(ඊ) වර්ෂ 01 ත් වර්ෂ 05 ත් අතර කාල පරාසයක් තුළදී ලැබී තිබුණු නමුත් හඳුනා නොගත් රු.2,711,041 ක් විවිධ තැන්පත් ගිණුමට බැර කර තිබුණි.

(උ) 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළදී විශ්වවිද්‍යාලය වෙත පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.1,791,447 ක පොත් සහ සඟරා 2,253 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) 2019 නොවැම්බර් 25 දිනැති අංක 09/2019 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව නිල නිවාස හිමිකම සහිත නිලධාරීන්ගේ වැටුපෙන් සියයට 10 ක් අයකළ යුතු නමුත්, රජරට විශ්වවිද්‍යාලයේ උපකුලපති සහ ලේඛකාධිකාරී යන තනතුරු සඳහා වෙන්කර තිබුණු නිල නිවාස වෙනුවෙන් එම නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.274,210 ක් අයකර නොතිබීම හා ගිණුම්ගතකර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා 2021 දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් ඊට සමාන අගයකින් අඩුවෙන් දැක්වේ.

(එ) සමාලෝචිත වර්ෂය තුළදී සිදුකර තිබුණු ගණනය කළහැකි අගය රු.262,772,409 ක් වූ ගනුදෙනු 03 කට අදාළ විස්තරාත්මක උප ලේඛන විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(ඒ) 2021 දෙසැම්බර් 31 දිනට සිදු කර තිබුණු තොග සත්‍යාපන වාර්තා අනුව පීඨ 02 කට අදාළ තොග ශේෂය හා එදිනට මූල්‍ය ප්‍රකාශනවල සඳහන් තොග ශේෂය අතර රු.211,700 ක වෙනසක් පැවති නමුත් ඊට හේතු ඉදිරිපත් නොකෙරුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 විශ්වවිද්‍යාලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන විශ්වවිද්‍යාලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව.ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

විශ්වවිද්‍යාලයේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2 (අ) හා (ආ) හි දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (1) (ඇ) හා 38 (2)	එක් එක් අස්ථිත්වයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදු කර එහි ලිඛිත පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 (2)	2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයේ සිට පැවත එන එකතුව රු.1,492,092 ක් වූ ටෙන්ඩර් තැන්පතු, 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයේ සිට පැවත එන එකතුව රු.1,729,464 ක් වූ විවිධ තැන්පතු හා 2010 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයේ සිට පැවත එන එකතුව රු.137,470,912 ක් වූ රැඳවුම් මුදල් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදය	
(i)	5.2.1 ඡේදය	සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල නිලධාරීන් 81 දෙදෙනකු වෙත නිවාස පහසුකම් ලබාදී තිබුණු නමුත් ස්ථිර නිවාස හිමි විවාහක නිලධාරීන්ගේ වැටුපෙන් මාසිකව සියයට 12.5 ක්ද, ස්ථිර නිවාස හිමි අවිවාහක නිලධාරින්ගේ වැටුපෙන් මාසිකව සියයට 7.5 ක්ද වශයෙන් නිවාස කුලී නොකර ඒ වෙනුවට මාසිකව රු.750 ක් සහ රු.1,500 ක් වශයෙන් නිවාස කුලී අය කර තිබුණි.

පිටුව 6 | 9

	(ii) 5.2.3 ඡේදය	සාද නිවාස ලෙස නම් කර තිබුණු නිල නිවාස 31 ක ආර්ථික කුලිය තක්සේරු කර අය කිරීමට කටයුතු නොකර එක් නිවාසයකට අවමය රු.400 සිට උපරිමය රු.750 ක් දක්වා මුදලක් අය කිරීමට කටයුතු කර තිබුණි.
(ඇ)	විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 ඡේදය	සෑම උසස් අධ්‍යාපන ආයතනයකම සේවයේ නියුතු සෑම තැනැත්තෙක්ම පැමිණීමේ හා පිටවීමේ වේලාව සටහන් කළ යුතු වුවද, අධ්‍යයන කාර්ය මණ්ඩලය රාජකාරියට පැමිණීමේ හා පිටවීමේ වේලාව සටහන් කර නොතිබුණි.
(ඉ)	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ප්‍රදාන සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.10 ඡේදය	පර්යේෂණ අත්තිකාරම් දින 90 ක් තුළ පියවිය යුතු වුවද, 2008 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ නිලධාරීන් 09 දෙනෙකු වෙත ලබාදී තිබුණු රු.1,008,427 ක අත්තිකාරම් 2022 මැයි 30 දින වන විටත් පියවා නොතිබුණි.
(ඊ)	විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ප්‍රදාන සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.3 ඡේදය	පර්යේෂණයේ අවසන් වාර්තා පර්යේෂණ කමිටුව වෙත ඉදිරිපත් නොකරන නිලධාරීන් වෙත නිකුත් කරන අත්තිකාරම් වාරික 04 කින් ඔවුන්ගේ වැටුපෙන් අයකරගත යුතු වුවද, 2017 හා 2018 වර්ෂවල අනුමත කර ආරම්භ කර තිබුණු පර්යේෂණවලට අදාළ අවසන් වාර්තා පර්යේෂණ කමිටුව වෙත ඉදිරිපත් කර නොතිබුණු නිලධාරීන් වෙත 2020 දෙසැම්බර් 31 දින වන විට නිකුත් කර තිබුණු රු.2,671,318 ක අත්තිකාරම් එම නිලධාරීන්ගේ වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(උ)	2019 නොවැම්බර් 25 දිනැති අංක 09/2019 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය	නිල නිවාසයට අදාළ ජල බිල්පත් හා විදුලි බිල්පත් නිල නිවාසය භාවිතා කරන්නා දැරිය යුතු වුවද, උප කුලපති නිල නිවාසයේ රු.197,917 ක ජල හා විදුලි බිල්පත් විශ්වවිද්‍යාලය විසින් ගෙවා තිබුණි.
(ඌ)	2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි 4 (ii) ඡේදය	පර්යේෂණය ආරම්භ කළ දින සිට මාස 06 ක් තුළ එම යෝජනාවට අදාළ ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රගතිය ඇතුළත් අන්තර් පර්යේෂණ වාර්තාවක් පර්යේෂණ කළමනාකරණය සඳහා වන කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2018 වර්ෂයේදී අනුමත කර ආරම්භ කර තිබුණු පර්යේෂණ 08 ක් සම්බන්ධයෙන් ප්‍රගති වාර්තා හා 2021 වර්ෂයේදී අනුමත කර ආරම්භ කර තිබුණු සියලුම පර්යේෂණයන්හි ප්‍රගති වාර්තා එම කමිටුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

පිටුව 7 | 9

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) කෘෂිකර්ම පීඨයේ ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කළ කොන්ත්‍රාත්කරු වෙත Wearing Surface ස්ථරය මිලිමීටර් 50 ක ඝණකමින් ඉදිකිරීම සඳහා ගල්තාර (Asphalt) මෙට්‍රික් ටොන් 13.57 ක් වෙනුවෙන් රු.173,696 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ආ) මිහින්තල පරිශ්‍රයේ ද්විත්ව සේවක නිල නිවාස 04 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාළ ගිවිසුම විශ්වවිද්‍යාලය විසින් 2019 පෙබරවාරි 20 දින අවසන් කර තිබුණි. මෙම ඉදිකිරීම් ව්‍යාපෘතියට අදාළ රු.3,952,742 ක් වූ කාර්යසාධන සුරක්ෂණය 2018 පෙබරවාරි 12 දිනද රු.10,540,647 ක් වූ අත්තිකාරම් සුරක්ෂණය 2018 මාර්තු 05 වන දිනද කල් ඉකුත්වී තිබුණු අතර ඒවායේ කාලය දීර්ඝ කරගැනීමට හෝ මුදල් කර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. මේ නිසා ගිවිසුම් අවසන් කරන දින වන විට කොන්ත්‍රාත්කරුගෙන් අයකළ යුතුව තිබුණු මුළු මුදල රු.15,760,011 ක් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සිදුවී තිබුණි.

(ඇ) වර්ෂ 02 ත් වර්ෂ 17 ත් අතර කාල පරාසයක් තුළදී විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා වැඩ තහනම් කර තිබුණු සේවකයින් වෙත නිකුත්කර තිබුණු රු.698,580 ක සේවක ණය අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි.

(ඈ) 2018 වර්ෂයේදී අනුමත කර ආරම්භ කර තිබුණු පර්යේෂණ 03 ක් සඳහා රු.2,700,000 ක් වූ ඇස්තමේන්තුගත මුදලින් රු.550,000 ක් පමණක් පර්යේෂණ කටයුතු වෙනුවෙන් වැයකර තිබුණු අතර එය ප්‍රතිශතයක් ලෙස ඇස්තමේන්තුගත මුදලින් සියයට 20.3 ක් විය. ඒ අනුව මෙම පර්යේෂණ සැලසුම් කර තිබුණු පරිදි ක්‍රියාත්මක කිරීමට හා 2021 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කිරීමට නොහැකිවී තිබුණි.

(ඉ) කළමනාකරණ අධ්‍යන පීඨයට වායු සමීකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා රු.6,211,226 ක කොන්ත්‍රාත් වටිනාකමක් සහිතව තෝරාගත් සැපයුම්කරුවෙකු වෙත ප්‍රදානය කර තිබුණු නමුත් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ ලිපිය මාස 02 ට ආසන්න කාල පමාවක් සහිතව යවා තිබීම හේතුවෙන් සැපයුම්කරු විසින් එය භාරගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි. ඒ වනවිට ලංසු සුරක්ෂණය කල් ඉකුත්වී තිබුණු බැවින් එය මුදල් කර ගැනීමට තිබුණු හැකියාව මහහැරී තිබුණි.

(ඊ) කොන්ත්‍රාත් වටිනාකම රු.17,500,000 ක්වූ අන්තර් සම්බන්ධතා කළමනාකරණ මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා තෝරාගෙන තිබුණු ලංසුකරු වෙත, ඔහු විසින් ඉදිරිපත් කර තිබුණු ලංසු සුරක්ෂණය නිසි ආකෘති පත්‍රවලට අනුව ඉදිරිපත් කර නොතිබීම, අවසන් වසර 05 හි නිමකළ ප්‍රධාන කොන්ත්‍රාත් 05 කට අදාළව කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ හා වැඩ නිමකළ ලිපි ඉදිරිපත් කර නොතිබීම හා අවම සාමාන්‍ය වාර්ෂික ආදායම රු.මිලියන 52.5 ක් උපයා නොතිබීම යන කරුණු නොසලකා කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් 2021 දෙසැම්බර් 31 දින වනවිට මෘදුකාංගය නිමකර භාර දිය යුතු වුවද, 2022 මැයි 02 වන දින වන විටත් මෘදුකාංගය ස්ථාපිත කර විශ්වවිද්‍යාලය වෙත භාරදී නොතිබුණි.

2.3 **වෙනත් කරුණු**

අභ්‍යන්තර විගණකගේ විෂයපථය තුළට ඇතුළත් නොවිය යුතු කාර්යයන් අභ්‍යන්තර විගණකගේ රාජකාරී පැවරුම් ලේඛනයේ හා අභ්‍යන්තර විගණන සැලැස්මෙහි ඇතුළත් කර කර තිබීම හේතුවෙන් අභ්‍යන්තර විගණකගේ ප්‍රධාන කාර්යභාරය වන විශ්වවිද්‍යාලයේ එක් එක් අංශවල අභ්‍යන්තර පාලන පද්ධතිවල ක්‍රියාකාරකම් පිළිබඳව දෛනිකව ඉහළ කළමනාකරණයට වාර්තා කිරීමේ කාර්යභාරය ඉටුවී නොතිබුණු අතර අභ්‍යන්තර විගණකගේ ස්වාධීනත්වය සීමාවී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

34. 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108 (2) වගන්ති ප්‍රකාර 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව සම්බන්ධව විශ්වවිද්‍යාලයේ නිරීක්ෂණ හා ක්‍රියාමාර්ග

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවේ දැක්වෙන කරුණු සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය විසින් දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග සහ පැහැදිලි කිරීම් සම්බන්ධයෙන් පැහැදිලි කිරීම

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 තත්වාගණනය කළ මතය

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

අ) 2022 වර්ෂයේ කොවිඩ් වසංගතය හේතුවෙන් විශ්වවිද්‍යාලය වරින්වර වසා තැබීම හේතුවෙන් මෙය සිදු කිරීමට ප්‍රමාද වී ඇත. ඒ අනුව අදාළ ගැලපුම් සිදු කර 2022 මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

ආ) මෙහි ව්‍යාපෘති 04න් ව්‍යාපෘති 02ක අගය (රු.1,007,740.00) 2021 වර්ෂයේ දී ගොඩනැගිලි වත්කම් ගිණුමට ගැලපුම් කර ඇත.
රු.15,767,310.00 ක් වූ මාර්ග ඉදිකිරීම හා වාෂ්පීකරණ තැටි, ගොඩනැගිලි ගිණුමෙන් යටිතල පහසුකම් ගිණුමට 2022 වර්ෂයේ දී ගැලපීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) මහාචාර්ය ඒකකය හා ආරක්ෂිත කුටිය, ඉදිරියේ දී අනුරාධපුර මහ රෝහලට භාරදීමට කටයුතු කරනු ලැබේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතිපාදන මත Eco-Cardiography යන්ත්‍රය මහාචාර්ය ඒකකයට 2017 දී මිලදී ගෙන ඇත. එහි සියළු නඩත්තු කටයුතු හා සේවා කටයුතු සිදු කරනු ලබන්නේ අනුරාධපුර මහ රෝහල විසිනි. ඒ අනුව මෙය 2022 වර්ෂයේ දී ගලපනු ලැබේ.

(ඈ) මේ සඳහා කමිටු 03ක් පත්කර ඇති අතර එහි කමිටු වාර්තා ඉදිරි විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කර එහි නිර්දේශය මත පාලක සභා අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. එහි තීරණ මත 2022 වර්ෂයේ මූල්‍ය වාර්තාවන් තුළ ගැලපීමට කටයුතු කරනු ලැබේ.

(ඉ) මෙය 2022 වර්ෂයේ දී ගැලපුම් කරනු ලැබේ.

(ඊ) මෙම ගිණුමෙහි ආදායම් නිවැරදි ව හඳුනාගැනීමෙන් පසු නියමිත පරිදි ආදායමට ගැනීමට කටයුතු කරනු ලැබේ.

(උ) 2022 වර්ෂයේ දී මෙම පොත් තොගය වත්කම් ගිණුමට ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඌ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍ර ලේඛ 09/2019 පිළිබඳ කොමිෂන් සභාවෙන් විමසීම් සිදු කළ අතර එහිදී විශ්වවිද්‍යාලයේ නිවාස කමිටු තීරණය මත නිවාස කුළී අයකල හැකි බව දන්වන ලදී. ඒ අනුව විශ්වවිද්‍යාලය විසින් නියමිත ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් නිවාස කමිටු නිර්දේශය මත සංශෝධිත නිවාස කුළී මුදල් කමිටුව විසින් අනුමත කර ගන්නා ලදී

(එ) මේ වන විට සකස් කර ඇති අතර විගණනයට යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඒ) මෙම වෙනස සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

1.3 විශ්වවිද්‍යාලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු
1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

2. **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව

(අ) විශ්වවිද්‍යාලයේ වර්තමානයේ විවිධ තොරතුරු හා සන්නිවේදන පද්ධතීන් තුළින් දෛනික කටයුතු සිදු වන අතර 2021 වර්ෂයේ දී මෙම පද්ධතීන් සියල්ල වෙනුවෙන් Intergraded University Management Software Solution System (ERP System) ස්ථාපිත කිරීම සඳහා මූලික අදියරයන් සිදු කෙරුණි. ඒ අනුව 2021 වර්ෂය අවසානයේ සිට මෙම නව පද්ධතියේ පුහුණු සැසි පැවැත්වීම ආරම්භ කරන ලදී. එසේ හෙයින් 2022 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම තුළ අංක 11 කාර්යය යටතේ මෙම පද්ධතිය පිළිබඳ සමාලෝචන කටයුතු සිදු කිරීමට යොදා ඇත.

(ආ) ඉදිරියේ දී නිවැරදිව හඳුනාගෙන ආදායමට ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදය

(i) 5.2.1 ඡේදය

මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් විමසීමේ දී විශ්වවිද්‍යාලය පවත්නා ස්ථානය හා සේවකයන් පිළිබඳ සලකා බැලීමෙන් පසු විශ්වවිද්‍යාල නිවාස කමිටුව මගින් තීරණය කළ හැකි බව දන්වා ඇත. ඒ අනුව කමිටුව විසින් අදාල පරිදි සංශෝධනයන් සිදු කර ඇත. පාලක සභා අනුකමිටුවක් වන

නිවාස කමිටුව විසින් මෙම නිල නිවාසයන් සඳහා නිවාස කුළි අයකිරීම සිදු කරනු ලැබේ.

(ii) 5.2.3 ඡේදය

මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් විමසීමේ දී විශ්වවිද්‍යාලය පවත්නා ස්ථානය හා සේවකයන් පිළිබඳ සලකා බැලීමෙන් පසු විශ්වවිද්‍යාල නිවාස කමිටුව මගින් තීරණය කළ හැකි බව දන්වා ඇත. ඒ අනුව කමිටුව විසින් අදාල පරිදි සංශෝධනයන් සිදු කර ඇත.

පාලක සභා අනුකමිටුවක් වන නිවාස කමිටුව විසින් මෙම නිල නිවාසයන් සඳහා නිවාස කුළි අයකිරීම සිදු කරනු ලැබේ.

(ඇ) ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි.

(ඉ) මෙම අත්තිකාරම් 09න් නිලධාරීන් 05කුගේ අත්තිකාරම් (රු.500,000.00) මේ වන විට පියවා ඇත. නොපියවූ අත්තිකාරම් පිළිබඳ ඉදිරියේදී විගණන හා කළමනාකරණ කමිටු තීරණ මත කටයුතු කරනු ලැබේ.

(ඊ) මේ වන විට පර්යේෂණ කමිටුව මගින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

(උ) නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

(ඌ) දැනට පර්යේෂණ ප්‍රගතිය මාස 6න් ලබා ගැනීමට අවශ්‍ය උපදෙස් පර්යේෂණ කමිටුව විසින් ලබා දී ඇත. නිවැරදි ලෙස පර්යේෂණ ප්‍රගතිය ලබා නොදුනහොත් ඔවුන් වෙනුවෙන් කටයුතු සිදුකිරීමට පර්යේෂණ කමිටුව තීරණය කර ඇත. නිරීක්ෂණ කරුණු නිවැරදි වන අතර ඉදිරියට එය වලක්වා ගැනීමට කටයුතු කරනු ලැබේ.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) ඉහත නම් සඳහන් ව්‍යාපෘතිය කොන්ත්‍රාත්කරුවන් දෙදෙනකු මාර්ගයෙන් සිදු කරන ලදී. ප්‍රථම කොන්ත්‍රාත්කරු ලෙස M/s Kasunsandu Construction (Pvt) Ltd ආයතනය ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් තෝරාගෙන කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණ ද කොන්ත්‍රාත්කරු විසින් මාස 04 ට වඩා කාලයක් මෙම කොන්ත්‍රාත්තුව නොකිරීම මත අතරමගදී මෙම කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට (Termination) විශ්වවිද්‍යාලය පියවර ගෙන තිබුණි. නැවත ප්‍රසම්පාදන කටයුතු මගින් M/s Dissanayaka Construction ආයතනය ඉතිරි වැඩ කොටස සඳහා තෝරාගන්නා ලද අතර පළමු කොන්ත්‍රාත්රු විසින් මෙම මාර්ගය මත ABC ඇතිරීම දක්වාත් එක් පසෙක ඇති Dish Drain කොන්ක්‍රීට් කිරීම දක්වාත් නිම කර තිබුණි. Dish Drain එකට නිවැරදිව ජල බැස්මක් ලබා දී නිවැරදි ගුණාත්මකභාවයෙන් යුතුව තාර ඇතිරීමට යාමේ දී මෙම තාර ස්ථරයේ ඝනකම 50mm ඉක්මවා ගොස් ඇත. එමනිසා කොන්ත්‍රාත්කරුවන් දෙදෙනකු විසින් මෙම කාර්ය කිරීමේ දී සිදු වූ ගුණාත්මකභාවයේ අඩුපාඩු මගහැර ඉහල ගුණාත්මකභාවයකින් යුතු කාර්යයක් ඉටු කිරීමට යාම නිසා මෙම අමතර මුදල් වැයවී ඇති බව විශ්වවිද්‍යාලය විසින් නිගමනය කරන අතර එය ඉහත දැක්වූ කරුණු මගින් ගම්‍ය වේ.

(ආ) 2016.12.16 වන දින පැවති තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් 20%ක් වන අත්තිකාරම් මුදල් කොටස් දෙකකින් ගෙවීමට නිර්දේශ කර තිබුණද මෙම ව්‍යාපෘතියට අදාළ 20%ක් වූ අත්තිකාරම් මුදල් 2016.12.21 දින පැවැති 213 වන දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත එකවර කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමට කටයුතු කර ඇත. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5.1 වගන්තිය සහ 8.1.1 වගන්ති ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය වේ. 2016.12.21 දින පැවැති 213 වන දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු තීරණය /අනුමැතිය මත 20%ක අත්තිකාරම් මුදල් එකවර ගෙවා ඇති බැවින් අධි ගෙවීමක් සිදුවී නොමැත.කොන්ත්‍රාත්කරු වෙත කොටස් මුදල් 03ක් සඳහා ගෙවීම් කර ඇති අතර රු.10,540,647.20 වන මුළු අත්තිකාරම් මුදලින් රු.1,564,094.86ක මුදලක් ප්‍රතිපූර්ණය වී ඇත.

අත්තිකාරම් ඇපකරය 2018.03.05 වන දිනත් කාර්යය සාධන ඇපකරය 2018.02.12 වන දිනෙන් කල් ඉකුත් වී ඇති අතර එම ඇපකරවල කාලය දීර්ඝ කරන ලෙස 2018.04.17 හා 2018.04.24 දිනැති ලිපි මගින් කොන්ත්‍රාත්කරු වෙත දන්වා ඇත.එම දැනුම් දීම් වලට අනුව කොන්ත්‍රාත්කරු විසින් 2018.05.03 වන දින අදාළ ඇපකරවල කාලය දීර්ඝ කරන ලෙස DFCC බැංකුව වෙත යොමුකළ ලිපියේ පිටපතක් විශ්වවිද්‍යාලය වෙත යොමු කර ඇත.එම යොමු කල ලිපියේ සේවා යෝජක ලෙස නම්කර තිබුණේ සහකාර ලේඛකාධිකාරි/මූලධන කටයුතු බැවින් එය උපකුලපති විසින් එය නිවැරදි කරන ලෙස සහකාර ලේඛකාධිකාරි/මූලධන කටයුතු විසින් 2018.07.02 වන දින කොන්ත්‍රාත්කරු වෙත ලිපියක් ද යොමු කොට ඇත. තව ද 2018.04.24 දින පැවති ප්‍රගති සමාලෝචන කමිටුවේ දී ඉතිරි වැඩ කොටස් නිමකිරීමටත් කාලය දීර්ඝකරන ලද ඇපකර ලබා දීමටත් කොන්ත්‍රාත්කරු විසින් එකඟ වී ඇත.

තවද විශ්වවිද්‍යාලය හා කොන්ත්‍රාත්කරු අතර 2018.06.18 දින පැවැති විශේෂ රැස්වීමේ දී අදාළ ඇපකරවල කාලය දීර්ඝකර විශ්වවිද්‍යාලයට ලබා දෙන බවට කොන්ත්‍රාත්කරු එකඟ වී ඇති අතර 225 වන පාලක සභා රැස්වීමේ දී ද එම එළඹී තීරණ අනුමත කර ඇත. එම නිසා විශ්වවිද්‍යාලයේ උත්සහය වූයේ මෙම කොන්ත්‍රාත්කරුගේ එකඟතාවය පරිදි එම කොන්ත්‍රාත්කාර සමාගම හරහාම මෙම ව්‍යාපෘතිය අවසන් කර ගැනීමයි. කෙසේ වුවද 2019.02.20 වන දින කොන්ත්‍රාත්තුව අවසන්කිරීම මගින් අහිමි වූ පාඩුව කොන්ත්‍රාත් සමාගමෙන් අයකර ගැනීම සඳහා කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව නෛතික ක්‍රියාවලිය සිදු කෙරෙමින් පවතී. වැඩ ඉංජිනේරු විසින් **2017.09.13**, **2017.10.16**, **2017.11.28** හා **2018.02.14** වන දිනයන් හි කොන්ත්‍රාත්කරු වෙත දැනුම් දී ඇති පරිදි හා **2017.09.27**, **2017.12.05**, **2018.04.24**, **2018.06.18** හා **2018.10.02** පැවැති ප්‍රගති සමාලෝචන කමිටු රැස්වීම් වලදී ද සඳහන් කර ඇති පරිදි මෙම කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුව ආරම්භක අවධියේ සිටම අඩු ප්‍රගතියකින් යුක්තව මෙම ව්‍යාපෘතිය පවත්වාගෙන ගොස් ඇත. වැඩ ඉංජිනේරු ගේ 2017.10.16 දිනැති හා 2017.11.28 දිනැති ලිපිවල සඳහන් කර ඇති පරිදි ව්‍යාපෘතියේ වැඩ කඩින්කඩ සිදු කර ඇත. මෙම අඩු ප්‍රගතිය සම්බන්ධව 2018.04.24 දින පැවැති ප්‍රගති සමාලෝචන කමිටු රැස්වීමේ දී දීර්ඝව සාකච්ඡා කර ඇති අතර එහි දීද කොන්ත්‍රාත්කරු මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට බලාපොරොත්තුවක් පෙන්වා නැත. මේ බව ඔහු විසින් එම රැස්වීමේ දී ඉල්ලා ඇති පරිදි ඇපකර දීර්ඝ කර ගැනීමට බැංකුව වෙත ඉල්ලීමක්ද කර ඇත.මේ වන විටත් මෙම ව්‍යාපෘතිය අවසන් කර වෙනත් ප්‍රසම්පාදන ක්‍රමෝපායක් හරහා මෙම ව්‍යාපෘතිය වෙනත් අයෙකුට පැවරීමට විශ්වවිද්‍යාලයට උවමනාවක් නොතිබූ අතර මෙම කොන්ත්‍රාත්කරු මගින් ම මෙම ව්‍යාපෘතිය අවසන් කර ගැනීමට ප්‍රයත්න දරා ඇති බව 2018 පැවති ප්‍රගති සමාලෝචන කමිටු රැස්වීම් වාර්තා මගින් පිළිඹිබු වේ. නමුත් කොන්ත්‍රාත්කරු හට පැවති මූල්‍යමය අපහසුතා නිසා 2018 අගෝස්තු පමණ වන විට සම්පූර්ණ වශයෙන් මෙම කොන්ත්‍රාත්තුව නවතා දමා ඇති අතර ඒ වන විටත් විශ්වවිද්‍යාලය විසින් ඉල්ලා ඇති පරිදි ඇපකර දීර්ඝ කර ලබා දී නොමැත. එම නිසා එවකට පැවත ප්‍රායෝගික තත්ත්වය පිළිබඳව සැලකීමේ දී විශ්වවිද්‍යාලයේ කළමනාකරණය නිවැරදි බව දක්වමි.

(ඇ) මෙම සේවකයින්ගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ දී අදාළ ණය මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඈ) මේ සඳහා විවිධ ප්‍රායෝගික ගැටළු බලපා ඇති බව නිරීක්ෂණය වේ. නමුත් මින් ඉදිරියට පර්යේෂණ මූල්‍ය සහ භෞතික ප්‍රගතිය සොයා බැලීමට ඉදිරියට කටයුතු කරනු ලබයි. තවද එම නිළධාරින්ගෙන් පර්යේෂණ සැලසුම් නිරීමේ දුර්වලතාවයට හේතු විමසීමට ද තීරණය කරනු ලබයි.

(ඉ) කොන්ත්‍රාත් ප්‍රදානය පමාවක් සිදු නොවී ඇති අතර 2021.08.20 දින සිට 2021.10.01 දක්වා පැවති කොරෝනා වසංගතය නිසා රට වසා දමා තිබිණි. තවද, ලංසු සුරක්ෂණය කල් ඉකුත් වී ඇත්තේ රට වසා දමා තිබූ කාලයේ වන බැවින් කාලය දීර්ඝ කරන

ලෙස ඉල්ලීම් කිරීමට නොහැකි විය. එසේම මෙම කොන්ත්‍රාත්තුව තවත් කොන්ත්‍රාත්තුවකුට පිරිනමා නොමැති අතර නැවත ලංසු කැඳවීම කිරීමට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව තීරණය කර ඇත.

(ඊ) අප විසින් ප්‍රසිද්ධ කරන ලද ලංසු ලියවිලි වල නියමයන් හා කොන්දේසි ප්‍රකාරව ඉල්ලා සිටින ලද වලංගු කාලය, වටිනාකම හා ඉල්ලා සිටිනු ලබන ක්‍රම වේදයන් ට අනුකූලව ඉදිරිපත් කර ඇති බැවින් හා එම ඉදිරිපත් කරන ලද ලංසු ආරක්ෂණවල විශාල බැහැරවීම් (වටිනාකම අඩුවෙන් සටහන් වීම, වලංගු කාලය අඩුවෙන් සටහන් වීම හා කොන්දේසි සහිතව ඉදිරිපත් කිරීම) නොමැති බැවින් එම ලංසු සුරක්ෂණ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් වලංගු ලංසු සුරක්ෂණයක් ලෙස පිලිගන්නා ලදී.

ඉදිරිපත් කරන ලද සියළු ලංසුකරුවන්ගේ පූර්ව සුදුසුකම් සම්පූර්ණ වශයෙන් පූර්ණය කරන ලද කිසිදු ලංසුකරුවකු නොසිටි අතර ටෙන්ඩර්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද පූර්ව සුදුසුකම් පිළිබඳව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සෑහීමකට පත් වූ අතර ඒ අනුව ඉදිරි ඇගයීම් කටයුතු සිදුකරන ලදී. ඒ අනුව වඩාත් ප්‍රශස්ත සුදුසුකම් ලැබූ ටෙන්ඩර්කරු මෙහිදී තෝරාගත් අතර අනුකූල නොවීම් තිබියදීත් තෝරාගත් ලංසුකරු ප්‍රතික්ෂේප නොකර ලංසුව ප්‍රදානය කර තිබීම යන්න විශ්වවිද්‍යාලය විසින් බැහැර කරන අතර මෙය ප්‍රශස්ථ ලෙස ඇගයීමට ලක් කරන ලද කොන්ත්‍රාත්තුවක් බවත් අදාළ පිරිවිතරයන්ට අනුව වඩාත් ඉහලින් යෝග්‍යතාවය තහවුරු කළ ටෙන්ඩර්කරුට අවස්ථාව ලබා දී ඇත. තවද , විගණන වාර්තාවේ සඳහන් පරිදි රු.මිලියන 52.5 සාමාන්‍ය වාර්ෂික ආදායමක් ලැබිය යුතුය යන්න ඇගයුම් උපමානයක් ලෙස සඳහන් කළේ නම් තරගකාරිත්වයෙන් ලංසු කිසිවක් ඉදිරිපත් නොවන බව තාක්ෂණික ඇගයීම් කමිටුවේ අදහස වූ අතර අපගේ අනුමත ඇස්තමේන්තුගත මුදල රු. මිලි 17.5 බැවින් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත අවම සමාන්‍ය වාර්ෂික ආදායම රු. මිලියන 20ක් ලෙස ලංසු පත්‍රිකා මගින් ඉල්ලා ඇති අතර මෙම සියළුම ලංසුකරුවන් මෙම උපමානය සපුරා ඇත.

ලංසු දත්ත පත්‍රිකා ලේඛනයේ ITB 11.1.5 යටතේ ලංසුකරුවන් විසින් අවසන් වසර 05හි නිමකළ ප්‍රධාන කොන්ත්‍රාත් 5ක විස්තර ඉල්ලා ඇතත් ඉදිරිපත් කරන ලද කිසිදු කොන්ත්‍රාත්කරුවකු මෙම තොරතුරු නිසියාකාරව ලබා දී නොතිබුණි.මෙම තොරතුරු ඇගයීම් හා සුදුසුකම් උපමාන 03වන පරිච්ඡේදයේ සඳහන් පරිදි ලංසු ඇගයීම් සඳහා නිර්ණායකයන් නොවේ. මෙම තොරතුරු හුදෙක් ලංසුකරුවන් ගේ අඛණ්ඩ පැවැත්ම යන ක්ෂේත්‍රයේ නියැලෙන බව පිළිබඳ සොයා බැලීම සඳහා ඉල්ලා සිටින ලද තොරතුරු පමණි.

තව ද, 2020.08.17 දින පැවැති තාක්ෂණ කමිටු වාර්තාවේ අංක 8 යටතේ මේ පිළිබඳ තවදුරටත් විග්‍රහ කර ඇත. ලංසුකරුගේ පසුගිය වර්ෂ 05ක මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන ලෙස දක්වා ඇතත් ලංසු ඇගයීම් උපමාන ලෙස සලකා බලන ලද්දේ වසර 03ක සාමාන්‍ය ආදායම පමණි. ඒ අනුව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ආසන්නතම වර්ෂ 03ක විගණිත ප්‍රකාශිත මූල්‍ය වාර්තා

පරිශීලනය කොට පූර්ව වර්ෂ 03ක සාමාන්‍ය ආදායම තක්සේරු කරන ලදී. ඒ අනුව මෙම සියළුම ලංසු පසුගිය වර්ෂ 03ක සාමාන්‍ය ආදායම සඳහා වූ නිර්ණායකයන් සපුරා තිබුණු බැවින් මෙම ලංසු සුදුසුකම් ලංසු ලෙස තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් තීරණය කරන ලදී.

සාමාන්‍ය වාර්ෂික ආදායම සැලකීමේ දී මිලට ගැනීමට අදහස් කරන භාණ්ඩ වල පිරිවැය මෙන්ම එම භාණ්ඩ අලෙවි වන වාර ගණන, භාණ්ඩයේ ස්වභාවය සහ සුලභව විකිණීමට ඇති හැකියාව යන කරුණු සියල්ලම ගන්නා ලද අතර මෙවැනි පද්ධතියක් අලෙවි නොවන ඒවා බැවින් ඒ අනුව අවම වශයෙන් වාර්ෂික ආදායම, ඇස්තමේන්තුගත වටිනාකමින් 4/3 ලෙස තිබිය යුතු බවට තීරණය කරන ලදී. ඒ අනුව තෝරාගන්නා ලද ලංසුකරු ලංසු පත්‍ර වල ඉල්ලා ඇති වාර්ෂික ආදායමට වඩා වැඩියෙන් ආදායමක් ලබන ආයතනයක් බව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී. ඒ අනුව මේ පිළිබඳව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මෙය පරීක්ෂා නොකරන ලදැයි යන්න බැහැර කෙරේ.

2021.01.01 දින සිට 2021.06.30 දින දක්වා රට තුළ පැවැති කොවිඩ් තත්ත්වය හේතුවෙන් විශ්වවිද්‍යාලය වසා තැබීම, මාර්ගගත ක්‍රමයට රාජකාරි කටයුතු සිදු කිරීම හා 50% ක අවම සේවකයන් සංඛ්‍යාවක් යොදා ගනිමින් රාජකාරි කටයුතු වල නිරත වීම හේතුවෙන් මෙම පද්ධතියේ කටයුතු නිසි පරිදි සිදු කිරීමට නොහැකි වූ අතර කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලා තිබූ පරිදි කොන්ත්‍රාත් කාලය 2021.12.31 දින දක්වා දීර්ඝ කිරීමට 2021.08.18 පැවැති 225 වන දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවෙන් අනුමැතිය ලැබී ඇත. පද්ධතියේ කටයුතු කරගෙන යාමේ දී තවදුරටත් විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාවය මත විවිධ මොඩියුලවල සමහර වෙනස්කම් කිරීමට සිදු වූ බැවින් කොන්ත්‍රාත්කරු විසින් තවදුරටත් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරන ලෙස ඉල්ලීමක් කර ඇති අතර එය සලකා බැලීම සඳහා ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කර නැවත කාල දිගුවක් 2022.06.30 දින දක්වා ලබා ඇත. ඒ අනුව ප්‍රමාද ගාස්තු අයකිරීමක් පිළිබඳව මෙම අවස්ථාවේදී අදාළ නොවන බව දන්වමි.

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 ප්‍රකාරව , විශ්වවිද්‍යාලයේ අනෙකුත් ප්‍රසම්පාදනයන් මෙන්ම මෙම ප්‍රසම්පාදනය සඳහා ද තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා සාමාජිකයින් පත් කිරීම ආයතන ප්‍රධානියා වන උපකුලපති විසින් පත්කර ඇති අතර එම අනුමැතිය පදනම් කර ගෙන මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් කටයුතු කළ සහකාර මූල්‍යාධිකාරි වරයා අදාළ කමිටු නිළධාරීන් වෙත තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා පත්වීම් ලිපි යොමු කර ඇත.

විගණන විමසුමේ සඳහන් කොන්ත්‍රාත්තුව පිළිබඳ දත්තයන් , ලංසු පිළිබඳ දත්ත හා උපදෙස් , ලංසු ලියවිලි නිකුත් කළ පසු වෙනස් කර තිබුණි යන්න පිළිබඳ විශ්වවිද්‍යාලය එකඟ නොවේ. විශ්වවිද්‍යාලය විසින් ප්‍රසිද්ධ කරන ලද්දේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කරන ලද ලංසු ලියවිලි වන අතර ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසානය තෙක් අනුගමනය කරන ලද්දේ එම අනුමත කරන ලද ලංසු ලියවිලි පමණක් වන අතර කිසිදු වෙනස් කිරීමක් සිදුකර නොමැති බව දන්වනු කැමැත්තෙමි.

විගණන විමසුමේ සඳහන් කර ඇති උපමාන හා උපමාන සඳහා ලකුණු ලබා දෙන ආකාරයේ සඳහන් කර නොතිබුණි යන්න පිළිබඳව විශ්වවිද්‍යාලය එකඟ නොවේ.

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.1 (අ) ඡේදය ප්‍රකාරව සුදුසුකම්ලත් ලංසු අගයන ආකාරය පිළිබඳව 03 වන පරිච්ඡේදයෙහි ඇගයීම හා සුදුසුකම් උපමාන පැහැදිලිව සටහන් කර ඇත. ලකුණු ලබා දෙන ආකාරය පිළිබඳව ලංසු පත්වල සඳහන් නොකරනු ලබන අතර ලකුණු ලබා දීමේ ක්‍රියාපටිපාටිය ලකුණු ලේඛණයේ පැහැදිලිව සටහන් කර ශ්‍රේණි ගත කිරීම සිදුකර දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය සහිතව ඉදිරිපත් කොට ඇත.
විශ්වවිද්‍යාලය විසින් මෙම ප්‍රසම්පාදන භාණ්ඩ යටතේ සිදුකරන ලද අතර ඒ සඳහා වූ ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය SBD/01 ආකෘති පත්‍ර වලට අදාළ සියළුම ලංසු ලියවිලි සකස් කරන ලද අතර ඒ අනුව නැවත ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනයෙන් විමසීමක් සිදු කිරීම අවශ්‍යතාවයක් ඇති නොවන බව හැඟේ. තොරතුරු පද්ධතියක් නිශ්චිත වන අතර සංකීර්ණ තොරතුරු පද්ධතියක් නොවන බවට තාක්ෂණික ඇගයීම් කමිටුව තීරණය කරන ලද අතර එය SBD/01 ලංසු ලියවිලි මගින් භාණ්ඩ යටතේ ප්‍රසම්පාදනය කිරීමට අදහස් කරන ලදී. ඒ අනුව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව ලංසු ලියවිලි අනුමත කරන ලද අතර භාණ්ඩ යටතේ නිශ්චිත තොරතුරු පද්ධතියක් ලෙස අවශ්‍යතාවය, විෂය පථය හා යොමු කිරීමේ අනුදේශ (Terms of Reference) අදාළ කොන්ත්‍රාත් කරු විසින් අදාළ අවශ්‍යතාවය සකසා ගැනීම සිදු කරයි. ඉහත දක්වන ලද කරුණු වලට අනුව මෙම ප්‍රසම්පාදනය සඳහා ඉදිරිපත් වූ ලංසුකරුවන් දෙදෙනාගෙන් කාර්යයන් 01හි සඳහන් පරිදි අපගේ අවශ්‍යතාවයන් සපුරාලන කාර්යයන් අනුව මූල්‍ය යෝජනාවෙහි අවම යෝජනාවක් ඉදිරිපත් කරන ලද සුදුසුකම් ලත් ලංසුකරු තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් තෝරා නිර්දේශකර දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවෙහි අනුමැතිය මත අදාළ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

2.3 **වෙනත් කරුණු**

ඉදිරියේ දී මෙය නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

මහාචාර්ය ජී.ඒ.එස්. ගිනිගද්දර
උපකුලපති/ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

මහාචාර්ය ජී.ඒ. සංජීවනී ගිනිගද්දර
උපකුලපති
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ